# බුරුම වංශ විනිශ්චය.

හෙවත්

බුරුමනිකායනම්වූ අමරපුරසමාගම

පිළිබඳවූ විනිශ්චය.

සහ

එම සමාගමට විශවසූනාද නම් කෙනෙක්

අභූත නාමයකින් පෙනීසිටගෙන

ලක්රිවිකිරණ නම් ප්‍රසිද්ධපත්‍ර මාර්ගයෙන්

කරණලද

අපහාසයවල තිබෙන

අයොග්‍යකම දක්වන

ප්‍රකරණය

කොළඹ කොටහේනේ සර්වඥශාසනාභිවෘද්ධිදායක

යන්ත්‍රශාලාවෙහි අච්චුගස්වනලදී.

1878

# ම්‍රම්මවංශ විනිශ්චය.

යස්ස පසීදතං සම්පසීදිතාය චෙව සදා භවෙත්,
තස්සසංසද්ධාය වක්ඛෙස්ස හං ම්‍රම්මවංශ විනිශ්චයම්;

අපහාසනීයවත් සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තම ශාස්තෘන් වහන්සේ පන්සාළිස් අවුරුද්දක් බුදුවවැඩසිට සියලුබුද්ධකෘත්‍යයන්කොට නිමවා නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙන් පරිනිර්වාණයකරවදාළ ඉක්බිති සංගීතිකාරක මහා ස්ථවිරයන්විසින් ප්‍රථම ද්විතීය තෘතීය යන සංගායනාවන්කොට නිම වූ කල්හි මෙම ශ්‍රීලංකාද්වීපයටහා අරිමද්දනාදි නොයෙක් නුවරවල් අන්තර්ගතවූ ජම්බුද්වීපරටයෙහිකියනලද සුනාපරන්තරටටද හංසාවතී මුත්තිම කුසිම හෙවත් ස්වර්ණභූමියයන රාමඤ්ඤ දෙශයටද—යන මේ ආදි ප්‍රත්‍යන්තරටනවයකට පිටත්කර යවනලද්දාවූ මහාමහෙන්ද්‍ර ස්ථවිරාදි ක්ෂීණාශ්‍රව මහරහතන් වහන්සේලා ඒ ඒ රටවල පිහිටුවූ බුද්ධශාසනය ක්‍රමයෙන් මේවනතුරු දෙශකීපයක පවත්නාබව පෙණේ—

මෙසේ බුද්ධශාසනය පිහිටියාවූ දෙශයන් අතුරෙන් මෙම ශ්‍රීලංකාද්වීපයෙහි ශාසනපරම්පරාව කලින්කල ශුද්ධකිරීම්වශයෙන් පැවතආ ක්‍රමය මෙහි දක්වනුලැබේ—

බුද්ධවර්ෂයෙන්, 236. වෙනි වර්ෂයෙහි මිහිඳු මහතෙරුන්වහන්සේ විසින් දෙවෙනිපෑතිස්ස මහරජානන් සහායකොටගෙණ පළමුකොට ලංකාද්වීපයෙහි ශාසනය පිහිටුවනලද්දේය—මෙසේ බුද්ධශාසනය පැවතීමට පටන්ගත්කල්හි 454. වෙනි වර්ෂයෙහි රාජ්‍යයටපැමිණි වලගම්බාහු රජ්ජුරුවන් අභයගිරිවිහාරය කරවූකැත්පටන් පළමුපැවතආ මහාවිහාරයෙහි ස්ථවිරයෝද, අභයගිරිවාසී ස්ථවිරයෝදැයි මේ විහාරදෙක්හි භික්ෂූනු නොයෙක් ප්‍රකාරයෙන් භෙදව විසුවෝය—

ඉන්පසු බුද්ධවර්ෂයෙන්: 744. දී ලක්දිව රාජ්‍යයටපැමිණි වොහාරතිස්ස මහරජතෙම කපිලනම් අමාත්‍යයාලවා ඒ කාලයෙහි කරණලද අභයගිරිවිහාරවාසී භික්ෂූන්ගේ අධර්මවූ වෛතුල්‍යවාද පොත්පත් දවා හැමකොට ශාසනය ශුද්ධකරවූයේය—කියනලදිමහාවංශයෙහි,

"වෙතුල්ලවාදං මද්දිත්වා, කාරෙත්වා පාපනිග්ගහං
කපිලෙන අමච්චෙන, සාසනං ජොතයීච සො,,

ඉත්පසු බුද්ධවර්ෂයෙන් 793 දී රජපැමිණි මෙඝවර්ණ අභය නොහොත් ගොඨාභය මහරජානන්ගේ කාලයෙහිද, අභයගිරිවාසීපාපභික්ෂූන්විසින් උපදවනලද වෛතුල්‍යවාදනැතිකොට සැටක්පමණ පාපභික්ෂූන් ලංකාවෙන්පහකර සොළීරට මයිසූර්නම් පලාතටහැරියබව කියේය–

මහාවංශයෙහි–

"අනුවස්සාච සංඝිස්ස, ජච්චරමද්දපයි
පාපකානං නිග්ගහෙත්වා, සොධෙන්තා සාසනන්තුසො,
වෙතුල්ලවාදිනො භික්ඛූ, අභයගිරි නිවාසිනො
ගාහයිත්වා සට්ඨිමත්තෙ, ජිනසාසන කණ්ටකෙ
කත්වාන නිග්ගහං තෙසං, පරතීරෙ ඛිපාපයී,
තත්ථ ඛිත්තස්ස ථෙරස්ස, නිස්සිතො භික්ඛුචොළිකො,,

අවසිය දහඅටවෙනි වර්ෂයෙහි රාජ්‍යයටපැමිණි මහාසේන රජ්ජුරුවන් විසින්අනුරාධපුරයෙහිම කරවූ ජේතවන විහාරයෙහි ස්ථවිරාදීනු ඉතිරිවිහාරදෙක්හි ස්ථවිරාදින්මද විරුද්ධව පැවතුනුබැවින් මේ කාලයපටන් පාංශුකූලිකව ඔවුනොවුන් නොයෙක්පරිද්දෙන් භෙදවිසූවෝය–

ඉත්පසු බුද්ධවර්ෂයෙන් 1614. වෙනි වර්ෂයෙහි රාජ්‍යයටපැමිණි විජයබාහු මහරජතෙම තම්බදීපරාජයයි නාමලත්—බුරුමදෙශයෙහි—පූගාමනම් අරිමද්දනනුවර—අනුරුද්ධ මහරජහට ධූතාගම වැඩිදියුණුකිරීමසඳහාලියුම්යවා මුදල්ලබාගත්තේය—

මෙම විජයබාහු මහරජ සොළීරටේ රජ්ජුරුවන්හා සමග කළායුද්ධයක දී-අරිමද්දනනුවර-අනුරුද්ධරජ්ජුරුවනගෙන්තමන්ට උපකාරසඳහා සෙනාවදලබාගත්තා ඇත,

තවද, උපසම්පදාකිරීම සඳහා ඕනෑකරණ පමණ ව්‍යක්ත සිල්වත් භික්ෂූන් ලක්දිවඑවකට නැතිබැවින්—අරිමද්දන, නුවරතමන්මිත්‍රවූ, අනුරුද්ධ රජ්ජුරුවන්වෙත නොයෙක් පඬුරුසහිත අමාත්‍යයන්යවා පිටකත්‍රයෙහි පරතෙරටපැමිණියාවූ සුසීලාදිගුණවත් ස්ථවිරයන්වහන්සේලා ගෙන්වා බොහෝසෙයින් පූජාසත්කාරපවත්වා මේ බුරුමතෙරවරුන්ලවා ලංකාවේ බොහෝ දරුවන් පැවිදිඋපසම්පදාකරවා ශාසනයපිහිටුවූබව පෙණීනිබෙණහෙයින් ලංකාවේ්ටපළමු පැවති, මිහිඳු, උපසම්පදාපරම්පරාව නැතිව—බුරුම උපසම්පදාවංශයමෙතැන්සිට පැවතීමටපටන්ගත්තේය

මහාවංශයෙහි·

"උපසම්පදාදිකම්මස්ස ගණපූරකභික්ඛුනං,
අප්පහොනකභාවෙන සාසනට්ඨිතිමානසො,
අනුරුද්ධනරින්දස්ස සහායස්සාතිසන්තිකං,
රාමඤ්ඤවිසයං දූතෙ පෙසෙත්වා සහපාභතෙ,
තතො ආණාපයිත්වාන පිටකත්තයපාරගෙ
සොසීලාදිගුණාවාසෙ භික්ඛවො ථෙරසම්මතෙ,
තෙහුල්ලාරාහි පූජාහි පූජයිත්වා නරිස්සරො,
පබ්බජ්ජා උපසම්පත්තිං කාරයිත්වා අනෙකසො,
පිටකත්තයඤ්ච බහුසො කථාපෙත්වා සවණ්ණනං,,

ඉත්පසු බුද්ධවර්ෂයෙන්. 1783· දී ලක්දිවරජපැමිණිවිජයබාහුරජ්ජුරුවෝද බුරුමරට අරිමද්දනනුවර මහරජහට පාලිභාෂාවෙන් තෙමේම ලියුමක් ලියාහැර එමරජුගේ මුත්තනුවන් පරිද්දෙන් බුරුමරජ්ජුරුවන්හා මිත්‍රධර්මය පවත්වමින් ශාසනය බැබලවූසැටිත්පෙණේ

මහාවංශයෙහි·

"අථ තස්ස මහාරඤ්ඤො භාගිනෙය්‍යො කවිස්සරො,
ධීරො විජයබාහූති රාජා ලංකිස්සරො අහු, පෙ,
සයං මාගධභාසාය කත්වා සන්දෙස මුත්තමං,
පෙසෙත්වාන නරින්දස්ස අරිමද්දනවාසිනො,
ආදො විජයබාහුව අත්තනොපි පිතාමහො,
තෙනසද්ධිං සිනිද්ධෙන සටෙත්වා මිත්තසන්ථවං,
ලංකාරිමද්දනෙ දෙසෙ භික්ඛූනං පීතිවඩ්ඪනං,
සම්බුද්ධසාසනං සම්මා ජොතයිත්ථමහායසො,,

තවද, පරාක්‍රමබාහු මහරජානන් කාලයෙහිද පාපිවූ වෛතුල්‍යවාදීදුස්සීලයන් සිව්රුහරවා ශාසනය ශුද්ධකෙළේය.

මහාවංශයෙහි.

"එවං ලංකිස්සරො ලංකාතලං කත්වා නිරාකුලං?
පරක්කමභුජො පත්තභිසෙකො නයකොවිදො, පෙ,
ආදො සාසනවුද්ධිං ච නිකායත්තයභික්ඛුනං.
කාරෙතු කාමො සාමග්ගිං ජිනසාසනවුද්ධියා, පෙ,
යථා ධම්මං සතෙකිච්ච පතිට්ඨාපිය සුද්ධියං,

මහාවිහාරිකෙ සබ්බෙ සමග්ගෙ කාසි භික්ඛවො,
උප්පබ්බාජිය දුස්සීලෙ ලාභාපෙක්ඛාය සාසනං,,
මානා,,සෙනතුත්ති දත්වාන මහාදානානන්තරහි සො, පෙ,
අබුද්ධවචනං යෙව වෙතුල්ල පිටකාදිකං,
දීපෙනෙත බුද්ධවාචාති පටිපත්තිපරම්මුඛෙ,,

ඉන්පසු බුද්ධවර්ෂයෙන්. 1809: යේදී ලක්දිවරජපැමිණි පණ්ඩිතපරාක්‍රම බාහුමහරජාණන්විසින්ද දුශ්ශීලපාපභික්ෂූන් පහකොට සුපෙසල භික්ෂූන් සමගිකරවා සොළිරට මහරජහට [පඬුරුසහිත ලිපුම්යවා පිටකත්‍රයධාරිවූ සිල්වත් සොළිමහරට භික්ෂූන් ලක්දිවටගෙන්වා ශාසනයශුද්ධතාව පිහිටුවනලද්දේය.

මහාවංශයෙහි.

"සබ්බාලජ්ජී ගණං සම්මා උඩිනිත්වා පනොදිය,
පරිසුද්ධං සඞ්ඛාරෙසි සම්මා සම්බුද්ධසාසනං,
අථ චොළමහාරට්ඨං පෙසෙත්වා පාභතෙ බහු
සුසීලාචාර සම්පන්නෙන පිටකත්තය ධාරිනො,
පසිද්ධෙ චොළියෙ භික්ඛු ආනෙත්වා තම්බපණ්ණියං,
කාරාපෙසි මහගඝං සො රාජා උභය සාසනං,,

එම්මහරජාණෝ බුරුමරටට උත්කෘෂ්ටවූ පඬුරුසහිතලියුම්යවා එහිව සත්නාවූ ලජ්ජීභික්ෂූන් අතුරෙන් එක්නමක්වන ධම්කිත්තිහි මහාස්ථවිර යන් ලක්දිවටගෙන්වා සත්කාර ගෞරවකොට ආශ්‍රයකෙළේය.

මහවංශයෙහි!

"අථ සො තම්බරට්ඨම්හි විහරන්තාසු සන්තතං,
ලජ්ජීභික්ඛු සවනෙකෙසු ධම්මකිත්තිති විස්සුතො,
අත්ථි එකො මහාථෙරො සීලතෙජෙන භාසුරො,
තස්ස බොපන ථෙරස්ස පිණ්ඩපාතාය ගච්ඡතො,
ආනෙත්වා තං මහාථෙරං ලංකාදීපං මහීපති,
අරහන්තං පස්සමානො මොදමානො පුනප්පුනං,
කත්වා තස්ස මහාපූජං පූජාසක්කාර භාජනං
චතුපච්චයදානෙන සඞ්ගණ්හං තමුපට්ඨහී,,

බුද්ධවර්ෂයෙන් 2124දී සීතාවකනුවර රාජ්‍යශට පැමිණි—රාජසිංහරජ්ජුරුවෝ ශිවභක්තියපිළිගෙණ, ශ්‍රාඬ්ඩ, නම් කෝවිලක්කරවා සන්‍යාසිබ්‍රාහ්මණාදි මිථ්‍යාදෘෂ්ටිකයන්ට සත්කාරකරමින් බුද්ධශාසනයේ භික්ෂූන්පතස් වලහෙලවා මරා ප්‍රධානවිහාරස්ථානවලතුබූපොත්ගිනිලා මුළුලක්දිව එක් ප්‍රව්‍රජිතකෙනෙක්වත් ඉතිරිනොකොට විනාශකෙළේය;

2135 දී සෙංකඩගල් නුවර රාජ්‍යයටපැමිණි, විමලධර්මසූර්‍ය, නම්රජ්ජුරුවන්ගේ කාලයෙහි ඕලන්දක්කාරයන්ගේ උපකාරයෙන්, බුරුමරටට යටත්වපැවතුනු, රක්කඞ්ගු හෙවත් අරෙක්කාන්නම් දෙශයෙන් නන්දිචක්‍රාදි භික්ෂූන් දොළොස්නමක් ලංකාවටගෙන්වා කුලපුත්‍රයන් පැවිදිඋපසම්පදාකරවා ඒ රජ්ජුරුවන්විසින් බුද්ධශාසනය පිහිටුවනලද්දේද, රක්කඞ්ගුරටින් ආභික්ෂූන්සියරටටගියහෙයින් උපසම්පදාවූභික්ෂූන්ට කර්ම කරණතරම් ව්‍යක්තභාවයක් නැතිව ඒ භික්ෂූන්ගේඇවෑමෙන් නැවතත් තිබුනුපරිද්දෙන්ම ශාසනය පිරිහීගොස්භික්ෂූන්ගෙන් ලක්දිවහිස්වගියේය

නැවතද, 2227. දී රාජ්‍යයටපැමිණි දෙවෙනි විමලධර්ම සූර්‍ය, රජ්ජුරුවන්ගේ කාලයෙහිද නැවතත්එම, රක්ඛඞ්ග දෙශ, යවම ලියුම්යවා, සන්ත්‍රාණස්ථවිරයන් ආදිකොටඇති භික්ෂූන්ලංකාවට ගෙන්වා බොහෝකුලපුත්‍රයන් පැවිදිඋපසම්පදාකරවා ශාසනයපිහිටුවූයේය.

ඒ භික්ෂූන්වද අන්‍යයන් උපසම්පදාකළ නොහැකිව නැසීගියපසු පළමු ලෙසම ලක්දිව උපසම්පදාව ශූන්‍යවූයේය.

ඉන්පසු 2291 දී රාජ්‍යයටපැමිණි—කීර්ත්තිශ්‍රී රාජසිංහ, රජ්ජුරුවන්ගේ කාලයෙහි සියම්දෙශයට පඬුරුසහිත ලියුම්යවා, උපාලිස්ථවිරාදි තුදුස්නමක් භික්ෂූන් ලක්දිවටගෙන්වා 2296 දී නැවතත් උපසම්පදාව පිහිටුවූයේ යහිතියහි—මේ කාලයෙහි මහනුවර, පිහිටුවූ ශ්‍යාමෝක්ත පරම්පරාව දැන් දක්වා ලංකාවේ සියම් සමාගමයයි පවත්නාබව දතයුතුයි.

තවද, අඹගහපිටියේ, ඥාණවිමලතිස්ස, නම්ඇති සාමණේර තැන්වත් හනමක් බුරුමදෙශයෙහි; අමරපුරනම් රාජධානියටපැමිණ එහි, ඥාණාභිවංස සංඝරාජ, මහාස්ථවිරයන් වහන්සේ ප්‍රධානකොටඇති මහසංඝයාගෙන් උපසම්පදාව ලබාගෙණ, නිස්සයාචාර්‍ය්‍ය, අග්ගසාර, ස්ථවිරනාත්සහිත බුරුමතෙරුන්නාන්සේලා තුන්නමක්හා සමග ලක්දිවටඅවු. ප්‍රව්‍රජ්‍යාභිලාෂී බොහෝකුලපුත්‍රයන් පැවිදිඋපසම්පදා කරමින්, අමරපුරයෙන්ගෙණආ උපසම්පදා පරම්පරාව, ලක්දිව, පිහිටුවූයේය. මේ අඹගහපිටියේ ස්ථවිරයන් වහන්සේ සහිතපිරිස උපසම්පදාව ලැබූක්‍රමය ප්‍රකාශවන සන්දේශයෙන් කරුණුස්වල්පයක් මෙහි බහාලමි.

“සම්මාසම්බුද්ධ පරිනිබ්බාණතො පන චතු චත්තාළිස ති සාධි සාම

විසතයෙ ජිනසාසනවංසෙ

වෙසාඛපුණ්ණමියං සීහලදීපතො ආගතෙ ජම්බුසිරිනිකෙතනං අමරපුරාභිධානං මහානගරමපෙත්‍ය තිබ්බුපාසකෙහි සහ සාමණෙරෙ දිස්වා තෙසං නාමගොත්තං ආචරියපාචරියාණ

කාරණාකාරන ච පූජිත්වා සුත්වා අතීව සොමනස්සජාතො
ධූරතො ආගතෙ ඤාතිජනෙ ඤාතිසංඝො විය පරිගගහෙසිං
සඩාද්‍යනෙකගුණාධිවාසස්ස සත්‍යසීගතිවයජාතස්ස අම්හාකං
මහාධම්මරාජස්ස පි පසාදනීයං කාරණං වත්වා ආරොචෙත්වා
සම්මා පච්චයෙහි අනුග්ගහාපෙසිං,, සි

බුද්ධරජාණන්වහන්සේ පරිනිර්වාණයකළ වර්‍ෂයපටන් බුද්ධශාසන වර්‍ෂයෙදෙ
දහස්තුන්සිය සිව්සාළිසක්වූකල්හි වෙසක්මස පූරපසළොස්වක් දිනයෙහිලංකාද්වීපයෙන් අවුත් ජම්බුශ්‍රීයටවාසභවනාවූ අමරපූර, නම් මහාරාජධානියට
උපාසකයන්තුන්දෙනෙක් සමග පැමිණියාවූ සාමණෙර සනාමදක ඔවුන්
ගේ ආචාර්‍ය්‍යෝපාධ්‍යායයන් ඇතුළුවූ කුඩාමහත් කාරුණ්‍යචිමාරාජය අසා අති
ශයින් සොම්නසව පැමිණියෙම් දූරසිටආවාවූ නෑජනයන් ඤාතිසමූහයා
පිළිගන්නාක්මෙන් පිළිගතිමි. ශ්‍රද්ධාදිනොයෙක් ගුණයට වාසස්ථානවූ අප
ගෞතමබුද්ධ රජාණන් වහන්සේගේ වංශයෙහිඋපන්නාවූ අපගේ මහාධර්‍ම
රජතුමාටද, ප්‍රසන්නවීයුතු කාරුණ්‍යකියා සැලකොට මනාව ප්‍රත්‍යයෙන්
අනුග්‍රහකරවීමි. (යනාමෙආදික්‍රමයෙන්) අසොකාරාමයෙහි රත්නභූමි
කීර්ත්තිමහාවිහාරයට උතුරුදිශාවෙහි ආගන්තුකයන්ගේ ගෙයි වාසයකර
වීම් එම අවුරුද්දේවස් එළඹෙනදිනයෙහි සාමණෙර සනාමට මනාකො
ට උනතො ශුද්ධියකිරීමෙන් දෙවනු සාමණෙර ප්‍රව්‍රජ්‍යාවදුනිමි.

කප්පාසික කොසෙය්‍යචීවරාදිවූ ප්‍රත්‍යයානුග්‍රහයෙන්ද අවවාදනුශාස
ධර්‍මානුග්‍රහයෙන්ද සතුටුකරවීමි, වස්වසනතුන්මාසයතුල උපසම්ප
කැමැත්තෙන්කොට ප්‍රාතිමොක්ෂයමණ්ණකොට තියෙමි. නාදනම්
ාසකයාද, පැවිදිවීමට කැමැත්තෙන්කොට ලිංගදණ්ඩකර්‍ම සෙඛියා
ාපදයන් පුහුණුකරවීමි. වස්පවාරණකළකල්හිව නාහි උපසම්පදාවීමට
මතිවූ සාමණෙර සනාමහා පැවිදිවීමටකැමතිවූ නාදනම් උපාසක
ාද, පැවිදිඋපසම්පදාකිරීමට සුදුසුබව කෞමදතුන්දශ්‍රේණින්ව ශරත්
ප්‍රභා සමානවූ සෞවතහස්තිස්වාමිවූ, මහාධර්‍මරජහට සැලකෙළෙමි.
ාශාසනත්‍රයක්මෙන් ශාසනය ගරුකොටතමාගේයයි සලකන්නාවූ
හාධර්‍මරජතෙමේද, ඔවුන්ට පාත්‍රා සිවුරු ආදිසියලු ශ්‍රමණපරිෂ්කාරපිළි
ගන්වා ගිහිවෙස්ගන්වමින් රණිත්කරණලද මිණිබැඳිඔටුනු මුක්තාහාරප
රන් මල්දම්ආදි අනෙකප්‍රකාර ආභරණයන්සහිත රාජවස්ත්‍රයා සැව්
දීමෙන් ශක්‍රදෙවෙන්ද්‍රයා සමානවූ චක්‍රවර්ත්තිරාජවෙශයගන්වා සමුද්‍රය
සන්කොටඇති පෘථිවිය පාලනයකරන්නාවූ රජෙතුට සුදුසුවූ ඇද්දත්
ාන්තකළ රන්සිව්ගෙයකට, හෙවත්රන්දෙලාවකටනන්වා ලෙහිරුමඩ
බඳුවූ නොයෙක් ආභරණයෙන් සරහණලද රන්කුඩදෙකදෙක ඉසමත්
අල්වා බුරුමභාෂාවෙන්, ක්‍යං, කියන නම්ඇති ඇද්දත්හා මැණික්

රත්‍රන් යනාමෙයින් සරහනලද—වෙණුජත්‍ර නම් රාජභාණ්ඩය මුල්කොට ඇති නොයෙක්සියගණන් රාජකකුධභාණ්ඩ විසිරවීමෙන්බබලුවා නොනෙක්දෙශවල කුලපරම්පරාවෙන් පුරුදුකරණලද තූර්යවාද ගීතවාදිතනාටකාදි මාංගල්‍යජනයාගෙන්ද, නොයෙක්දහස්ගණන් තනතුරුවලට පැමිණියාවූ සෙනාපතිආදි අමාත්‍යපිරිවරහා රජපිරිවරින්ද පිරිවරවා තව්තිසාදෙව්පුරවරටබඳුවූ අමරපුරනුවරෙහි සුධාමහත් විවිසැරසීමෙන් වෛජයන්ත ප්‍රාසාදයසමානවූ එක්සියපනස්රියන්උස්වූ පහයකින්හෙබියාවූ රාජග්‍රහයට ප්‍රවෙශකරවා එහිම මඟුල්සැනකෙළිග්‍රහය නම්වූ තුන්මහල් රත්‍රන්ප්‍රාසාදයෙහිදකුණු මහෙසිකාවන්ආදිකොටඇති රජඅන්තඃපුරස්ත්‍රී සමූහයාවිසින්ද, මහායුවරජ්ජුරුවන් ආදිකොටඇති රජකුලසමූහයාගෙන්ද මහාසේනාපතිඇදි රාජඅමාත්‍යසමූහයාවිසින්ද කඩුගත්තාවූන් ආදිකොටඇති පිරිවරජනයාගෙන්ද, යනමේ සිව්පිරිස් මැදහුන්නේ තමාටවසඟවූ සියලුරජුන් පිරිවරකොටඇත්තේ මහාසම්මතාදි අසම්භින්න ශාක්‍ය වංශයෙහි උපන්නාවූ ශ්‍රද්ධාශීල ශ්‍රැතත්‍යාගාදි ගුණසමූහයට ආවාසස්ථානවූ ධවලගජපති මහාධර්මරජතෙම ඔවුන්ට ප්‍රත්‍යයධර්මදෙකින්ද අනුග්‍රහකොට ලොව්තුරාබුද්ධත්වය කාරණකොටගෙණ ඡද්දන්ත හස්තිරාජයකුගේ සෙඬත්සමානවූ රන්කෙණ්ඩියෙන් දක්ෂිණොදකයදුන්නේය—ඉන්පසුවකියනලද—සියලුඋපකරණහා සමඟ ඔවුන්රජගෙය කෙරෙන් පශ්චිමඋත්තර දිශාවෙහි ඇතුලුනුවරම පිහිටියාවූ තව්තිසාදෙව්ලොව සුධර්මනම්ශාලාව සමානවූ සුධර්මනම්තුන්මහල් රත්‍රන්මහාශාලාවට ගෙන්වා මොවුන්ම ප්‍රව්‍රජ්‍යාවද උපසම්පදාවද දුනමැනවැයි සංඝයාට පාවාදුන්නේය—

එකල්හි ඥාණාභිවංස ධම්මසෙනාපති මහාස්ථවිරයන් ප්‍රධානකොට ඇති පනස්එක්නමක් පමණ භික්ෂුසංඝයා සුධර්මශාලාව සමීපයෙහි පවත්නාවූ—හස්තිදන්ත සුවර්ණස්තූප—ය යන නම්ඇති චෛත්‍යයෙන් අලංකෘතවූ සුවර්ණගුහා යන නම්ඇති එකාදශවිපත්තියෙන් මිදුනාවූ ත්‍රිවිධ සම්පත්තියෙන් සමන්විතවූසීමාවටවැස්ව බුද්ධවර්ෂයෙන් දෙදහස්තුන්සියසිව්සාළිස්වන වර්ෂයෙහි වප්මසකාලපක්ෂයෙහි තුදුස්වනදිනදහවල් දෙවිසි පැයපමණවේලාවට සූතිස්වයස්ඇති අඹගහපිටියේ යන නම්ඇති සාමණේරනම ඥාණවිමලතිස්ස යන නම්කොට ඥාණාභිවංස ධම්මසෙනාපති ස්ථවිරයන්උපාධ්‍යායව උපසම්පදාකෙළේය, උත්තරදෙව්විහාරයෙහි වසන ස්ථවිරද, පාසාදවිහාරයෙහි වසනාස්ථවිරද, සොණ්ණලෙඛාගාර විහාරවාසී ස්ථවිරද, යන තුන්නම කර්මවාක්‍යකියන ආචාර්යයෝවූවෝය. එදවස්ම මාදම්පේයන නම්ඇති සාමණේරනම,—උත්තමසීරතිස්ස, යනනම්දීද, කොස්ගොඩයන පස්විසිවයස්ඇති සාමණේරනම ඉන්දවිමලතිස්ස යන නම්දීද, දෙවිසිවයස්ඇති බ්‍රාහ්මණවත්ත, යන සාමණේරනම, ජිනපාලතිස්ස යන නම්දීද, බෝගහවත්ත යන නම් ඇති සාමණේරනම ජයතුජිනතිස්ස, යන නම කොටද, වතුරෙගම යන නම්ඇතිසාමණේ

රතාව ධම්මාධාරතිස්සයනනාමිදීද උපසම්පදාකෙළේය. එදවස්ම නාදනම්
උපාසකයාද, ඤාණසිවංසධම්ම සෙනාපතිස්ථවිරයන්ම උපාධ්‍යායව පැවි
දී කෙළේය, ධම්මතිස්ස යනනාමන්දදුන්නේය. මිටදෙවෙනිඅවුරුද්දේ
වෙසක්මස ශුක්ලපක්ෂයෙහි පසළොස්වෙනිදින උපසම්පදාදකෙළේය; මෙ
සේ උපසම්පදාකර අවවාදදී සෙඛියාවත්හා කඳුවත්ද පාඨවසයෙන්ද
අර්ථවශයෙන්ද ප්‍රකාශකොටකියාදී නික්මවූයෙමි. යනාමේ කාරුණ්‍යසහි
තවූ ඉතාවැදගත් මානැඟි පාළිභාෂාවේ සන්දේශය නිරන්තරයෙන් රත්න
ත්‍රය පිහිටකොට වසන්නාවූ සිරිපවරවිජයානන්තයසත්‍රිභවනාදිත්‍යා
දිපතිමණ්ඩිතමහාධම්ම රාජාධිරාජයන නාම් ඇතිමහරජනට අර්ථයෙන්
ධර්මයෙන්අනුශාසනා කරන්නාවූ උභතොවිනය ධාරණාදී උපාධ්‍යායව
ආචාර්යඅගයන්ගෙන් සමන්විතාවූ නොයන්ත්‍රිකා සීලස්කන්ධස්ථිතාදී නො
යෙක් ප්‍රකරණකර්තෘවූ මහාවෛයාකරණවූ රතනාභූම්කිත්ති මහාවිහාර
ආදී රත්නවිහාරවලවසන්නාවූ උපසම්පදාවෙන් සත්විසිවයස්ඇති ඤා
ණාභිවංස මහාධම්ම සෙනාපති යන නාමඇති සංඝරාජමහා ස්ථවිරයන්
වහන්සේ විසින් ලංකාද්වීපයෙහි ශ්‍රීවර්ධන යන නාමඇති සොකඩගල්නු
වරවසන්නාවූ ශ්‍රීරාජාධිරාජසිංහ නාම මහරජහට අර්ථයෙන් ධර්මයෙන්අනු
ශාසනා කරන්නාවූ-ධම්මක්ඛන්ධ, යන නාමඇති මල්වත්තේ විහාරයෙහි
මොරතොට මහනායක ස්ථවිරයන් සහිත භික්ෂු සංඝයාටද,

ලංකාද්වීපයෙහිම රුහුණුජනපදයෙහි වැලිතරයනනමේ වසන්නාවූ
ධම්මරක්ඛිත යන නාමඇති ස්ථවිරයන්ටද මූලකීඅම්බගහපිටියේ තෙරුන්
වහන්සේ බාරයේම එවනලද්දේය.

මෙසේ අඹගහපිටියේ ඤාණවිමලතිස්සාභිධාන, අමරපුරසමාගමේ නා
යක ස්ථවිරයන් වහන්සේයයි මෑතකාලයෙහිවිසූ තෙරුන්වහන්සේ පටන්
සියම්, අමරපුර, යනසමාගම්දෙකක්ව මේ වනතුරු පවත්නාබවපෙණේ

තවද අත්තුඩාවේ ධම්මරක්ඛිත ස්ථවිරයන්වහන්සේ ප්‍රධානකොට ඇති
පිරිසක්ද එම අමරපුරදේශයටපැමිණ එහිසංඝරාජ මහාස්ථවිරයන් වහන්
සේ ප්‍රධානකොට ඇති මහාසංඝයාගෙන් උපසම්පදාවලැබ ලක්දිවට
පැමිණියාය.

නැවත, ගාලුනුවරට ආසන්නවූ දඩිල්ලේවාළුකාරාමයෙහි විසූ ශුද්ධාශී
ලාදි ගුණගණෝපශෝභිතවූ ශාස්ත්‍රාගමදන්නාමෙන් විඥතාවූකාරණ වැ
ටහෙන ප්‍රඥාවෙන්හා සභාරඤ්ජනයෙහි අතිදක්ෂවූ සනාගුණයෙන් යුක්තවූ
ධම්මක්ඛන්ධ ස්ථවිරයන්ද, අමරපුරනාම්, රාජධානියටගනුකැමතිවූකල්හිමෙම
ස්ථවිරයානන්ට සාදරයෙන්සත්කාර කළාවූ කීර්තිප්‍රතාප දෛවාන්විත
දඩිල්ලේ, අදිරියන්දආබ්‍රෙව් රාජපක්ෂමහමුදලිතුමා, ගේ ප්‍රධානත්වයෙහි
ශ්‍රීයෙළකරදෙනලද, සිංහුනුනර මහාචෛත්‍යාදියට, පිදීමටසුදුසුභාණ්ඩද,
අමරපුරයෙහිවසනමහාස්ථවිරයන්වහන්සේලාට පූජාකිරීමටසුදුසුවූමාහැඟි
සිවුරුපාත්‍රා කුඩවහන්ආසනාරණාදී බොහෝකැපපිරිකරද, බුරුමදේශාධි
පති ප්‍රථිවීශ්වරමහරජතුමාට පඩුරුකොට රියනක්පමණ ලොහමයබුඬප්‍රති

මාවත්ද, වියතක්පමණ පස්ලෝන පිළිමයක්ද, සර්වඥධාතුසහිතවූ රන් රී
දිසඳුන්කරඬුද, මිටියතාක්පමණවූ ඇද්දත් පෙට්ටියක්ද, සහිතවූ වෙනත්
භාණ්ඩද, ශිෂ්‍යයන්සහිතවූ තෙරුන්නාන්සේලාට ප්‍රත්‍යය උපදවාදීමසඳ
හා කැපකරුවන්ට පාවාදෙනලද වරාගන් දෙසියයක්හී නවත්, බො
හෝපිදීමුදල්ද, යනාමේආදි බොහෝමාගෝපකරණලැබ ධම්මරක්ඛිත, ධ
ම්මදින්න, ගුණරතන, සුමණ, ය යන සිසුන් සතරනමක්ද, සංඝතිස්ස
ජනානන්ද; යන සාමණේර දෙනමක්ද සහිතවූ කැපකරුවන් තුන්දෙ
නෙක්හාසමග ධම්මඛන්ධ ස්ථවිරයෝ අමරපූරයට යමැයි සම්මච්චිනාම්
නාගපට්ටනමේ මිනිසෙකුගේ සමුද්‍රයාත්‍රාවකට නැගී බුද්ධවර්ෂයෙන්දෙදහස්
තුන්සිය එක්පනස්වන අවුරුද්දේ බිනරමස් කාළපක්ෂයෙහි දෙවෙ
නිදින ගාල්ලේනැව්තොටින් නික්ම ක්‍රමයෙන් බුරුමදේශයෙහි අමරපූර
රාජධානියට පැමිනිකල්හිඑහි මහරජානන්විසින් බොහෝපිරිවර අමාත්‍ය
යන්හාසමග එවනලදසිරිනන්දසුර නම්පණ්ඩිතමහාඅමාත්‍යයන්හාසමගම
හාධර්මරජානන්විසින් කරවනලද අසොකාරාම නම් ස්වර්ණමහාවිහාර
යට එළඹි එකිසංඝරාජ මහාස්ථවිරයන් වහන්සේගේ සමීපයේ විසූයේය.

දෙවනු එමමහරජානන්විසින් එවනලදඅමාත්‍යමණ්ඩලයාසමගලක්දිව
තෙරුන්වහන්සේලා රජ්ජුරුවන්වසන ඇතුල්නුවරට එළඹවා එහිරජ
මහ විහාරයෙහි වාසයකරවා සිව්පසප්‍රත්‍යයෙන් උපස්ථානකරවූයේය —
නැවත සිංහලතෙරුන් වහන්සේලාමෙමමහරජානන්විසින් කරවනලද
ස්වර්ණමය පස්රියන් බුඩප්‍රතිමාවද, සත්රියන්උසසකණ පස්ලොහො ප්‍ර
තිමාවද, සහිතවූ චෛත්‍යයන්ද, වැඳපුදා පසළොස්රියන්උස දෙළොස්
රියන් පුළුල සහිස්රියන් වටඇති මහත්ලොහමය ස්වර්ණාධාරයද බලානැ
වත මහරජානන්ගේ කැඳවීමනිසා රාජගෘහයට පැමිණියානු බොහෝ අ
මාත්‍යසමූහයා පිරිවරකොටඇති අනන්තරාජ සෘද්ධියෙන් සොභාමත්වූ
මහාධර්ම රජ්ජුරුවන් දැකකරණලද පිළිසඳරකථාඇත්තානු සියලුතොර
තුරුපුවෘත්ති සැලකලකල්හි මහරජතෙමේ අසොකාරාමයට පූර්වදිශාවෙහි
එකාදශ විපත්තියෙන් මිදුනාවූ ත්‍රිවිධසම්පත්තියෙන් යුක්තවූ පිරිසිදු ම
හාමංගලසීමාවට පරෙපවාදගහීමාත්‍රයක්ද නැතතාවූඤාණාභිවංස ධම්
මසේනාපතිමහාධම්මරාජගුරුයයි ලබණලදනම්ඇති සංඝරාජමහාස්ථවිර
යන්වහන්සේප්‍රධානකොටඇතිඑකුන් විසිනමක් සිසුන්තෝර කැඳවා
ශිෂ්‍යයන්සහිතවූමේ ධම්මඛන්ධ ස්ථවිරයන්වහන්සේට උපසම්පදාව දුන
මැණවයි පාවාදුන්තේය එකල්හිබුද්ධවර්ෂයෙන් දෙදහස්තුන්සිය දෙපණස්
වන අවුරුද්දේ දුරුතුමසකාළපක්ෂයෙහි දශවෙනිදින යසොටාකන සංඝ
රාජමහාස්ථවිරයන්වහන්සේ උපාධ්‍යාව මණිමාලංකාර ස්ථවිරයානන්හා
ගුණසිරි ස්ථවිරයානන්ද,යනාමේදෙනම කර්මාචාරීවධම්මඛන්ධස්ථවිරයන්
මුල්කොට ඇතිපස්නමට උපසම්පදාව දුන්නාහුය.

නැවතද, එමසීමාවෙහි සතලොස්නමක් භික්ෂුසංඝයාවැඩහිඳ ඊම්සංඝරාජ මහාස්ථවිරයන් උපාධ්‍යාව එම ස්ථවිර දෙනම කර්මාචාරීව, සංඝතිස්ස ජනානන්ද යන සාමණේර දෙනමට උපසම්පදාව දුන්නේය. නැවතද, රාජමහාසීමාවෙහි අවිහිනාමක් භික්ෂුසංඝයා වැඩහිඳ ඤාණාලංකාරාභිසද්ධම්මධජ මහාධම්මරාජ ගුරුනම්ගණාචාර්ය මහාස්ථවිරයානන් උපාධ්‍යාව දලුක්කම්යසඳහාද, මූලතිපස්නමට ශික්ෂාවදුන්නේය. මෙසේඋපසම්පදාව දුන්කල්හි සුවර්ණභූමි, රාමඤ්ඤදෙශ, සිරිබෙනාරට, ජයවඩ්ඪනරට, අයෝධ්‍යරට, හරිභුජරට, ඛෙමරට; කාම්බෝජරට, සිව්රට, චීනරට, මහාවිනිකරට, ආදිනොයෙක්මහා දෙශවල රජුන්ටප්‍රධාන රාජාධිරාජවූ—සිරිපවර විජයානන්ත යසත්‍රිභවනාදිත්‍යාදි පතිමණ්ඩිත මහාධම්මරාජාධිරාජ, නම්ලත්මැතුමාවිසින්ධම්මකඛන්ධස්ථවිරයානන්ට ගණනාසකාපූර්වහාසමග සද්ධම්මවංසපාල සිරිධම්මනඛන්ධ මහාධම්මරාජගුරු යනුමේ නාමයක්දදී බොහෝසෙයින් ලක්දිව අවිද්‍යමානවූ එකසියඅනූවකට වැඩිවූ ශාස්ත්‍රාගමසම්බන්ධවූ ප්‍රකරණද, පූජාකරණලද්දේ ඉහිරිසනාමක්පිරිසහාසමග ලක්දිවටඅවුත් ශාසනාදියුනුවට හිතවූ පැවිදිඋපසම්පදා කිරීම් ශාස්ත්‍රාගම පූහුණුකරවීම් ආදික්‍රියාවලින් අමරපූරනිකාය වැඩිදියුණු කෙළේය. තවද, මෙම නායකස්ථවිරයන්වහන්සේගේ ශිෂ්‍යවූ ඉහනතී සුමනාභික්ෂුද, ශබ්දශාස්ත්‍රාභ්‍යසනීන ධර්මවිනයෙහිත් ව්‍යක්තව එසේම සුපෙසල ශික්ෂාකාමී ගුණයෙන්ද අනූනව මැනකාලයෙහි අමරපූරනිකායේ නායකධූරයටද පැමිණීමෙන් බොහෝසෙයින් ස්වදෙශදෙශාන්තරයෙහි ප්‍රකටව විසූකිසිවෙක්වත් සිහිනූත්ල ශූන්‍යකොට නොසිතන්නාවූ මේතෙරුන්වහන්සේගේ ආධාරයෙන් අමරපූරනිකාය වැඩිතරම්දියුණුවට පැමිණියේයයි පෙනේ—

තවද, බෝගහපිටියෙ ධම්මජෝති තෙරුන්වහන්සේ ප්‍රධානකොට ඇති පිරිසක්ද එසේම අමරපූරරාජධානියටපැමිණ ලබණලද උපසම්දාව ඇතිවඅවූන් උඩපාතරටදෙක්හි බොහෝකුලපුත්‍රයන් පැවිදිඋපසම්පදාකොට අමරපූරනිකායික භික්ෂුපිරිස ඇතිකොළේය, මේධම්මජෝති තෙරුන්වහන්සේද, අතිසයින් ශික්ෂාගරුත්වයෙහි යෙදුනාවූ තික්මුනු මණකොට පුහුණුකරණලද ශාස්ත්‍රාගමඇති ගරුකටයුතුවූ ශික්ෂාකාමීන්විසින් සිත් ඇළියයුතු උතුමෙක.

නැවතද, ලජ්ජීපෙසල ශික්ෂාකාමී සිල්වත්ගුණවත්, ඥාණරතනාභිධාන, ස්ථවිරයන්වහන්සේද, බූරුමදෙශයෙහි ශාසනධර්මය පිරිසිදුව පවත්නාබව අසා එහියනුකැමතිව ශ්‍රද්ධාසිත් පහලකොටගෙණ, ඥාණවිමලතිස්ස ස්ථවිරයන්වහන්සේහාසමග ප්‍රථමවාරයෙහිඅමරපූරයෙහි, සංඝරාජමහාස්ථවිරයන්වහන්සේ ප්‍රධානකොටඇති භික්ෂුසංඝයාගෙන් උපසම්පදාව ලැබූ යටතිබෝගහවත්තේ ස්ථවිරයානන්සමග එක්ව, කල්‍යාණතිස්ස, ධම්මරතන, ධම්මසාර, පඤ්ඤාතිස්ස, සුමනතිස්ස, යනාමේආදි සාමණෙර

අටනමක්දනැව්ව දෙදහස්තුන්සියදෙපනස්වෙනිඅවුරුද්දේ හැව්නැගී රාමඤ්ඤ දෙශයෙහි හංසාවතී නුවරටපැමිණ එහිමණ්ඩලිකරජහටතමන් ආප්‍රවෘත්තිකීකල්හිමණ්ඩලිකරජතෙමපිරිස් සහිතවූ සිංහලතෙරුන්නාන්සේලා හංසාවතිනුවර ගණනායකසාවු විරයන්වහන්සේගේ විහාරයෙහි වාසයකරවා මහාවසත්කාර කරවූයේය: නැවත, ධම්මරතන, ධම්මසාරයන සාමනේර දෙනමහා සමග මණ්ඩලිකරජ්ජුරුවෝ අමරපුරරාජධානියටපැමිණ උපසම්පදාවලබණුයිණිස තෙරුන්වහන්සේලා දෙනාමක්නාසමග සාමණෙර අටනමක්, හංසාවතී, මහනුවරට පැමිණසිටිනාබව, මහාධර්මරජහට සැලකලකල්හි; මහාධර්මරජතෙම ධර්මවිනයෙහි අතිදක්‍ෂවූ උත්මෙවූන්සත නම් ඇතිතමන් ඇමතියාට හංසාවතීනුවර වසනා සිංහලතෙරුන්නාන්සේලා උපසම්පදාකරවයි අණකර ධම්මරතනාදි සාමණෙරදෙනමදෙවනුත් මණ්ඩලිකරජ හා සමග හංසාවතිනුවරටඑවූයේය. එකල්හි මණ්ඩලිකරජතෙම හංසාවතිනුවර සුපෙසල සාවිරයන් විසිනාමකටවැඩිව එහිටබසීමාවට රැස්කරවා, උත්මෙවූන්, නම්පණ්ඩිත මහාඅමාත්‍යයාද, සිමාවතුලබලාඉන්දදී මෙධානන්දධජ සාවිරයන්වහන්සේ උපාධ්‍යවඤාණගම්භිරධජ, පඤ්ඤාසාරධජ, ආචාරවංසධජ, යනමේසාවිරවරු තුන්නම කර්මවාචකාචාර්යවව ගුණරතනාදි සාවිරදෙනාම සහිතසාමණෙර අටනමටද මනාකොට උපසම්පදාසීලය දෙවූයෙය—මෙසේලබනලද උපසම්පදාවඇත්තාවූ භික්‍ෂුහුනැවත ලක්දිවටඅවුත් උපසම්පදාදී විනයකර්මකරමින් අමරපුරනිකාය වැඩිදිවූහුකලෝය.

මෙහිදක්වූක්‍රමයෙන් ලංකාවීපයෙහි භික්‍ෂුහුනිකාය තිපයක්වීමෙන් බිඳී ඔවූනොවූන් විරුඬව අලජ්ජිපාපභික්‍ෂුන්ගේ වැඩීමෙන්ද කලින්කලනානාප්‍රකාර වෛතුල්‍යවාදහටගැණීමෙන්ද ඒඒ දෙශවලින් සංඝයා ගෙන්වා ශාසනයශුඬකරවීමෙන්ද ටිකකාලයක්ඇර අනික්සියලුකල්හිම ලංකාවේබුඬශාසනය ආකුලවපැවතුනුබව මෙප්‍රථමභාගයෙන් ප්‍රකාශවේ—

---

## දෙවනිභාගය,,

---

හ සාවති, මුතතිම, සවණ්ණභූමිය, යනමණ්ඩලතුනෙන් යුක්තවූ, රාමඤ්ඤදෙශයට සොණ උත්තරයන සාවිරන්වහන්සේලා බුඬවර්ෂයෙන් 235 වෙනිවර්ෂයෙහි වැඩමවා පිහිටවූබුඬශාසනය වෛතුල්‍ය වාදාදියකින් හො නිකායතිපයක් විමෙක්හෝ අලජ්ජීන්ගේ උත්සනන භාවයකින් හෝ සංඝයා වඟීවීම්ආදියකින් කිසිආකුලභාවයකට නොපැමිණ අවුරුදු 1358 ක්පැවතආයෙය.

එකල්හි ලක්දිවසිට රාමඤ්ඤ මණ්ඩලයට පැමිණියාවූ ජපපට සාවිරාදී භික්‍ෂුන්ගේ අසමගිතාවයනිසා නිකායදෙකක්ව නැවත ක්‍රමයෙන්නිකාය හයක්ව උපසම්පදාදී විනයකර්ම කරණසීමාවලටද බොහෝසෙයින්

අවිද්‍යමානවූ නොයෙක්සැක ඉපදවීමෙනුශාසන දූෂ්‍යයයිසලකා 2047 වෙනිවරුෂයෙහි රාමඤ්ඤදෙශාධිපති ධම්මචෙතිය මහරජ්ජුරුවන්විසින්මහාස්ථවිරයන් දෙවිසිනමක් භුවනෙකබාහු මහරජහට පඬුරුසහිතව ලක්දිවට පිටත්කරණවනලද්දනු පූර්වභාගයෙහි කියනලද බුරුම රටෙ සංඝයාගේ පරම්පරාවෙන් පැවතආ ලක්දිව තෙරුන්වහන්සේලාගෙන් උපසම්පදාවලැබදෙවනු රාමඤ්ඤදෙශයට ගියාවූතෙරුන්වහන්සේලා ධම්මචෙතිය මහරජානන් ආධාරයෙන් රාමඤ්ඤදෙශයෙහි ශාසනයශුද්ධකොටපිහිටවූතැන් පටන් මේ වනතුරුශුද්ධවම්පවතී.

මේ නිකායද බුරුම රටින් ලක්දිවටගෙණවුත් පැවතආ පරම්පරාවෙන් නැවත රාමඤ්ඤයට ගෙණගියනෙයින් බුරුමනිකායට අන්තර්ගතවූයේද කැල්‍යාණියෙන් ගෙණගියනෙයින් කල්‍යාණිසමාගමයයි කියති, අනුරාධපුර නුවර මහමෙව්නාඋයනෙහි කරණලද ලොහමහාප්‍රාසාදය සහිතවූ මහවිහාරයෙහි විසූතෙරුන්නාන්සේලාගේ පරම්පරාවෙන් එහිගෙණගිය හෙයින් මහවිහාර පරම්පරාවයයිද කියති,

මීට අවුරුදු 300 කාටපළමු සියම් දෙශයෙහිරජපැමිණි නරිසර මහරජානන්විසින් රාමඤ්ඤදෙශයට සැනායවනලදසෙනාව කැඳවා රාමඤ්ඤදෙශයෙහිසිටිකල්‍යාණිවංසිකභික්ෂූන් බොහෝගණනක් සියම් දෙශයටගොස්විසූතැන්පටන්රාමඤ්ඤනිකායසියම් දෙශයෙහිපිහිටියෙය, සියම් දෙශයෙහිපළමුසිටපැවතආ නිකායටවඩා මේනිකාය ශුද්ධනිසාවූල නිකායයිකියාද ඉතිරි නිකායට මහනිකායයිදකියති මහනිකායහාවූල නිකායයන මේ දෙකවෙන්වශයෙන් මෙතෙක්කල් පැවතආබවපෙණෙ. ඉහතනිකායෙන්පසුත් දෙවරක්රාමඤ්ඤදෙශයෙහිසංඝයා, සියම්දෙශයටගොස් එහිවිසූ රාමඤ්ඤනිකායෙ සංඛ්‍යාවසම්ගිව විසූබවද ප්‍රකාශවේ—

## තෘත්වතභාගය,,

අරිමද්දනාදි නොයෙක්නගරයන් අන්තර්ගතවූ තාම්බදීපරටයයිකියනලද සුනාපරාන්තරට පැළලුප්නුවරින්වැඩියාවූ රකඛිතමහාස්ථවිරාදි සංඝයාහිගේ ශාසනයපිහිටවූකාලයපටන් මෙවනතුරුම බුද්ධභක්තික මහරජවරුම අනුකරමින් ධම්මවිනයධර සුපෙසල මහාස්ථවිරාදීන්ගෙන් බැබලීමෙනුත් සමගිවූඑකමනිකායක්ව පැවතීමෙනුත් මිථ්‍යාදෘෂ්ටිආදීන්ගේ භයහාඅලජ්ජිපාපයන්ගේ පීඩාදරහිතව බුද්ධශාසනය පැවතාබවපෙණෙ—

හෙද අරිමද්දනනුවර අනුරුද්ධමහරජානන්රාජ්‍යකරණසමයෙහි බුරුමදෙශයෙහි එක්ප්‍රදෙශයක්වූ සිරිඛෙත්තනුවර, ආදිකිසිතැනෙක සමණකුත්තකයෝයයි පාපීජනසමූහයක් ශාසනයදූෂ්‍යකරණකල, බුරුමදෙශයෙහිම සුධම්මපුරයෙහි ධම්මදස්සි තෙරුන්වහන්සේ එහිවැඩමවා අනුරුද්ධරජ්ජුරුවන්ලවා ශ්‍රමණකුත්තකයන්ගේ අන්තරායවලක්වා ශාසනය බැබලවූයෙය—

තවද; බුරුමරට මධ්‍යදෙශයකෙරෙන් බටහිරදෙශනොවනබැවින් අ
පරාන්තකරට බුරුමයනොවෙයි, බස්තාඉරඉත්දියාමයයිකියන පාර්සිර
ටයයිබුරුම්නිකායන්නරුස්සන කිසිකෙනෙක්කියති, මේකීමසඳහා කියයුතු
කරුණු මෙහිපහළවේ— ක

සතුරත්ගේමේකීම මනාකොටම මැඩපැවැත්වීම පාසුවේ—

පුණ්ඩ්‍රාඃකලිංගාමගධාදාක්ෂිණාත්‍යාශ්ච සර්වශඃ,
තථාපරාන්තාඃසෞරාෂ්ට්‍රාඃශූරාභීරාස්තථාර්බුදාඃ,
මාලූකාමාලවාශ්චෛවපාරියාත්‍රනිවාසිනඃ,
සෞවීරාඃසෛන්ධවාහූණාඃශාල්වාඃශාකලවාසිනඃ,
මද්‍රාරාමාස්තථාම්බෂ්ඨාඃපාරසීකාදයස්තථා—

විෂ්ණුපුරාණයෙහි පරාශරඍෂිවිසින් රචිතමේශ්ලෝකයන්හි අපරාන්ත
කරටහා පාර්සිරටත් දෙකදෙශදෙකක්කොට දෙසුවා තයෙහි වෙන්වෙන්
වශයෙන් අවශෙෂදෙශනාමයන්සමග කියාතිබෙණ සැටිබැලීවාම පාර්සි
රටටම අපරාන්තයනනාමය කිව්වායයනසතුරන්ගේකීම ග්‍රාම්‍යබවපෙ
නේ මෙපමණක්නොව අපරාන්තරට මධ්‍යදෙශයකෙරෙන් බටහිර දෙශ
යයිකියන විරුඩවාදීන්මැඩපැවැත්වීමපිණිස අපරාන්තරට මධ්‍යදෙශය
කෙරෙන් උතුරුදිගයයි වායුපුරාණ යෙහිපේණකීමදක්වාලමු. පඬිතවිල්
සන් විසින් ඉංග්‍රීසිභාෂාවට නගණලද විෂ්ණුපුරාණ යෙ 189 වෙනි පිට
බැලීවාම අපරාන්තා යනනාමයෙහි අර්ථය මධ්‍යදෙශයටඑකාටබවූ රටක
ව්‍යුහෝයයිපෙනේ. එයිනුත් අපරාන්ත යනුබටහිරදෙශරටස්යයිකීම දෝ
ෂබැව්කියමු බුරුම්දෙශයට අයිති ඉමමධ්‍යදෙශයට එකාටබවතිබෙණබව
දකියහැකි අපරාන්ත්‍රට ගන්ධාර රටවද එකාබඩයයන විල්සන්පඬිතයා
ගේ කීමෙන්ද; අපරාන්තය බුරුම්යබවම කියහැකි බුරුමරටටඅයිතිවූ ර
ටක් එහිඅසල ගන්ධාර නාමින්තිබෙණවා.

බුරුමරට අපරාන්තකයයිඑමරටේ ලියනලදප්‍රකරණවල තිබෙණවාප
මණක්නොව ඒරටවාසිහුද ඒරටේනාම එසේමදනිත් බුරුමරටේ නාමය
ඒරටවාසින්මත් එහිපුරාණපොත්ලියුවන්ටත් වැරදිහිබී අන්‍යරටක නො
වන් ලංකාවේ කෙනෙක්එය හරිආකාර දැනගත්තායයනකීම දුළුමයකා
මක්නිසාද; සියරටේනාම ඔවුන්ටවඩා අන්‍යයෝනොදනිත්පසුතියකාලයෙ
හි ලක්දිවින් කල්කතානුවරට ගියවුන් ඒරටවාසිහුදක රටකොයිබඳුයිඇ
සූකල ලංකාවේයයි කිව්වවනයට කල්කතානුවරවැස්සෝ ලංකාවේ ම
නුෂ්‍යයෝනැත යක්ෂපූරයක ඔය තියන්නේබොරුයයි නොඇදහුවෝග
බුරුමරට අපරාන්තකයයි ඒරටවාසින්ගේකීමට වෙනස්ව අන්‍යරටක් අ
පරාන්තකායයි කීමලංකාවේමනුෂ්‍යයෝ නැ නැයිකීවූකල්කතානුවරවාසින්

ගේකීම සමාණයයි හැරදැම්ම යුතුවේ. ලක්දිව්වාසීනු පසුයියද, සියම්රටවගියකල ලක්දිවඹපමණ ලඟනොවේයයි පොත්වලිනුත්කාරණාපෙන්වා සිංහලඅයගේ කීමමහානිකායිකයෝ ඇඳනුවේනැතැයි, දෙවමොලියනානම්ඇතිතෙරුන්නාන්සේලියාඑවාතිබෙණිසඳ ඔබඳුනුවන මඳවුන්ගේකීම් ප්‍රමාණනොවේ—

බුරුමදෙශයෙහි බුඩශාසණය පිහිටියාවූ කාලයපටන්අපේකාලයවනතුරු මෙම දෙශයෙහි රජාසනය අන්‍යදෙශයක සතුරුරජෙකුට අත් පත් නොවී බුරුමරජවරුන්ගේ අසිහියෙම්පරම්පරාවශයෙන් පවත්වාගණ ආබැවිනුත් ඒරටේශාසනධර්‍මාදීයට කිසියම්හානියක් විමටහේතුවක්ව පැවතුනේනැතැයි සැලකියයුතුවපෙණේ—

තවද, ධර්‍මචෙතියමහරජානන්ගේ කාලයෙහි හටගත්නිකායභෙදහා සීමාවාදත් රාමඤ්ඤදෙශයෙහිම හටගත්බවමුත් බුරුමදෙශය ඒකීසිවකින්වත් ආකුලවූබවක් නොපෙණේ. රාමඤ්ඤදෙශයෙහි භික්ෂූන්ගේ උපසම්පදාවට සැකඉපදවූ ධර්‍මචෙතිය මහරජානන්ගේ කාලයෙහි බුරුම දෙශයෙහි සංඝයාලවා ශුද්ධියක්කරවීමට ඕනැනොකලේ ඒරටදෙකේ රජුනු සුධකොලලනාලසහිතව සතුරුවසිටියහෙයින් වියයුතුයි—

ශාසනපරම්පරාවන්දක්වාතිබෙණ කොයියම්ප්‍රකරණාදියකින්වත් බුරුමදෙශයෙහිශාසනපරම්පරාවට කිසියම්හාණියක් නොහොත්ද්‍රෂ්‍යභාවයක් වූබවක් පෙණෙන්ට නැතිබැවිනුත් කලින්කල බුරුමදෙශයෙහිවිසූ පයසීාජ් හිධර පඩිත සුපෙසල මහාථෙරයන් වහන්සේලාවිසින් කරණලදශාසනාගමාණුකූල වැදගත්ප්‍රකරණසහිත ශාසනප්‍රවේනිය ප්‍රකාශවතිබෙණ පොත්වලිනුත් මෙබුරුමදෙශයෙහිපමණ අන්රටක ශායණය නොකඩව පිරිසිඳුව පැවතආවේනැතැයි කියන්නට ඕනෑවපෙණේ. මෙපමණක් නොවදනාටරාමඤ්ඤදෙශයෙහිපවත්නා උපසම්පදා පරම්පරාව සහිතවූ සියම්දෙශයෙහිපවත්නා රාමඤ්ඤනිකායටද, ලංකාවේපවත්නා අමරපුරනිකායටද, යනමේතුනටම එකම්බුරුමරටසමාගමම මූලක්වපත්නාමේ කාරණය බුරුමනිකායෙහිහෙවත් අමරපුරසමාගමේ ලංකාවාසීඅපිහැමට උසස්වූ මහත්ප්‍රිතිදායක වැදගත්කාරණයක්ව තිබෙණබව එළිදරව්කරකීමට සුදුසුකාලයක් මෙපැමිණියාය—

## සතරවෙනි ,,

මෙතැන්පටන් මේකාලයෙහි ලක්රිවිකිරණ නම්වූආරංචිපත්‍රයෙන් බුරුම රාමඤ්ඤ නිකායදෙකටහා සියම්රට ධම්මයුත්තික නිකායටත් අභූතවූවචනරාශියකින් කරතිබෙණඅයුතුවූදෝෂාරොපනාසඳහා එකානිනාසත්‍ය

වූ කාරණාදක්වීමවසයෙන් ඒදෝෂාරෝපණයමුදු මෙම නිකායවල ශුද්ධපිරි
සිදුතාවය දක්වීමසඳහා මේආරම්භයයි—

☞ ක්‍රිස්තුවර්ෂ 1872 ක්වර්ෂයෙහි ප්‍රසිද්ධවූ ලක්රිවිකිරණ නම්ආර්ංචි
පත්‍රයෙහි සත්‍යවිභූෂණ යනනාමත් ප්‍රකාශකරසිටියාවූ එක්තරාකෙණෙක්
අත්තකාංසත පරවම්භනමුල්කොට අඹගහවතෙත යනනාමිඇති උන්
නාන්සේකෙණෙකුගේ වර්ණනාවයහා සියම්උපාලිනිකායට නොයෙක්
චෝදනා සහිතවූ ගහීද, අමරපුරනිකායට ව්‍යාජයෙන් අනාදරදක්රීව
වශයෙන් නුසුදුසුලෙසප්‍රකාශකලාවූ ලියුම්කීපයක්මදුටුවාවූ, සියම්උපාලිනි
කායටඇළුම්ඇතිවෙක් විසුද්ධසුභාදයනනාමයකින් පෙණීසිට 1872 කක්
වූ අවුරුද්දේ 45 වෙනිලක්රිවිකිරන් පත්‍රයපටන් පත්‍රකීපයකම බුරුමරා
මඤ්ඤදරවදෙකේ ප්‍රව්‍රජ්‍යාවංශයටහා සියම්රට රාමඤ්ඤ සමාගමටද, මිථ්‍යා
ප්‍රලාප බස්රාසියකින් නොයෙක්අන්දම්ත්නින්දාකර නොගැලපෙණ ප
ණ්ඩිතගොචරනූවූ කාරණාසහිතලියුම් ලංකාවමූළිල්ලේ ප්‍රකාශකළබව මෙ
රටවාසිබොහෝදෙනා දන්නවාඇති.

සත්‍යවිභූෂණ, කියනඅයගේ මහත්ප්‍රලාපගෑටූ විසුද්ධසුභාදමේපරිද්දෙන්
ඒවක්‍රියාකිරීමපිනිස මිහැකලතැනදී සැලකියයුතුකරුණුකීපයක් තිබීයි
යා ඒනම් සත්‍යවිභූෂණ මොනුයයිඇඳිනගැණිමට කිසිමඅපහසුවක් නො
තිබූණුබැවින් මොහුගේමේඋත්සාහයට බුරුමනිකායෙහි වැඩිසිටියෝ බල
දුන්තේද නැද්දයනු තත්වාකාරයෙන් නොදන්තේනම් සොයාදැනගත
යුතුව තිබීයියායමේපටන්ගත්නාක්‍රියාවේබරඒනම්සියම්, බුරුම, රාමඤ්ඤ,
ලංකා, යනමේවූධාගමදනාට ශුද්ධවපවතිනවායයිසම්මතවූ සෑමරටවල්ම
සම්බන්ධවූ එසිනූත් ඔවූනූපැලඳීමහරජවරුදෙදෙනෙකුගේ ආරක්ෂාසහිත
උපකාරයෙන් ජීවිතයසේ ප්‍රියතරවපවත්වන සැවදහසකටත් වැඩිතර
ම් සිසුනූසංඝයාගෙන් බබලන බුරුම රාමඤ්ඤ නිකායදෙකක් මූලෝච්
ඡේදනකර සුන්කිරීමට ඊක්කෙණෙක්පටන්ගත්තා මේතරම්මහත්විශාල
බරක්‍රියාවේමනත සලකා සන්සුන්කමින් විමසාබැලීමහා තවත් දනුමැති
ප්‍රධානනැත්හාසමග කථාබස්කර අහබලා විශේෂයෙන් ස්වකීයපක්ෂයෙ
කැමැත්තාවහා අදහස්වලටත් අවිරුද්ධව මේනීසාසමාදනයනමැති මහත්
බලයකඩවී ගිහිපැවිදි සමූහයානොයෙක්විග්‍රහවිවාද උපදවා අඬදබර හ
වගැණී සියල්ලවූන්ගේම ඇතිනැතිදෙස් ලොවප්‍රකටව මදවත්සැදහැ
හීත්ඇතිව වශනාගෘහෘඑයන්ගේ කලකිරීමෙන් මිථ්‍යාදෘෂ්ටි භජණයකිරීම
ද, අන්‍යලබ්ධිකයන්ට බලලැබීමෙන් සර්වඥශාසනය විනාශවීමට කාර
ණයක්වපවත්නාබවදමේආදි අනන්තකාරණා මේගැණසිතීයටගතයුතුව
පෙණෙන්නාවඹිනැය සියම්සමාගමේම සිටියෝ අමරපුරසමාගම පිළිගෙණ
ඇතාම්කෙණෙක් එමසියම්සමාගමට දෙස්පහලකර කළින්කළ ම්න් ඉහ
තහටගත්වාදවිවාදමෙන්ම මේවිවාදයත් හටගත්තායයි පේණපමණමුත්

අමරපුරසමාගම දියුණුකලාවූ එබඳුන්ගෙන්හටගත් එකක්හොවේයි' ඇරන් මින්ඉහතහටගත් විවාදවලදී උගත්නුවනැත්තෝබැඳී ඊට ත්‍රිශා කලබැවින් මෙබඳුහානියකට කාරණා කිසිසේත් යෙදීගියෙනැත. බුරුමරම ඉසැරටවල උන්නාන්සේලා පරමදුස්සිලඅලජ්ජීයයි කියාවත් ගෙණ පතයවැදී තරවියකඩාගිහායකියාවත් මෙරටදෙස්හි සියලු සංඝයා හිර් එකසමාගමයැයිකියාවත් මේආදිඅවනෝදූබස් අපිඑකාන්තයෙන් ඇසුවේමනැත. මේවිවාදයෙහිදීත් බුරුමනිකායෙ ප්‍රධානාචාර්යයන් තීපනමක් හාසමග සන්සුන්කමින් කථාබස්කලානම් නිකායදෙක්හි වැදගත්තැන් එකගව සත්‍යවිභූෂණන් ඒවකාටයුතුවහිතෙණ ගැටිසට එක්විධියකපිහිටුවමා තෝලුනාලාදයනොවී රටසන්සිඳවා සැනසීමලබානැණීම අමාරුවක්ව තිබුනේනැත. මේකිඋමම්නානස්ථෙගාතොට අනාකාරදඬිසිත්ඇති ලාබාලපිරිසකියනකියනදෙයට කන්දී සත්‍යවිභූෂණගේ පුතිපත්තියම විසඬසුනාදත් පිරිමටපටන්ගත්බව දකීමඅපට මහත්අනුකම්පාවට කරුනාකි මෙපරිද්දෙන් අමරපුරසමාගමකොරේ හටගතතාවූ නින්දාඅපහාස සහිතචෝදනා ඇසූඇතම් ගිහිපැවිදිපිරිස මහත්චලනාවයකට පැමිණිබවදුටු අමරපුරසමාගමේ ප්‍රධාන ගණාචාර්යවරු ඒඒගණනායකාචාරයන්වගන්සේලාගේ කැමැත්තනියාවට එක්සාමායකට රැසිහුනව මේ උපන්විවාදය සන්සිඳීමසඳහා තුමක්කටයුතුදගතු සාකච්ජාකර කොයියම්ලෙසකින්හෝ මේකාලයෙහි හටගත්මේ විවාදයසන්සිඳීමසඳහා යථාසබ්නාවයපහලකර පොතක්තනා මේනිසාකලකිරීමටපැමිණ වසත්නාවූන්ට ඇත්තඅගවාදී සිත්සැනසිමලබාදීම සුදුසුය. තවද, අමරපුරනිකායෙගණනායකාචාර්යවරුසහිතවැඩිනැත්සත්‍යවිභූෂණසියම්සමාගමකොරේ දෝෂදක්වාප්‍රකාශකල අම්නිර්ටාක්‍යසහිත ලියුම්සම්බන්ධ ක්‍රියාවටකිසිවෙක්එක්සන්ව සිටියෙවත් ඒදූනගෙනසිටියෙවත්නැතඑසේහෙයිදින්. සියම් සමාගමපක්ෂයෙන් මුළුඅමරපුරනිකායටම චෝදනාකලබව දුටුමුමේනිසා අමරපුරනිකායවෙනුවෙන් ප්‍රකාශකරන්නාවූපොතෙකින් මේහටගත්චංචලභාවසඳහා සියම්නිකායටදෝෂපහලකර පරුෂමිශ්‍රව සත්‍යවිභූෂණ විසඩුසුනාදදෙදෙනාහිසමාගීයටමපසුවක්‍රියාකිරීමඑලඹනොසිටියාවූ සිහිබුද්ධිඇත්තාවූන්ටප්‍රියවූගතසිමක්වතිබෙන්නෙව්නමුත්නැවතුනාඩබුද්ධි ඇති භික්ෂුනාවූන්ට රුචිනොවේ මක්නිසාද විසඩුසුනාදගේ ක්‍රියාවසියම්නිකායේ ප්‍රධානාචාර්යවරු පිළිගත්තඇතැයි සිතීමටවත් ඒක්‍රියාවට එකගව සිටින්ටඇතැයි සිතීමටවත් අවකාශනැතිනිසාය. ඒහෙයින් මේවාරයේ ඒදෝෂකීමට වනවානනොවී සබ්කීයනිකායෙහි ශුද්ධතාවය ප්‍රකාශකරසිටීම සුදුසුයයි සභාවෙහිසියල්ලවූන්ගේ එක්සත්සම්මුතියෙන් සළමතකරනන්ටයෙදුනුබැවින් මේසම්මුතියනොසිඳ 'ම්‍රම්මවංශවිනිශ්චය, නම්පොත ලෝකශාසනදෙකටකරුණාසිත්මුල්කොටගෙණකිරීමට පටන්ගත්තෙමි. මෙමපොතලංකාවාසිසෑම සත්පුරුෂයන්විසින් නැවතනැවත ඉනාම්

නෑ කම්ත්අහබලා පූර්වාපරවාක්‍ය එකිනෙකටවිමසා සාසන්දනයකොට මේ ජී කියනුලබණ කාරණයන්ගේ වැදගත්කම මැදහත්වබලා ඒත්තුගන්නා හැටියට අයදිමි—

බුරුමනිකායාදියට දූෂ්‍යකිරීම්වශයෙන් ගෙණහැරදක්වනලද කාරණා ඊබාරුඃවූ මිථ්‍යාවලින්ම උපදවනලදහෙයින් සත්‍යවූවැදගත්කාරණාගෙණහැරදක්වීමෙන් යථොක්තනිගමන්වල අසත්‍යතාවය සම්පූර්ණයෙන්ම පෙන්වාහිමිමටබලයතිබෙණබව පේණනැනාදීමගේසිතමහත්වූධෛර්‍යයකින් මේසඳහාකාරණා ලිමටඋත්සාහවත්ව පවත්නාබව මෙහිදීකියන්ටඕනෑවපෙණේ. සියම්සමාගමකෙරේහටගත් දොෂාරොපනඑළිකල මුල්නැනැත්තා තෝලන්ගමුවේ තෙරුන්නාන්සේනිසා ඔහුගේකියමන් තොපිහිටනුපිණිසඔහුටනැත්තාවූ චොදනාවක්උපදවනුකැමතිව, "තෝලන්ගමුවේඋන්නාන්සේ තමන්ආචාර්‍යවූ, යටත්වල, නායකඋන්නාන්සේගේ ඩබුවගයක් සොරකම්කොට අලුවී සමාගමෙන්ඇරියා ,, යයි කියනලද වචනය ඇදහියයුතු එකක්නොවේ. තෝලන්ගමුවේ තෙරුන්නාන්සේනම් සියම්සමාගමේ උපසම්පදාවලැබ ධර්මවිනයධර සමර්ථයෙකැයි ලෝකප්‍රසිද්ධවූ, ශික්ෂාකාමීගුණවත්කෙනෙකි. මේඋත්තමයා සියම්සමාගම අපිරිසිඳුය අමරපුරසමාගම ඉතාපිරිසිඳුයයි එළිදරව්වශයෙන්කියා පොත්පත් ප්‍රසිඩකර සියම්සමාගමේ මහණකම්න්තුරන්ව, කොරහගොඩ, කුරුවිට, බවූගෙදර, ආදිශ්‍රද්ධාවන්ත පරලොවවැඩසොයන දූත උගත් උන්නාන්සේලා බොහෝගණනක්හාසමග පාතරටටඅවුත්, බලපිටිමෝදර, උදකුඹුගෙබපසිමාවේදී, අඹගහපිටියේනායක ස්ථවිරයන්වහන්සේ උපාධ්‍යායව, තෝපාගොඩ ඥාණාලංකාර ශ්‍රීසුමන ස්ථවිරයන්වහන්සේනා, බෝගහපිටියේධම්මජෝති තෙරුන්වහන්සේද ප්‍රධානකොටඇති සංඝයාගෙන් මීටඅවුරුදු තිස්අටක, කාලයෙහිඅමරපුරසමාගමේ උපසම්පදාව පිළිගෙණ පළමුපැවතුනූ මැඩිමාල් ස්ථවිරභාවයසඳහා මාන්‍යනොකොට බාලවී තමන්ට උපසම්පදාවෙන් වැඩිස්ටියාවූ තරුණභික්ෂූන්ටපවාවඳිමින්, අමරපුරසමාගමට අනුගතික්‍රියාපැවැත්වීමට පටන්ගත්කාරණයනිසා මේතරම්දූනුමැති උගත් කෙණෙක් සියම්සමාගමකෙරේ කලකිරී එහිදොස්දක ඒ අශුද්ධයයිහැරදමා අමරපුරනිකාය පිරිසිඳුඋපසම්පදාවඇති ශුද්ධවූසමාගමයැයි පිළිගන්නා කාළ අපතුමක්කියමුදැයි අවශේෂඅයවලටත් අමරපුරසමාගම පිරිසිඳුය සියම් සමාගම දූෂ්‍යයයිසිතීමට හොඳටම අවකාශතිබීඃයාය. මේකාරණය දුටු විඃවසූනාද, තමන්ගේනිකායට පසම්තුරුව ක්‍රියාකළ මොහුට චොදනාවක්ඉපදවූවොත් ඒකදනාටබොරුකරන්ටත් නුපුළුවන. මේකාරණයසඹවූනායකයන කාලය දනාට අවුරුදු හතළිහකටත්වැඩිය චොදනාවකළ ගුරුන්නාන්සේසහිත චොදනාවලැබූ ගෝලයාත් නැසිනොද්දනාට අවුරුදු විසිගණනකටඇත. ඉන්නිසාමේකිම බොරුකිරීමටහැකිවන කිසින්

C

කාරණයක්නැත. යනමේආදිමුලාකල්පණවලට දසව තෝලන්ගමුවේ, තෙරුන්නාන්සේට මෙබඳුචෝදනාවක් ගොඩනැගුවාවෙන්වම්නැය. මේ චෝදනාව සිස්වූඅසත්‍යයක්බව, විඃශ්වසුභාදගේම පක්‍ෂයේ නමත්වැදගත් මිත්‍රයෙකුගේ, සන්දෙශ, යකින් මමමෙතිපෙන්වාසිටිමි—

“ සෙඩඛණ්ඩ සෙලනගරෙ හයගිරිවිහාරෙ ච පුප්ඵාරාමවිහාරෙ චාති වෙ විහාරා අත්‍ථි තෙසු උභයෙසු විහාරෙසු විවාදෙ උප්පජ්ජි, කථං, පුප්ඵාරාමවිහාරෙ භික්ඛු ඉතරානං විහාරාධිවාසිනං උපසම්පදා වජ්ජෙති ඉතරෙ විහාරෙ භික්ඛු ඉතරානං විහාරාධිවාසිනං භික්ඛූනං උපසම්පදා වජ්ජෙති. තතො හයගිරිවිහාරෙ උපසම්පන්නෙනා තොලංගමුවෙ ති නාමෙකො භික්ඛු තං උපසම්පදං පහාය පුප්ඵාරාමවිහාරං ආගන්ත්වා තස්මිං උපසම්පන්නෙනා හුත්වා උඩරට්ඨෙ සපරගාමමහාරට්ඨං ගන්ත්වා විහාසි. තතො හෙට්ඨාවුත්තඋභය විහාරාධිවාසිභික්ඛූ තං විවාදං ජහිත්වා සමග්ගා ජාතා ති සුත්වා තත්‍ථ උභින්නම්පි විහාරාධිවාසිනං භික්ඛූනං උපසම්පදාය දොසං වත්තුකාමතං ඤත්වා හෙට්ඨාරට්ඨවාසි බුරුමවංසිකා භික්ඛූ තං ගන්ත්වා තොලංගමුවෙ ති නාමෙන භික්ඛුනා සද්ධිං සාකච්ඡං කත්වා සච්චසං උපාලිවංසිකානං උපසම්පදාය දොසං සකලෙ සිංහලදීපෙ පකාසෙසුං ,,

මහනුවරහිවෙණ, “අස්ගිරිය, මල්වත්ත,” යන විහාරදෙකේහි උන්නාන්සේලාඅතුරෙහි විවාදයක් හටගත්තාඇත; ඒනම්, මල්වත්තෙවිහරේ උන්නාන්සේලා අස්ගිරිවිහාර පාර්ශ්වයේ උපසම්පදාවදොෂයසිකියාද, අස්ගිරිවිහාරේ උන්නාන්සේලා මල්වත්තෙවිහාරේ උන්නාන්සේලාගේ උපසම්පදාව දොෂයසිකියාද, යනමේ විවාදයයි. එකල්හි අස්ගිරිවිහාරයෙහි උපසම්පදාවලැබූ තෝලන්ගමුවේ යනනම්ඇති උන්නාන්සේනමක් ඒ උපසම්පදාවහැර; මල්වත්තෙවිහාරයටඅවුත් එහිදී උපසම්පදාවලබාගෙණ සපරගමුපලාතටපැමිණවසන කාලයෙහි ඉහතකීවිහාරදෙකේ උන්නාන්සේලා විවාදයහැරදමා සමගිවූවෝය. මේකාරණයඇසූ තෝලන්ගමුවේ උන්නාන්සේ ඒවිහාරදෙකේම උන්නාන්සේලාගේ උපසම්පදාවට දෝෂකියනු කැමතිබවදැනපාතරට අමරපුරසමාගමේ උන්නාන්සේලා සපරගමුවට

නොස් තෝලන්ගමුවේඋන්නාන්සේසමග සාකච්ඡාකොට, උපාලිවංශික සියම්භික්ෂූන්ගේ උපසම්පදාව දෝෂයයි මුළුලංකාවේපයෙහිප්‍රකාශකළාහුය

යතමෝවගන්තියසහිතලියුම් බෙන්තර වනවාසවිහාරයෙහිවිසූ සියම්සමාගමේ ප්‍රධානබහුශ්‍රැත ස්ථවිරකෙණෙක්වූ බෙන්තර අත්ථදස්සීතෙරුන්වහන්සේ නමන්නමින් සියම්දෙශයෙහි, පරමධම්මික, මහරජානන්වසහ ඤාණමහතෙරුන්වහන්සේලාටත් මිටඅවුරුදු විසිඅටකටපළමු පිටත්කරඇරියාඇත. ඒඅරිනලද ලියුමකින්පිටපතක් එහි මහතෙරුන්වහන්සේකෙණෙක් ලංකාවේ තෙරුන්වහන්සේකෙණෙකුට එවූයේය. එමපිටපතෙන් මේ වගන්තිය ලිව්මි–

තෝලන්ගමුවේ තෙරුන්වහන්සේ නමන්ගුරුන්නාන්සේගේ බඩුසොරකම්කොට අසුවූනායයනකීමසැබෑනම් තෝලන්ගමුවේ තෙරුන්නාන්සේ සියම්සමාගමට විරුද්ධකාරයන්ගේ ප්‍රධානියෙක්වසිටියනිසා සියම්සමාගමේ තෙරුන්නාන්සේලා මේසොරකම ඒකාලයෙහි එළිදරව්නොකොට වසාගණ්තැයි කිසිවෙකුටවත් සිතන්වනුපුළුවන. " තෝලන්ගමුවාය, කේලම්ගමුවාය " යයි උඩරටඋන්නාන්සේලා ක්‍රොධසහගතව ගඟීකළාමිස ඔබනුත් ඒකාලයෙහි කීසැටියක් නැසිමු. එපමණක්නොව මල්වත්තේවිහාරේ උපසම්පදාවදෝෂයයි වාදකිරීමට තෝලන්ගමුවේ උන්නාන්සේ එහිපැමිණෙනවායයි ගිව්සගත්කාලයෙහි මහනුවරටකැඳවා සියම්සමාගමපක්ෂයෙන් වාදයසඳහා උත්තරදීමේ ප්‍රධානත්වය බෙන්තර තෙරුන්වහන්සේට බාරකළනිසා මේසොරකමවූනාවූ එකක්නම් බෙන්තර තෙරුන්වහන්සේටත් ඒකඒකාලයෙහිවත් දැනගන්ටලැබෙණවා අනුමාණනෑ. එසේ දැනගත්තානම්; ඒකාරණයම ලියුම්වලනොලියා ඉහතකී ප්‍රකාර වෙනින්අමුතු කාරණයක් ලියාඇරීමට කිසිම ඕනෑකමක් නොපෙණේ. තෝලන්ගමුවේ තෙරුන්නාන්සේට, විසබසුහාද; ඉපදවූ චෝදනාවෙන් ඒතෙරුන්නාන්සේ මුදාළීමට මේලියුම සම්පූර්ණයෙන්මඇත. බෙන්තර තෙරුන්වහන්සේවැනි ශාස්ත්‍රාගමඥත් තික්මුනාවූ ලෝකප්‍රසිද්ධ සියම්සමාගමේ මහාස්ථවිරකෙණෙකුගේ මේලියුම් අසත්‍යයකැයි, විසබසුහෘද; කිව්වත්නමන්මිත්‍රයෝම ඒකිම නොඅදහත්. තෝලන්ගමුවේතෙරුන්නාන්සේට විරුද්ධව එකල්හි සියම්සමාගම පක්ෂයෙන් ප්‍රසිද්ධකළ ලියුම්සහිතපොත් බොහොමයක්තිබේ. එනෙත්, ඔයකියනසොරකම ඒ කිසිවකට නොපැණෙනබැවින්;මේවාරයේතැනුවකැසිසිහියහැකි. විසබසුහෘදගේ මිත්‍රයෙකුගේ ලියුමමඔහුටවිරුද්ධවතිබුනාට අපිකුමක්කරමුද ? " තං පවත්ති ම ජානනතා උපසමාපාදයුං නදු " යන්නෙන් තෝලන්ගමුවේ, තෙරුන්නාන්සේබඩුසොරකම්කරණවාඅසුවී සමාගමෙන්ඇරියැව් [illegible] වතුපක්ෂයේ තෙරුන්නාන්සේලානොදැන දෙවනුඋපසම්පදාකළෝයයි යනකීමද; අපටඅදහන්ටනුපුළුවන; මක්නිසාද, නුවරගමම අස්ගිරවිහාර

යේ මහනායක තෙරුන්නාන්සේගේ ගෝලයෙක්වන මේහරම් සමීපප්‍රසිද්ධකෙණෙක් සමාගමෙන්ඇරියානම්, ඒකාරණය එපමණසුළුපටුකාරණයක්නොවෙයි. ඇරත් සමාගමෙන්ඇරීමක් රහස්වශයෙන් කිසිකෙණෙක් නොකරණවකක් බැවින් දුරුරටවලත්වසන බොහෝසමූහයකට ප්‍රසිද්ධව එළිදරව්වියයුතු එකක්වතිබෙණතැන සැතැප්මකටවඩාදුරුනොවන මල්වතෙනවිහාරේවිසූ තෙරුන්නාන්සේලා ගම්කලබලානොදන උපසම්පදාකළෝයයි කීම සිහිඇත්තන්ට සාරවත්ව නොපැණෙ. අස්ගිරිමල්වතු, විහාරදෙකේ ඒකාලයේ මහණුන්නාන්සේලා සියක්නමක්පමණ සිටියෝය. මෙතෙක්සමූහයක් පිරිසවසන ස්ථානදෙකෙන් එක්ඉඩමකසිදුවූ බඩුකාරණයක් අනික්ඉඩමේකිසිවෙකුටවත් දැනගන්ට නොලැබූනාය, යනු මහත්පුදුමයකි; කිසිවෙක්දැනගෙණ සිටියානම් උපසම්පදාකිරීමත් එක්කෙණෙක් දෙදෙනෙක් විසින්නොව වැදගත් ප්‍රධාන බොහෝසමූහයක් රැස්ව ඉතාමප්‍රසිද්ධලෙස කරණකටයුත්තක්බැවින් මේකාරණයදැනගෙණ සිටියෙක් එයඑළිදරව්නොකොටඉන්නවා ඇතැයිසිතීම ඊටත්වඩා පුදුමයකටපේණවා. මේකල්පණාවලින් අන්තිමටපෙණියන්නේ මේ තෙරුන්නාන්සේකළායකිව්සොරකම කළාවූඑකක්නොවෙයි, අමුතුවෙන්මමේඅළුතසැදූ මුසාවාදයක්බවයි: එහෙත් තෝලන්ගමුවේ තෙරුන්නාන්සේ ජීවත්වසිටියදී මේචෝදනාව, විසවසුහාද; කිව්වානම් ඊටකියයුත්තකුත් එමතෙරුන්නාන්සේකියයිසිතමු. ඔහුජීවත්වඉඳදී තුෂ්ණීම්භූතවඉඳලා මේකාලයෙහි එගකීමටපටන්ගත්තැන කිසිවක්අපි කථානොකොටම ඇරිශයාත් ඒනුසුදුසුබැවින් මේඅමනොඥවාක්‍යසඳහා මෙපමණදුරට කාරණාළිමටයියෙමු. තෝලන්ගමුවේ තෙරුන්නාන්සේ ඔයසොරකම කළේ මල්වත්තේ විහාරයේදීයයි, විසවසුහාද, කිව්වානම් සැබෑකිරීම ඔයිටවඩා විකක්පාසුවටත්බූනා? මොනුගේශුද්ධාශුද්ධදෙකෙන්ම දැනටඑපමණමහත් ප්‍රයෝජනයක් නොපෙණෙයානමුත් විසවසුහාද, ගේ ක්‍රීම්වලතත්වය දැනගැන්මට මේකථාවිසාරකළඑක මහත්ප්‍රයෝජනයකි සිතමු—

තවද, තෝලන්ගමුවේ තෙරුන්නාන්සේගැණ මෙහිදී වැලටමකියාතිබෙණ සිස්වචනබෙලනු [illegible] බඩුසොරකම්කළායකියාද, සොරකම්කරණවා අසුවූනායකියාද, සමාගමෙන් ඇරියායකියාද, මල්වත්තටඑකතුවීමට උත්සාහකොටබැරිවූනායකියාද, මල්වත්තේවිහාරෙන්පැන්නුවායකියාද,

“ පබ්බොපසම්පදං යාචි ථෙරා තස්මිං විහාරකෙ
තාමපවත්ති මජානන්තා උපසම්පාදයුං තදා ,, යි

තෝලන්ගමුවේ උන්නාන්සේ මල්වත්තේ උපසම්පදාකළායයිතමන්ගේ කීමෙන් එම්කීමයිනතවතිබෙණ මෙසබලන්නවුන්ට කුමක්සිතේද !

තොලන්ගමුවේ තෙරුන්නාන්සේ ගැණ විශ්වසුහෘදගේ කීම සැබෑකිරීම පිණිස ඒ කරුණුදන්නෝ මහනුවර සතරකෝරළය ආදී බොහෝතැන්ව ලසිටිත්, ඇයි විශ්වසුහෘද, කියාතිබෙණ පමණමිස ඒඅදන්නා අයෙකුගේනාමක්හෝ දන්නාකෙනෙක් වසන ඉඩමක්හෝ නියමනොකොට අනියමයේ ඒක කියාතිබෙණනිසා කාටවත්ඒකීම අදහන්ට නුසුලුවන මේ කීම ඇත්තක්නම් ඔපමණබොහෝදෙනෙක් සිටිත්යයි කියනතැන අසවල්ඉඩමයයි එක්ඉඩමකවත් නොහොත් කෙණෙකුගේවත් නාමයක් සඳහන්කරන්ට නරකද? එසේ නමක් සඳහන්කළානම් ඔයිට වඩා කොහෙත්ම අපාසුවක් තමන්ටවත් රටටවත් ඇතිවෙන්ටබැරිය: මේ කීම බොරුවනිසා එසේ නමක් සඳහන්කළොත් අනේ අපි ඔබඳුක් නොදනිමුයයිඒ ඉඩමේ, ඉන්නෝකියති එපරිද්දෙන් නම් නියමනැතිව කීකල සතරකෝරළයේ ඉන්නෝ අපිපමණක්ද අපි ඒ කාරණය නොදනිතත් වෙනදන්නෝ සමහරවිට ඇතිවෙන්නට පිළිවන එසේ නැත්නම් මේ තරම්න් ප්‍රසිද්දකරද්දසි සතරකෝරලේ සැමදෙනාමත් එකිනෙකාට සිතන්ට පිළිවන, ඉතින් විශ්වසුහෘදගේ කීම බොරුළතේනෑ ඒ ගැණලියනලද ලියවිලිත්තිබෙන්නා" තී ටිකත් ඔයකියන චෝදනාව සමාණමයි, ලියවිල්ලක් තිබෙණවානම් අසවලාවිසින් අසවලාට ලියාඅරිණලද ලියවිල්ලායයිකියාහෝ මේ ලියවිල්ලේවගන්තියයි කියාහෝ නොකියා ඒ ගැණ ලියනලද ලියවිල්ලත් තිබෙන්නා කී ටිකත් මුසාවාදයයි නොකියන්ට යුතුකමක් නැතිහැටි පෙණෙන්නා;

දැන් තොලන්ගමුවේ තෙරුන්නාන්සේගේ වැදගත්කමටහා හික්මීමටත් කිසිත්පාඩුවක්නැත, නමුත් විශ්වසුහෘද, "කොරහගොඩ, තොලන්ගමුවේ— ආදී සියම්සමාගමෙන් අහක්කරතිබියාවූ දුස්සීලයෝ අමරපුරසමාගම පිළිගත්තෝයයි,, නිසරුවූඔප්පුකළනොහෙන කිසිකරුණක්නොමැති ප්‍රලාපරාශියක් දෙඩවාතිබෙණවාට අපිතුමක්කරමුද, එබඳු කථානැවැත්වීමට අපටශක්තියක් නැතිබැවින් ඒ කියමන්වලවිපාකය ඔහුමදකිනා පමණමුත් මෙකීතෙරවරුන් දුස්සීලකිරීම නොහැකිඑකක්යයි අපිඒකථාවමෙතෙකින් නැවතිමු.

සියම් සමාගමට විරුඩව තොලන්ගමුවේ තෙරුන්නාන්සේවිසින් සාදනලද පොත්පත්දැක බෙන්තරඅත්ථදස්සී තෙරුන්වහන්සේ විසින්ද, ඊට වෙනස්ව පොත් සාදනලදී, තොලන්ගමුවේ තෙරුන්නාන්සේ එකින් එකටම උත්තර ප්‍රත්‍යුත්තරවශයෙන් පොත්සාදමින්අවුත් අන්තිමවරට සෑදූ අත්ථාලංකාරදීපනිය: යන පොතට මේ වනතෙක් කිසිමඋත්තරයක් එළිදරවූනොකළබැවින්, තොලන්ගමුවේ තෙරුන්නාන්සේ විසින්කියනලදකීම් නිරුත්තරයයිබොහෝදෙනාකියති;

එම තෙරුන්නාන්සේ අවුරුදුගණනක් රොගාතුරවඉන්නාඅතර සමා
ණෙරවූවාසැබෑයි, එහෙත් අමරපුරසමාගමේ තෙරුන්නාන්සේලාගෙන්
දවස්පතා සිල්සමාදන්වෙමින් ඊටඇළුම්ව අමරපුරනිකායේ ගුණකියමින්
පරලොවවැඩී සිතිංයෙන් තුරන්නොකොට විසූවත්ඇර, සියම්සමාගම නු
රුස්සනඅප්‍රියකම අන්තිමකාලයදක්වා පැවතුනාය, මේ රොගාතුරඅවස්ථා
වෙහි සබරගමුවේ බලන්ගොඩ ආරාමයෙහිහා ගාල්ලේමිනුවන්ගොඩ පර
මානන්දවිහාරයෙහි අවුරුදු කීපයක්ද, තංගල්ලේ පලුතුඩුවේ ආරාමයෙහි
අවුරුදුගණනක්දවිසූවාඇත; මෙකී ගම්වල ඒතෙරුන්නාන්සේට උපසත්
කාර කලගිහිපැවිදි බොහෝදෙනෙකුට මේ කාරණාහොඳාකාර සිහිතිබෙ
ණුය තමුත් අමරපුරසමාගමේ උපසම්පදාවදොෂයයි මේ උන්නාන්සේ කි
යනලදබවක්නම්නැත. විනවසුභාදභාසමගඒ වචනයරහස්වශයෙන්කිව්
වාදනැද්දයනු අපටනියමකර කීමනුපුලුවන, ගම් තතුදන්නාවූබොහෝදෙ
නෙක් ජීවත්ව ඉඳදිම බොහෝදෙනෙකුට හරිආකාරසිහිතිබෙණ මේ කා
කාරණයත් අතික්අතටපෙරලා වෙනස්කර මේ තොරතුරක් කිසිත්
නොදන්නා අඥනයන් මුලාකිරීමම ප්‍රයොජනයකටසලකා විනවසුභාද,
යයන අභූතනාමයට වැසීසිටගණ මිථ්‍යා අසත්‍යබස්කියා අනුන්කෙලසි
මට නැමහිමොහු ධම්විනයදෙක්හි පාලිභාෂාවෙන් තිබෙණ ගැඹුරුසියුම්වූ
විනයනය පිළිබඳ කාරුණුසඳහා ඇතාක් සැබෑවක්එළිදරව්කරකියනු ලබ
නවාඇතැයි කාටනම්සිතේද? තෝලන්ගමුවේ තෙරුන්නාන්සේ විසින්
සියම්සමාගමට විරුඬවතනනලද පොත්පත් එළිදරව්ව තිබෙණනිසා අම
රපුරසමාගමට මහණකමනැතැයි සැදුපොතක්පතක් නොපෙන්වා මේ
කීමසැබෑකරන්ට නුපුළුවන. අමරපුරසමාගමේ තෝලන්ගමුවේ තෙරුන්
නාන්සේම පමණක්නොව සියම් අමරපුරසමාගම්දෙක්හිම බොහොමයක්ම
උන්නාන්සේලා බලවත්රෙගවලින් පීඩිතවූ කාලවලදීසාමණෙරවතබව
බොහෝදෙනා දන්නා කාරණයකි ඒ සාමණෙරවත්නොහ් ඒ ඒ සමාගම්
වලටමහණඋපසම්පදාවනැතැයි සැකකර එසේසාමණෙර වෙත්යයි නො
කියා මේ තෝලන්ගමුවේ තෙරුන්නාන්සේගේමසාමණෙරවීමසඳහාඅමර
පුරසමාගමට සැකකර එසේකලායයි කීමටතිබෙණ යුතුකම විනවසුභාදට
කීමනුපුළුවනි උපසම්පදාවනැතිසමාගමේ සාමණෙරකමලබා තෝලන්ග
මුවේ උන්නාන්සේ කුමටසිටිදැයි ඔයකාරුණුකියනකල විනවසුභාදට නො
සැලකුණුබවපැහෙන්නා.

තෝලන්ගමුවේ තෙරුන්නාන්සේ පොත්බලනකල ඒපොත්වලලියන්
නෝ වරද්දතිබෙණඅකුරු නිවරදිලෙස ලියනසිරිතක්තිබීගියාය, මේප්‍රකා
ර ඒ තෙරුන්නාන්සේවිසින් පාවිච්චිකලපොත් විනවසුභාදලාට ලැබූනා
ය; එම්පොත් සියම් බුරුමරටවලලියනලද පොත්හාද සමකරබලා ඒපොත්
වල තෝලන්ගමුවේ තෙරුන්නාන්සේගේ ප්‍රමාදයෙන්ලියා තිබෙණ ඉඩම්
කීපයක්මනත්උත්සාහයෙන් සොයාගෙණ මේ තෙරුන්නාන්සේට අවඥ

කරතිබෙණබවදුටිමු, මේ කළඅවඥාව පණ්ඩිතගෝචරනොවේ, ඒපොත්ශුද්ධ කරලියාතිබෙන්නේ අන්‍යදෙශවල ලියුපොත්සහිත පොත්හතඅටක්වත්බ ලාගෙණයයි අපිනොකියමු, මෙබඳුක්‍රියාවලදිනොවරදින්නෙක් දූනටවලෝ කයේ මිනිසුන් අතුරෙහි දුර්ලභයයනු අපිසේමවිසවසුහාදයන් දන්නාති සානෝලත්ගමුවේ තෙරුන්නාන්සේට මේ කළ ගර්හාවෙන් ඔහු නිදහස් කිරීමවටි.

බෙන්තර ඍව්විරයන්වහන්සේ විසින් සියම් දෙශයට යවනලදසන්දෙශයක සියම්සමාගමට උපසම්පදාව නැතිබව ප්‍රකාශකළේ නැතැයිකී විසවසුහාදයන්ගේ වචනය ඇසුවන්ට බලාගැණීම පිණිසබෙන්තරතෙරුන්වහන්සේගේ සන්දෙශයෙහි ගාථාතුනක් මෙහි බහාලමි.

☞ “ උපසම්පදත්ථ නිස්සාය උප්‍යන්නවාදපච්චයා
බහවො භික්ඛවොකංඛා සලලවිධාවසන්තිහි
තස්මා භදන්තා රාමඤ්ඤ දෙසෙදානි පවත්තිතං
උපසම්පදං පරික්ඛිත්වා නිකායා වෙ වසන්තිචෙ
තතො කල්‍යාණිනාමස්මා නිකායා අතිරෙකකං
දසවග්ගං භික්ඛුසංඝං පෙසෙන්තු සීහලං ඉමං ,, යි

උපසම්පදාවනිසා උපන් වාදහෙතුකොටගෙණ සැකනැමති නෝමරයෙන් විදිනලද්දාවූ මාංසයකොරෙත්, ඒ නිසා ස්වාමීන්වහන්සේලා රාමඤ්ඤ දෙශයෙහි දූනට පවත්නා උපසම්පදාවසොයාඑහි නිකායදෙකක් වෙනෙන් නම් ඒ දෙකඅතුරෙන් කල්‍යාණි නිකායකෙරෙන් දශනමකාවඩා තෙරුන්නාන්සේලා මේ සිංහලවිපයට පිටත්කළමැණවැයි යනමේ අභිප්‍රාය ඇති ගාථාසහිත සන්දෙශය බෙන්තර ඍව්විරයන්වහන්සේ සියමටඇරියා ඇති, මෙහි උපසම්පදාව හෙතුකොටගෙණ උන්නාන්සේලා සැකනැමති නෝමරයෙන්විදී පීඩාවිඳින්නෝය කී එකෙන් උපසම්පදාව සඳහා කුමක් වැටගිතිබුනාද යනු තෙරුන්ගැණීම අපනසුනෑ සියම් සමාගමේ මුල්ගුරුවරයන් වසනසියම් මහානිකායෙන් සංඝයානොඉල්වූ කාරණයෙනුත් “ඉතා පිරිසිඳු සියම් මහානිකායයඒතරම්පිරිසිඳු ශුද්ධසමාගමක් වෙන ලෝකයෙහි ඇත්තේමනැතැ, යි විසවසුහාද නොයෙක්පරිද්දෙන් වර්ණනා කළ සියම් මහානිකායදුෂ්‍යවූඑකක්බවබහුශ්‍රැතබෙන්තර ඍව්විරයන්වහන්සේට වැටහීතුබූ හැටින්හැගෙණවායයිකිව්වාට කිසිවරදක්නැ, “රාමඤ්ඤ දෙශයෙහි දූනටවසනභික්ෂූහු අලජ්ජීපාපධූසීලයෝය: ගෙණපතයක්වැදී කරට්කඩාහියාය, ධම්චෙතියරජ්ජුකාලයෙහි රාමඤ්ඤරට උපසම්පදාවටසැක කළානම් දූනටකියනුම කවරේදැයි,, කියාද විසවසුහාද කියාතිබෙණ දූති පරුෂකියමන් එකක්වත් දක්නැබෙන්තර මහා ඍව්විරයානන් සහිත තා

ඔත් මිත්‍රයොන් නොදනනීවියෝයයනු රම්ඤඤදෙශයෙහි සංඝයා එවන්ට යයි ඉල්වාඇරියකාරණයෙන් හැඟෙණනිසා විජවසුභාදගේ යථොක්තකීම ඉතා අළුතතැනු මුසාවාදයකැයි කියමි,

## පස්වෙනි,,

“ තුන්වන ධර්මසංගායනාව කාලයෙහි රටින්පිටකළ සැටදහසක් භික්ෂූන් අතුරෙන් කොටසක් බුරුමරම්ඤඤරටවලට ඇදී බුදුන්ගේබණ නැ රක්කළාය,, යන විජවසුභාදගේ කීම කිසිමපොතක් පතකින් පෙන්විය නොහැකිකීමකි, තුන්වනධර්මසංගායනාවකලෙවිජවසුභාදගේකාලයටඅවිරුදු දෙදහස්ගණනකටපළමු පැළඵප්නුවරදීයි, මෙපමණකාලයකටපූර්වපැළඵප්නුවරදී සිඩවූසංගායනාවකාලයෙහි ඒ නුවරින් පිටකළ වෛතුල්‍යවාදීනු බුරුමරටටගියෝයයන්න විජවසුභාදදැනගත්තේ කෙසේදැයි සෙවීමවටි. ලංකාවකෙරෙන් සැතැප්මදහසකටවඩාඈත මුහුදින්එතර තිබෙණපැළඵප්නුවරින් ඉහතකීකාලයෙහි නික්මගිය වෛතුල්‍යයෝ ඉනුත්ඈතතිබෙණබුරුමරටට ගියොයයි දැනටමෙලක්දිවවසනමොනු පෙරකල්දන්නානුවනකුත්නැතිව දැනගත්තේකොයිලෙසකින්ද, මෙ තැනත්තා අපිදන්නා හැටියටපැළඵප්නුවරටවත් බුරුමරටටවත් ගියේ පමණවත් නැතැයිකියහැකි·

තුන්වනධර්මසංගායනාව ප්‍රකාශකර තිබෙණ—සමන්තපාසාදිකා—අට්ඨවාවේවත්; එහිටීකාවකවත්, නොහොත් වෙනයම්ප්‍රකරණයකවත් මේකීම් පෙණිනැතිකළ මොනුටමේකදැනගැණීමට පුළුවන්කමක්නම් ඇත්තේම නැතැයි කීමවටී—කටට ආපණව මේ ප්‍රලාපය ඔහුවිසින් කියනලද්දැයි නිශ්චයකර දැනට ඒ කීම මිථ්‍යාමයයි හැරදැම්ම සුදුසුවපෙණේ.

තවත් කියාතිබෙත්තේ “ පෙරසංගායනාකාලයෙහි පැළඵප්නුවරින් පිටකළඅය ගංගානම්ගඟින් එතරව දකුණුගොඩටගියාම බුරුමයලඟනිසා එහිගොස් බෝවීතිටලා ලංකාවෙන් අළුතගිය ඇත්තන්ට ගුරුවූනාය,, නියන එකකි, මේ කීමේ අසත්‍යතාව පෙන්වීම ඉතාපාසුයි·එනම් පැළඵප්නුවර, හෙවත් පට්නා, වේසිටගංගානම්ගඟෙන්එතරවගියාමඋතුරුදිශාවේගොඩමවුත් දකුණුදිශාවක් නොලැබේ පැළඵප්නුවරකෙරෙන් උතුරුදිශාවේ ගංගානදියතිබේ, ඉන්නිසා පැළඵප්නුවරසිට ගංගානම් ගඟෙන් එතරවන්නොක් දකුණුගොඩටයාම නුපුළුවන්එකකි පැළළුප්නුවරකෙරෙන් දකුණට තිබෙන්නේ; දිනපූර, ඉනුත් දකුණට ක්‍රමයෙන්, බාහාර්, හසරිබා, යනමේ ආදිනුවරවල්ය· ඉන්නිසා පැළළුප්නුවරසිට දකුණුදිශාවට යන්වයන්ට බුරුමරටදුරුවෙනවාය බුරුමරටට යන්ටනම්, පැළළුප්නුවරසිට නැගෙණහිරදිශාවට බන්ගාල්පූර, මුසුදාබාත්, ඩකා, සිල්නැල්ට්, මුනිපූර, චව්වීනම, යනමේ රටවල්පසුකර අමරපූරයදක්වා සැතැප්මපන්

සියහැටක් පමණදුරුවූ සාපුගමත්මාගීයවේ. පූර්විදිශාවයයි ව්‍යවහාරවූරට වල්සටහන්කළාවූ සිතියමක්ගරගෙණ බලත්තොතුට මෙකී කරුණුපැහැදිලිවපෙණේ— ගංගානාම්ගඟින් දකුණුගොඩට එනරටබූරුමරටව ගියාය කිව්වාම ගංගානම්ගඟ තිබෙන්නේ කොයිටද, පැලඹෙජ්නු වරණකොයිදිශාවේද, බූරුමරට කොයිදිශාවේදැයි දන්නොක්වත්සොයන්නොක්වත්නැත. යන්කල්පනාවෙන් මෙසේකිව්වාවෙන්ටඇති, මේඅසා පාඨශාලාවල ඉගෙණනත්තා ළදරුවන්විසින් පරදේශසිතියම් බලමින් රත්වූගැසීප්‍රශංසා වෙනුවට කරණලදකෙළිකවටකම්සහිත ජයඝොෂාව අසන්ටලැබෙයිසිතමු. තවද, ගොඨාභයරජානන්කාලයෙහි පිටකළඅය ලංකාවෙන්පිටව්දෙමළරටටගොඩනැගී දිගටමගියාම, බූරුමයටගොඩින්මයාහැකිනිසා එහිගොස් පළමුගියඅයවලටම එකතුවූනායයි" ද කිව්වේ පොත්පත්බලා පූරුදුමදිකම්න්වියයුතුයි. ගොඨාභයමහරජානන් ලක්දිවින්පිටකළ වෛතුල්‍යවාදීහු, සොළිරට, මයිසූර් නම්පලාතේ, කාවේරිපට්ටනමේ, විසූවෝයයි පොත්වලහිතබෙණසැටි වෙහිපලමුවෙනිභාගයෙහිද, කියාඇති. විශ්වසූහාද, ගේ මේසිස්වූකියමන්සඳහා පොත්පත්වල ඉහතදක්වූප්‍රකාර පැහැදිලිකාරණාසඳහන්ව නොතිබුනානම් ඒකියමනුත් සාරවත්යයි ඇඩූනිකයෝ විශ්වසූහාද පසුපස්සේ ගමන්ගනිත්, නමුත්, අවාශනාවක් මෙන් පොත්පත්වලසඳහන්ව තිබෙණකාරණා ඊටවෙනස්ව අනිත්අතට පෙරළි ලියවී තිබෙන්නා —

තවද, ගොඨාභය මහරජානන්ගේකාලයෙහි ලක්දිවින්, සොළිරටටපිටිටන්කළ සැටයක්පමණවෛතුල්‍යවාදීන් අතුරෙන්දෙදෙනෙක්, බූරුම රටටගියබව ප්‍රකාශකරණුපිණිස විශ්වසූහාද, කියන්නේ " සිංහලද්වීපයෙන් සිරිසද්ධම්මාලංකාර, තෙරය සිංහලමහාසාමි, තෙරය යනතෙරදෙනමක් සර්වඥධාතුන්වහන්සේලා පස්නමක්ගෙන්ගෙණ, බූරුමදේශයටගියබව ඒ රටේම්පොතේතිබෙණවාය. මේදෙනමකිසිවකුගේ කැඳවීමකුත්නැතිව එහිගියනිසා ලක්දිවින්පිටකළ දුස්සීලයන්අතුරෙන්ම දෙදෙනෙක්යයිනොසිතෙන්නේකාවදැයි" කියයි. මෙකීදෙනම වෛතුල්‍යකදුස්සීලයන්ගෙන්ම දෙදෙනෙකැයි විශ්වසූහාද, නිශ්චයකරණනිසා මේදෙදෙනා; බූරුමරටටගියකාලය අපිබලමු-

> " කලියුගෙ එකනවුතාධිකෙ සහස්ස වස්ස සතෙ සම්පත්
> තෙ ලංකාදීපතො සිරිසද්ධම්මාලංකාර ථෙරො සිහළම
> හාසාමි ථෙරො චාති ද්වෙ ථෙරා පඤ්චසරීරධාතු
> යො ආනෙසුං ,,

යන්නෙන් ඒදෙනම කලියුගවර්ෂයෙන් සත්සියඅනූඑකේදී ලංකාද්වීපයෙන්

බුරුමරටටගියාටම පොත්කිංජෙණගණනායි. බුරුමරටපවත්නා මේකැබලි කළියුගවර්ෂයේගණනනැවියා මේදෙනාමලංකාවෙන්ගියබවපෙණෙන්නේබු ද්ධවර්ෂයෙන් එක්දහස්හාරසියතිස්තුනේදීයි. ගොඩාභයරාජ්‍යයට පැමිණී යේ බුද්ධවර්ෂයෙන් සත්සියඅසූතුනේදීයි. මේක්‍රමයට, ගොඩාභයගේ රජවීම ට අවුරුදුනසියපණහකටපසු ලංකාවෙන් බුරුමරටටගිය මහාස්ථවිරදෙනා ම, ගොඩාභයරජ්ජුරුවන්විසින් ලක්දිවින්පිටකළ දුස්සීලයෝමයයි කිය මකළඑක මේලෝකේවෙන්නටනුපුළුවන් අසත්‍යයක්බව දැනට හොඳකා රපෙණීයාමෙන්, බුරුමදෙශයෙහි ශුද්ධතාවයසඳහා අනුමාණකළයුත්තක් නොපෙණෙනනමුත් සුසීලස්ථවිරදෙනමකට දුස්සීලයෝමයයි, කියමින් ගර්හාකළ විශ්වසුහෘද, දෝෂයෙන්නොමිදෙන, ඒගැණනැවියයුතුය්—

තවත්, " මේදෙදෙනාම කිසිවෙකුගේ කැඳවීමක්නැතිව බුරුමරටට ගියනිසා දුස්සීලයන්ගෙන් දෙදෙනෙක්බව " විශ්වසුහෘද, කියා තිබෙණ වාචිනා-

" කළියුගෙ නවුතාධිකෙ අට්ඨවස්සසතෙ සම්පත්තෙ ම
හාපරක්කමො නාමථෙරෙ සිහලදීපං ගතො ,, යි.

මහාප්‍රාක්‍රමනම්, බුරුමරට ස්ථවිරකෙණෙක් ලක්දිවටආසැවිද,

" සිහලදීපෙ කිර විජයවාසිනගරෙ නිසින්නො එකො
භික්ඛු උපචාරවතිනගරං ගන්ත්වා පරියත්තිං උග්ග
ණ්හි, තතො, පච්ඡා සුධම්මපුරං ගන්ත්වා පරියත්
තිං උග්ගණ්හි ,, යි,

ලක්දිව එක්තරභික්ෂුනමක් අන්‍යදෙශවලට ගියසැවිද,

" සිහලදීපතො ච ධාතුයො ආනෙත්වා එකො ථෙරො
ආගංඡි ,, යි.

ලක්දිවින් සියම්රටට එක්ස්ථවිරකෙණෙක් ගියසැවිදැයි මේආදීබොහෝ තොරතුරැත් ලක්දිවින් අන්‍යදෙශවලටත් අන්‍යදෙශවලින් ලක්දිවටත්, කිසිවෙකුගේ කැඳවීමක්නැතිව අනන්තවාරවලගියබව පෙණෙනිසා ඒතොරුත්නාත්සේලා සියළුදෙනාත් දුස්සීලයෝයයි, විශ්වසුහෘද; නො කියා නොකැඳවානියවරදට මේදෙනමපමණක් දුස්සීලයෝයයිකියන්නේ කුමක්නිසාදැයි ඇතිමවචි. මේප්‍රලාපකීසමන්සඳහා යම්යම්කරුණු දීසිවශ යෙන්කීම ප්‍රයෝජනවත්වනොපෙණෙනනමුත් නුවනම්දලෝකයා මේ

කියන්නේඇත්තයයිඅදහා රැවටීනොමගයන්ටසිතද්දෙ! යනසැකයෙන් මේවා ලියමු—

මෙහිඉහතකීදෙනම වැඩිපිරිසක්නැතිව ගියහෙයිනුත් ශාසනාදියුනු වක්සඳහාගියෝයයි සිතන්ටනුපුළුවන, මහාවිහාරපරම්පරාවේ තෙරුනුනම් ඔයලෙසනොයන්කියාත්, විසවසුහාද; ගේ රචනාවකි. දැන්මමෙහිදක්වූවා රතුනෙහිම වැඩිපිරිසක්නැතිව තනිතනිවමගියආසැටි පෙණුනුබැවින් මොනුගේ ඒ කීමෙහිත් නිසාරතාවය එයින්මදතහැකිවේ— ගුණවතායන්ට දොෂාරූඪකිරීමපිණිස මෙසාක්ෂියමෙසාක්ෂියයි නානාප්‍රකාර මිථ්‍යාබස්පලකිරීමෙන් " දුෂ්ටොනයදොෂෙ රතිම් ,, යනපණ්ඩිතවාක්‍යය ලෙසට මොහුගේතාත්වය තමාම උගත්ලෝකයාට ප්‍රකාශකරණ පමණමුත් තමන්අභිමතවූ මනොරථය නොපිරේ—

නැවතත්, විසවසුහාද, කියාතිබෙන්නේනම්—

" පඨමසංගීති කාලෙබහිකතෙහි පාපභික්ඛූහි සද්ධිං මනෙත්වා සහායං ගවෙසෙත්වා මහාසංගීතිවොහාරෙන මහාථෙරා විය සංගීතිං අකංසු කත්වා ච විසුං ගණං අගෙසුං — පෙ — තෙ පාවචනං යථාභූතං අජානිත්වා සද්දජායාමත්තෙන යථාභූතං අත්ථං නාසිංසු — පෙ — ධම්මවිනයම්පි කොපෙත්වා යථිච්ඡිතවසෙන විචරිංසු, අයං පඨමමහාසංගීතිනාමෙ කො අධම්මවාදිගණො තතො පච්ඡා කාලෙ අතික්කන්තෙ තතො යෙව අඤ්ඤමඤ්ඤවාදතො භින්දිත්වා — පෙ — සත්තරසවිධා අගෙසුං ,, යනපාඨයි.

දෙවන සංගායනාවකළාවූ ධර්මවාදී මහතෙරුන් වහන්සේලා ගෙන් වෙන්වසිටියාවූ මධ්‍යදෙශයෙහිම අධර්මවාදී අලජ්ජී පාපපක්ෂ මොහු සත ලොසකි. මෙයින්එකකෙණෙකුදු බුරුමරටසිටි බවක්කියානැ' මින්මතුත් විසවසුහාද, කියාතිබෙන්නේ, " මෙකීතුදුස්කොටසෙන් එක්කොටසක්වූ, ධම්මගුත්තිකයෝ, නොහොත්, සමණගුත්තිකයෝ, බුරුමරට විජයපුරයෙහි බෝවිසිටියෝ ,, යයනුයි. ධම්මගුත්තික, සමණගුත්තක, දෙපක්ෂයඑක් පක්ෂයක් කිරීමටගිය ඒ අපරාධයනිසා ඊටවිපාකයක් වශයෙන්දෙ, සත ලොසත් ඉඩකිමතුදුසවෙලා තිබෙණබව පෙණෙන්නා: ඒකොසිහැටිවූනාත් කාලාශොකරජ්ජකාලයෙහි මධ්‍යදෙශයේවිසූ ධම්මගුත්තිකයන්ද, ඊට අවුරුදු එක්දහස්පන්සිය දහතුනකටපසු, බුරුමරටඑක්පලාතක එක්තරාවී

කකාලයක ඇතිවසිටිය සමණකුත්තකයන්ද, යනදෙපක්ෂය එක්වර්ගීයක් කිරීමම නොහැකියි. සමණකුත්තකයෝ තමන්ගේනම ශ්‍රාවකයෝයයි, ප්‍රතිඥාකළපමණමිස තමන්, සමණකුත්තකයෝයයි; කීහැටියක්නැ. නිගමවශයෙන් බුද්ධශ්‍රාවකයන්විසින් ඔවුන්ට ශ්‍රමණබල්ලෝයනඅභිඅැති,සමණකුත්තක, නමව්‍යවහාරකරතිබේ, ධම්මකුත්තික, යනනාමය මධ්‍යදෙශයෙහි වීසූඩන්ට ඔවුන්මනිගමකරගෙණ ව්‍යවහාරකරගත්එකකි. ඇරත්, සමණකුත්තක:'යන්ගේකථාව විස්තරවශයෙන් දක්වාතිබෙණපොත්හි, ධම්මකුත්තිකයන්ගේ පක්ෂයබවක් සඳහන්කරනැතිබැවින; විසම්සූහාද, ට මෙගැණඑල්වීමට ඉඩමක්නොලැබ වැටියනාවට පෙණේ. අනුරුද්ධරජ, මෙසමණකුත්තකයන්ට සුදුවස්ත්‍ර අඳවා ආයුධාදි සේවායන්කොට රාජකාර්‍යයෙහි යෙදවූබවත් තෙරුන්වහන්සේ ශාසනයෙහි ප්‍රශංසනාවූවත් පැවිදිඋපසම්පදාකොට ශාසනයශුද්ධකළසැටිත් පෙණීතිබෙණහෙයින් එනිබුද්ධශාසනයේ නියමවූපරම්පරාවට ඒනිසා සම්ප්‍රදායයක් මිශ්‍රභාවයක් වීමට හේතුනොපැණේ—

නැවතත්, විසම්සූහාද, කියන්නේ, “ බුරුමරටරතනාපුර රජකාලයෙහි අලජ්ජීලජ්ජීභික්ෂූන්ගෙන් මිශ්‍රවතිබූණබවත් අලජ්ජීහු තමන්ගේ ආචාර්‍යප්‍රවේනිවශයෙන් හැසුරුණබවත් ,, යනමේකරුණුයි. මේලඟට අපවිසින් මෙසඳහාකියයුතු කථාප්‍රකාශවේ. මේකාලයෙහි අලජ්ජීභික්ෂූන්ගෙන් මිශ්‍රවතිබූණායයිකීඑකේ අභිප්‍රාය එසේනොවේ, මෙහිකීඅලජ්ජී යථොක්ත සමණකුත්තකයෝනොවෙත්,

“ රතනාපූරනගරසම්භිදස්සූපලෙසු, රාජවංසෙසු පච්ජිමා පචරාජනො අවිච්ඡින්නායෙව අලජ්ජීලජ්ජීමිස්සකවසෙන සාසනං පග්ගණ්හිංසු ,,

කියාප්‍රකරණයේපේණහැටියට රජහුපස්දෙනෙක් ලජ්ජීඅලජ්ජී දෙපක්ෂය නොසොයාම මිශ්‍රවශයෙන් ශාසනයට කටයුතුවතිබෙණසංග්‍රහකළාහුයයි කිව්වාම, රජවිසින්කරණලද සංග්‍රහයක් දෙපක්ෂයටම තේරීමක් නැතිව කළබව හැඟෙනුමිස ලජ්ජීඅලජ්ජී මිශ්‍රව උපසම්පදාකළබවක්වත්අනිකුත් සීමාබන්ධනාදී කුඩාමහත් විනයකර්මයක්වත් කළබවක්කියනොහැකි කල එයින්ශාසනයටවූ හානියකුමක්ද? සංඝයාවිසින් කටයුතුවතිබෙණක්‍රියාවක් වෙන්වශයෙන් මිශ්‍රකමක්නැතිවකළාම දෙපක්ෂය මිශ්‍රවපැවතුනායයි කියන්ටනුපුළුවනි මේදෙපක්ෂය වෙන්ව තමතමන්ගේ උපසම්පදාවංශ පරම්පරාව පැවැත්වූබව හැඟියනපාඨඑනිමපෙණේ–

“ එවම්පි ලජ්ජිනො අත්තනො අත්තනො වංසානුරක්ඛණවසෙන ධම්මංපූරෙන්තං අනිවාරිතත්තා ලජ්ජීගණවං

සො නහිජ්ජන්ති, තථා අලජ්ජිනො පි අත්තනො
අත්තනො ආචරියපවෙණිවසෙන විචරිංසූ ,,

රජනු සෙවීමක්නැතිව සංග්‍රහකරන්නාහු නමුත් ලජ්ජීනට තම්තමන්ගේ පරම්පරාව හෙවත්, නිකාය රැකගැණීම්වසයෙන් ආගමධර්‍මයපිරීමට තාහනමක් නොකලබැවින් ලජ්ජීන්ගේසමාගමේ පරම්පරාව හෙදනොව එහිපවති, ලජ්ජීහු තමන්ගේනිකාය ශුඬවශයෙන් මිශ්‍රභාවයකට්යානොදී රැකගෙණ ආගමධර්‍මය පිරූබව මෙහි ප්‍රකාශවූහෙයින් ලජ්ජීනිකායට යම් කිසිවිපත්තියක් නූවූබව පැහැදිලියි-එසේම අලජ්ජීහුද තමතමන්ගේ ආචාර්‍ය්‍යපරම්පරාවශයෙන් හැසුරුනාහුය· යන්නෙනුත් අලජ්ජීහුද තම තමන්ගේ පරම්පරාවශයෙන් වෙන්වවිසූබව සිතමු, මෙහිකියාතිබෙණ අලජ්ජීභාවය නම් උපසම්පන්න භික්ෂූන්ගේ පිළිපැදීමක් සඳහානොවෙයි· සාමණේරයන්ට ගම්වැදීමෙහිදී දෙවීරවසාගැටවවූකිරීම ප්‍රයෝජන නැත එකමඅංශයක් වසාපෙරවිය පමණකින් ගමටයාම්සුදුසුයයි අතුලනම් සථවිරකෙනෙක් තිකලසෙස්සන්විසින් එසේනොවටි කියද්දිත් පිළිනොගෙණ මුලකිලෙසම කරවූනිසාම අලජ්ජීයයිකීබවමුත් වෙනායම් භික්ෂූන්පිළිබඳවූ කුඩාමහත් දෙෂයක් සලකානොවෙයි-මෙසේ සාමණේරයන්ගේ සිවුරුපෙරවීම විනයෙහිවත වරදවා කරවූඒපමණකට දෙපක්ෂයක්ව වසන උත්නාක්සේලාට රජනු තෝරන්නේ නැතිව, සංග්‍රහකළාම බුරුමරට සමාගමට ඔයින්වූ පලිදුවකුමක්දැයි දුන්බොහෝදෙනාට වැටහියෙයි—මේ ප්‍රයෝජනයකට නැතිදෙෂ බුරුමනිකායට කියනනිසා එම බුරුමනිකායට ගතයුතුවූ කිසිපලිදුවක් දෙෂයක්කියන්ටනැතිකමින් මේකියන දෙෂවල තරම්යයි බුරුමනිකායෙහි පවිත්‍රභාවය මෙයින් නුවණැත්තන්ටහොඳින්ම වැටහීයයි අපිසිතමු,

මින්දුරටත්, විෂවිසුභාද කියාතිබෙන්නේ-"අලජ්ජීගණවංශයනොසිඳී,,ම මේවනතුරු පවත්නාබවත් මේ දැක්වූපාඨයෙන් ප්‍රකාශිත,, යයි කියාය ඒ පාඨයෙන් එබඳුඅදහසක් කිසිලෙසකින්වත් ප්‍රකාශවෙන්නේමනැ අලජ්ජීපරම්පරාව ඒ කාලයෙහි නොසිඳි පැවතුනුබව එයින් ප්‍රකාශිතයි—එපමණට මේ කාලයවනතුරු කිසිත අමුතුවෙන් අත්තම්මින් දමාලා වරදවා කියාතිබෙණ සැටිනම් නොවටී—සාමණේරයන්ගේ ගමටයාමෙහිදී අංශදෙකවසා සිවුරුපෙරවායාම වැලැක්වූපක්ෂය සඳහා අන්තිමටකියා තිබෙන්නේ නිවරදිපක්ෂයේනිම පිළිගෙණ ඊටම එකඟවූබවයි;

"අම්හාකං චාරිත්තං පාළිආදිසු න දිට්ඨපුබ්බං අථඛො පන ආචරිය පවෙණිවසෙන ච චරිම්හාති වත්වා පරාජයම්පත්වා පාරුපනපක්ඛෙයෙව පවිසිංසූති,,—

යනමෙයින් ප්‍රකාශිතයි-

''රාජා ච ඉතොපට්ඨාය භික්ඛු පාරුපන වත්තමෙව සා
රාපෙතුං සාමණෙරානං ඔවදන්තූති රාජානං ඨපෙසි,,—

රජද, මෙතැන්පටන් භික්ෂූන්ගේ පෙරවීම්වතම කරවන්ට සාමණෙරයන්ට අවවාදකෙරෙත්වයි රජඅණ පිහිටුවූයේයයි මෙසේ ඒ කාලයෙහිම ඒ එවාදය සංඝයා ධම්මවාදිපක්‍ෂයෙහි ස්ම සියලුදෙනම පිළිපදිනා පරිද්දෙන් නියමකරතිබියදී මේ වනතුරම අලජ්ජීන්ගේ පරම්පරාව නොසිඳී පවතිනවායයි කීම තබා සිතීමත් මුසාවාදීන්ගේ කල්පනාවක්වූ බලවත් අපරාධයකි—ඕලන්දක්කාරයන්ගේ,නොහොත් වික්‍රමසිංහරජතුගේආන්ඩුව ලක්දිවතිබී ඒ බලයසුන්කර ඉංග්‍රීසිආන්ඩුව යටතට රටබාරගෙණ එතැන්පටන් ඉංග්‍රීසිආන්ඩුව පවතිනවායයි කිව්වාම ඕලන්දආන්ඩුව, නොහොත් වික්‍රමසිංහරජතුගේ ආන්ඩුව මෙවනතුර නොසිඳී පවතිනවායයි යමෙක්කියාතාම් ඒ කීම ප්‍රලාපයක්මයයි හැරදමනුම්ස මදවත්සිහිනුවන ඇති කවරෙක්නම් සාරයයිගන්නේද?—නොගන්නේමැයි—

මේ ලඟටත්, විසුඩසුභාදගේකීමක්නම්, ''ධම්මචෙතිය රජකාලයෙහි රාමඤ්ඤ'' ''; රටේ හයකොටසක් දුශ්ශීල පාපභික්ෂූන් තිබ්බනාබව කියාතිබේ; එයින් සමහරු ස හ බුරුමෙන් සමහරු ධම්මචෙතිය රජවිසින් කරවන ලද ශාසනශුද්ධියට ඇතුලත්නූනබව පෙනෙයි ,,—කියාය ධම්මචෙතිය රජුකාලයෙහි, හයකොටසක්නබා එකකොටසක්වත්දුශ්ශීලපාපයන් සිටිය බවක් පොත්පත්වල කිසිම තැනක කියානැතිනිසා, විසුඩසුභාදගේ මේ කීමත් මිථ්‍යායයිහැර දමමු—කල්‍යාණීප්‍රකරණ යෙහිහා ශාසනවංශ යෙහිත් කොටස් හයක්ව විසුඩවමම්ස දුශ්ශීලවූබවක්නම් පෙණෙන්නේම නැතිඑකකි, වර්ගහයක්විමට කාරණා එහිමකියාතිබේ, ඒ කියාතිබෙණ එකම කාරණයකින්වත් දුශ්ශීලවනහැටියක්වත් පාපවනහැටියක්වත් කිසිවෙක්විසින්දු කියනොහැකියි, එහිමහණදමශුඩකිරීමට ඒ කාලයෙහි මිනැකාළෙ සංඝයාකම්මකරණ සීමාවල සැකසඳහයි· ඒ සීමාවිපත්තීන්ද එකල්හි සැකකර අනුමාණකලනමුත් ආගමධාරී උගත්තු සැකනොකෙරෙත්හෙද, එහිවිසූ සියලුම භික්ෂූපිරිස දෙවනු මහාවිහාර පරම්පරානුගත සංඝයාගේ උපසම්පදාවලැබ සැකරහිතවූ ශුද්ධියෙහි පිහිටුවෝය, එහිවිසූසය කොටස දුශ්ශීලයෝනම් ඔවුන්ටනැවත උපසම්පදාවක් ලබන්ටහැකිද? යනුත් මේ සඳහාසැලකියයුතුයි· රාමඤ්ඤරටේ දුශ්ශීලපාපයන්ගේ කොටස් හයකැයි, විසුඩසුභාද, දැන්කියන්නේ රාමඤ්ඤරට බුරුමරටට යටත්වන කාලයෙහි රාමඤ්ඤරටින් නික්මගියවුන්ගේ පරම්පරාව සියාම්මහානිකාය යයි ඉහතින් කිව්වචනය කිසිලෙසකිනුත් සිහිනැතිකරගෙණ වියයුතුයි. නමුත් ඒ වචනම් අපටන මතකනැතිනොවී මේ වනතුරු සිහිතිබෙණ හෙයින්, රාමඤ්ඤනිකායට යම් දෝෂයක් විසුඩසුභාද, කියන සැමවිටම තමනුත් ඒටපංගුකාරයෙක්යයි දෝෂපක්‍ෂයටම එකතුකර ගණන්කරමු,

රාමඤ්ඤරටේ නානානිකාය භයක්පැවතුනුබවට, විශ්වසුභාද, කියාති බෙන්නේ,

"ජටා භින්නා සංඝපක්ඛා එකතො සංඝසම්මුද්දසා
කාලන්තා නානාසංවාසකා නානානිකායා ජාතා,,

යනුමේ පාඨයි.

නිකාය භය නරකයයි කීමවත් දුස්සීලවීම ගත් ඔයකි පාඨයෙන් පෙන් වූවේ වරදනමයි. මෙහි කොටස්හයකට බිඳුනායකීනිසා දුස්සීලවූනාය එක්කෝ ඒ තෙරුන්නාන්සේලා නරක්වූනායයි සිතුවාද? එසේසිතුවං නම් ඒකවරදයි, භයකොටසකට බෙදෙලොස් කොටසකට බෙදවූනත් දුස්සී ලවියනොහේ, නිකායකීපයක්වූනායයි කීනිසා දුස්සීලවෙන්ට ඇතැයි සි තුවානම් ඒත් වරදයයිසිතමු, නානාසංවාසකවූහෙයින් දුස්සීලවෙන්ට ඇතැයි කල්පනා කිරීමටත් අවකාශයක්නැත්මය. ඉතින්මේ දුස්සීලභා වය කුමකින්වූඑකක්දැයි අපට තෝරාගත නොහෙණහෙයින් මෙයබලන් නවුන්ට ඒ තෝරාගැණීම භාරනොකොට දැනට වෙනකටයුතු විධියක් නොපෙණේ-රාමඤ්ඤරට සිඤුසංඝයා නිකාය භයක්වවිසුනිසා ඒ රට නරක්වූනායයි කියන විශ්වසුභාද, සංඝයාසමාගම්හතරක්ව සිටිය මෙලං කාවේම මහාවිහාර පරම්පරාව ශුද්ධයයි මුඛනොසැහෙන තරමින් කියන් නෙ කවරයුතුකමක් සලකාගණදැයි පරීක්ෂාකටයුතුයි.

"එවංසීහලදීපෙ මහාමහින්දථෙරාදීනං වංසභූතෙන ම
හාවිහාරවාසිගණෙන සද්ධිං චත්තාරොගණා භිජ්ජිංසු,,

යනාමෙයින් ලක්දිවම සමාගම් හතරක් ඒ කාලයෙහි පැවතුනබව ප්‍රකා ශයි, ලක්දිව සමාගම් හතරකට භෙදවීසුවායින් එකක්වූ මහාවිහාර පරම් පරාව ශුද්ධනම්, රාමඤ්ඤරටෙහි භයකටබෙදී විසුවෝ එපමණට අශුද්ධ යෝගයි කීම යුක්ති විරාධයි-මේඇරත් විශ්වසුභාද, බුරුමදෙශයෙහි පර ණ දුස්සීලයෝ සිටියෝයයි ඒ කීම ප්‍රකාශකිරීමපිණිස මේ වගන්ති ලියාති බෙන්නා, ඒ මෙසේයි "උඹලාගේ ඔයවලුඛිකම්ය නොකරණ උන්නාන් සෙලා බුරුමරටේ තවම ඉන්නවානොවේද, සමහරබුරුම උන්නාන්සේ ලා කල්‍යාණිසීමාවෙහිදී උපසම්පදා උනායකීවේ ඒ පක්ෂයේ මුල්ඇත්තෝ ම නොවේද,

"මරම්මරට්ඨතො එතංවෙවභික්ඛු,,

යනාදියෙන් බුරුමරට සියලුම භික්ෂූහු කල්‍යාණි උපසම්පදාවනොගත් බව හොඳටම පැහැදිලිව ඔප්පුවෙනවා නොවේද, ඉතිරිවසිටි උන්නාන්

සේලා අරකල්‍යාණී ප්‍රකරණයේ හි මුල්සවනාවේ වල්අසමනොවේදැයි,, කියාතිබෙන්නා, මේ සඳනාද අපවිසිනුත්වේති තතුපහළකළ යුතුවේ, බූරුමරට සමහර උන්නාත්සේලා කල්‍යාණී සීමාවෙහි දළ්හිකම්ය ලැබුවෝ යයි අපේපක්ෂයේ මුල්ඇත්තෝ කියාතිබෙණවා සැබැයි, මේ කීම එසේය යි ඒත්තුවටත් ගණිත්නම් එසේම ඊනි එමඇත්තෝ කියාතිබෙණතවත් කීමකුත්ඒපරිද්දෙන්ම පිළිගතයුතුවව අපිමෙහි අමුතුවෙන් නොකිව්වත් ඔහුගේකීමෙන් ප්‍රකාශවේ

“ධම්මචෙතියරඤ්ඤා කාරාපිතං සාසනං සකලං මරම්ම
රට්ඨම්පි ව්‍යා පෙත්වා ඔගාහෙත්වා තිට්ඨති,,—

යනමේ ටිකයි·

ධම්මචෙතිය රජවිසින් කරවනලද බුද්ධශාසනවංශය සියළු බූරුමරටමු ලුප්ලේද පැතිරබැස සිටිසිකිව්වාම බූරුමරට උන්නාත්සේලා සමහර කෙණෙක් අත්නොනැරුණුබව කාටනම් නොතේරේද, බූරුමරට සමහර උන්නාත්සේලා පමණක්ම කල්‍යාණී නිකායේ ශුද්ධිය පිශන දළ්හිකම්ය ලැබුවෝනම් “සකලං මරම්මරට්ඨං,, කියන්නේ නැතැයි සිතමු, ඉත්නිසා බූරුමරට සමහර උන්නාත්සේලා මහාචෙතිය වඳනාවසඳහා, රාමඤ්ඤ යෙහි හංසාවතිනුවරට ගියකළ ඒට නුදුරුවූ කල්‍යාණී සීමාවෙහිදී ලබණ ලද දළ්හිකම්ඇත්තානු බූරුමරටටගියපසු බූරුමරට සැමඋන්නාත්සේලා රැස්කරවා මේදළ්හිකම්ය ලැබූවන්විසින් දෙවනු දළ්හිකම් කරණලද්දනුය එකල්හි සියලුබූරුමරටම ධම්මචෙතිය රජවිසින් කරවනලද ශාසනය පැතිරගියාවේ—ඔයවික ඔහොමමයි–බූරුමරටේවල්අයවල් සිටිබවක්, විශේෂයෙන් ද, කිනමුත් ඒ නමති පොතේ එබඳුකීමක්නැතුවා මය්, ඉතින්මේවල්කම කව්රෙකුට කියයුතුදැයි සලකානු· තවද, බූරුමරට අලජ්ජීන්සිටියබව ඔප්පුවෙයි කියකියා ශාසනවංශයේ පාඨකැබලි ලියලියා නොයෙක් තැන් වල නොයෙක් පරිද්දෙන් කියාතිබෙනකීම් බැලූවාම බූරුමරටට අයිතිව පැවතුනු එක්ප්‍රදෙශයක්වූ, විජයපුර, සිරිබෙතනනුවර, ආදී සථානවල විත කාලයක් අතරේවිසූ සමණකුත්තකයන් සඳහාත්, තවත්කාලයක රජුන් පස්දෙනෙක්වනතුරු ඒක්අංශයක් වසාසිව්රු පෙරවූ සාමණෙරයන් සඳ හාත් ඒ ඒ තැනකිව්කරුණුය්, මේ සමණකුත්තකයන් ශාසනයේ භික්ෂු සංඝයාහා කිසියම්ප්‍රකාරයකින්වත් මිශ්‍රව ක්‍රියාපැවතීමක් තුබූනැවියතුත් නැ එම්, සමණකුත්තක පිරිසට අනුරුද්ධරජතුගේ කාලයෙහි සුදුවසත් අඳවා ඔවුන්සේවායක් කරගත්බව කියාතිබෙණනෙයින් ඒ කාලයෙහිම බුද්ධශාසනය ශුද්ධවූබව පෙණේ, සිව්රුපෙරවීම පිළිබඳවූවිවාදයත් සංසිඳවූ සැටි මෙකීම ඉහලින්ලියාඇති, ඉන්නිසා එලෙසින් කියනලද දෝෂපිළි

ගතයුතුවීවා නොවනබව සැලකිම මෙයින්ඉතාපාසුය. " විශ්වසුභාදගේ තිමක්නම්, ධර්මිෂ්ඨරජ විසින් කරවූශාසනශුද්ධියටත් බුරුමභික්ෂූහුසි යල්ලමනොබැඳුනනිසාත් මේතරම්අලජ්ජී දුශ්ශීලයෝ බුරුමරටපැතිරීසිටි යනිසාත් අලජ්ජීන්ගෙන්මිශ්‍රනොවූ එකිශාසනය පැවතඑනවායයි විභූෂ ණ කියන්නේකොහොමද? කියයි. බුරුමරට අලජ්ජීදුශ්ශීලයන් පැතිරසි ටියාම එයින්වෙන්ව වසන ශාසනිකසංඝයා ඒවමිශ්‍රවන්නේකෙසේදැයි මී ට අපවිසින්කියයුතුවේ. බුරුමරටටවඅසිත් සිරිබෙතත, නගරාදීයෙහිවිසූ,ස මණකුත්තක, සත්වශාසනිකභික්ෂූන් මිශ්‍රවූබවක් එගිකියානැහිවාමයි. ඒර වේඔවුන්සිටියපමණට බුද්ධශ්‍රාවකයන්ට ඔවුන්මිශ්‍රවනවායයිකියනොත්,බු දුන්පිරිනිවී අවුරුදුසියය ඉක්මගියකාලයෙහි විශාලාමහනුවර දුශ්ප්‍රති පන්න දහසක්ම අමුතුවෙන්පැණවාගෙණ මනාවූ බුද්ධප්‍රඥප්තියයි ප්‍රකාශ කරමින් සමාගම්දහ හසක්ව කාලාශෝකරජුකාලයෙහිවිසූ දශදහසක් පාප අලජ්ජීන්ගෙන් ගහණවතුබූ මධ්‍යදෙශයෙහි එකලටබුද්ධශාසනයගෙ ශුද්ධවූපි රිසිදුනිකායක් තිබූනායකියා කෙසේසිතනවාදැයි කියාවත්, බුද්ධවර්ෂයෙන් දෙසියඅටලොස්වනඅවුරුද්දේ අභිශෙකලත් ධර්මාශොක මහරජානන්කා ලයෙහි ශ්‍රමණවෙශධාරීව බුද්ධශ්‍රාවකයන්වහන්සේලාභා සමග හැසුරුණ වූ සැටදහසක්පමණ තීර්ථකයන්ගෙන් ගහණවතුබූ මධ්‍යදෙශයෙහි තීර්ථ කයන්ගෙන් මිශ්‍රනූවූ ශාසනිකශ්‍රාවකයෝ ඇතිවියනොහැකියයි කියාවත් නොකියන්ට කිසිකරුණක්නොපැණේ. මොහුගේමේකීම්වල අක්දමටඑබ ඳුකථාවලටත් අනික්මාරයේ පටන්ගන්නවා ඇතැයිසිතමු—

" තත්‍ථ මහාවිහාරවාසී ගණො යෙව එකො ධම්මවාදී
අහොසි සෙසා පන අධම්මවාදිනො තෙ ච තයො
අධම්මවාදිනො ගණා භූතත්ථං පහාය අභූතත්‍ථෙන
ධම්මං අගරුං කත්වා චරිංසූති වචනතො සිහලදී
පෙ අධම්මවාදිනො තයො පි අලජ්ජිනො ගණා පරි
මණ්ඩල දූපටිච්ඡන්නාදීනි සික්ඛාපදානි අනාදියිත්වා
විචරිංසු: "

යනාමෙයින් ලංකාවිපයෙහි අධර්මවාදිවූ අලජ්ජීහු සමාගම්තුනක්ව අ නුරාධපුරයෙහිමපැවති පරිදි පේණබැවින් මෙතෙක්ගහණව තිබියාවූ අල ජ්ජීහු මහාවිහාරපරම්පරාවටත් මිශ්‍රවෙන්නටමඇතැයි නොසිතාපිරිසිදු ම හාවිහාරපරම්පරාවසයිකියමින් උරුමකරගන්ට වෑයම්කිරීමටත් බුරුම රටටම මේඅලජ්ජීන්ගේ මිශ්‍රකම එළන්වත් උත්සාහකිරීම ඇත්තේ සා

ධාරණ ක්‍රියාවකැයි කවරනුනම් කියද්ද? ලක්දිව වොහාරතිස්ස, මහර ජ්ජුකාලයෙහිද, ගොඨාභයමහරජානන්කලද, පරාක්‍රමබාහු මහරජානන්ක ලද, යනාමේආදී බොහෝකාලවලදී නොයෙක්වාරවල සර්වඥශාසනයට කටුහාසමානී පාපිවූ වෛතුලිකයන්ගෙන් ඇතම්කෙනෙක් සිවුරුහැරවී මෙන්ද, ඇතම්කෙනෙක් ලංකාවෙන්පිට අන්‍යරටවලටගඩීමෙන්ද, දඹු ව්මිකලබව පෙණිතිබෙණනැත එපමණකිවිය පාපයන්ගෙන් ලක්දිවට ඇතිහානියක්නොවීමටත් එකවරටමබුරුමරටට ඔයහාණී යවදින්ටත් පිළි වන්දැයි ඉහින්සිතන්ට හැකිවෙයි—

තවද, "බුරුමරාමඤ්ඤරටවල උපසම්පදාව අපිරිසිදුනොවනවානම්, ධර්මචෙතියරජකාලේ ලංකාවේන්ගෙණගියේ කුමටද? ඒකාලේ එහෙම නම් දන්නුමටකියමුදැයි" විඤ්ඤුහාද, කියනලදවචනයෙහි අයුතුබවහා වාද මෙහිප්‍රකාශකටයුතුවේ. ධර්මචෙතියරජ්ජුකාලයෙහි උනාඅයසිසිතු අපිරි සිදුකම් රාමඤ්ඤරටටම කියාතිබෙණනිසා ඊට්බුරුමරටත් සම්බන්ධකර, මොනුකියාතිබෙණසැටි ප්‍රකරණවලනොපෙණේ. මෙකී රජ්ජුකාලයෙහි රා මඤ්ඤරට උපසම්පදාදී සංඝකර්මකාරණ සීමාවලට යම්යම්කරුණුසඳහාසැ කළපන්හෙයින් ඒ සැකයදුරුව නිඃසාංකාවූ මහණදම ලබාගැණීම සඳහා ලක්දිවටඑවනලද්දාවූ තිස්දෙනු ලක්දිවඑකලටවැඩසිටිය තොටගමුවේ රාහුලසංඝරාජ මහතෙරුන්වහන්සේලාගෙන් මහණකමලබාගෙණ දෙව නු රාමඤ්ඤරටටගිය පසු ඒ රටවාසීතිස්දෙනු ලක්දිව සිටගිය තෙරුන් නාන්සේලාගේ ඉදිරියේ සැකනැති උපසම්පදාවෙහි පිහිටුවෝය. තමන් උපසම්පදාවංශයට කොයියම්කාරණයක්සඳහාහෝ සැකයක්උපන්කල ඒ බඳුසැකනැතිපරිද්දෙන් සිලයෙහි පිහිටු ඒ රාමඤ්ඤරට තෙරුන්නාන් සේලාගේ ක්‍රියාවට ප්‍රසංසාකටයුතුයි. සියල්ලම්බහුශ්‍රැත සමර්ථයන්නො වනහෙයින් ඔබඳුසැකකටයුතු කරුණුවලට බොහෝදෙනෙක් යටත් වෙත්. ඒකාලයේ බුරුමරාමඤ්ඤරටවල උපසම්පදාව අපිරිසිදුවීලක්දිවින් ගෙණගියානම් දන්අපිරිසිදු වනබව කියනුමකිම්දැයි විඤ්ඤුහාද, කී වච නය අතික්කිච්සිඅඑවචන වලටත්වඩා අයුතුයි. ඒකාලේ එහෙම නම් දන්නුමටකියමුදැයිකීයන්නේ ඒකාලේ අපිරිසිදුයයිසලකා නැවත පවිත්‍රක ලායින්පසුත් ඉහතපැවතුනායයිසිතු අපිරිසිදුකම එසේම පවතිනවායයි ඔ ප්‍රකරන්ටසිතාගණද නැතහොත් ඒකාලේපැවතුණු අපිරිසිදුකමේට ලයොන්ම දෙවනුපිරිසිදුව පිහිටුඋපසම්පදාවත් අපිරිසිදුවූනායැයි ඔ ප්‍රකිරී මටපුලුවන්නැටියක් සිතාගණද කින්දයනබව නිසතකරගැණීමට අ පිනම් පොනොසන්නොවමු. බුඩශාසනයේ මෙබඳු ප්‍රධාන වැදගත්කාර ණාගැණ මෙපමණදුරට කරුණුකියන්යා වෙහෙසදරණනැනැත්තා දැ න උගත් සිහිපරීක්ෂාඇති පණ්ඩිතයෙක නින්මුනුකෙනෙක ඉන්නිසාමේ කියනකාරණා ඇත්තේසාරවත් වැදගත් යුතුවූ කාරණාවෙන්ටඇත, නැත්නම් මේතරම් රටමුලුල්ලේ ප්‍රකටවන පත්‍රයක ප්‍රසිද්ධකරද්දැයි

සිතා මේකියමන්සත්‍යවූදෙයහැටියට බොහෝසමූහයා පිළිගෙණසැබෑබො
රුහැටියටත් බොරුසැබෑහැටිගටත් විරුද්ධග්‍රහණයකොට මුලාවවැඩෙන්
පිරිසි අවැඩරැස්කරගණිති. රමඤ්ඤරට ඒකාලයෙ එහෙමනම් දූත්කු
මටකියමුදූයි යනමේකීම රමඤ්ඤරට තෙරුන්නාන්සේලාවූ දූතගන්ට
ලැබුණනම් මේසඳහා බොහෝදුරටකාරණා දක්වනවා ඇතැයිසිතමි- වි
සුද්ධසුහද, ගේමේත්මහැටියට බුද්ධවර්ෂයෙන් එක්දහස්සසිය තුදුස්වන්නෙ
හි රාජ්‍යපදප්‍රාප්ත, විජයබාහුමහරජානන්කල ලක්දිව බුද්ධශාසනය අපිරි
සිදුබවපෙණ බුරුමරට අනුරුද්ධමහරජානන්ට ලියුම්යවා ඒදෙශයෙන්සං
ඝයා වැඩමකරවා ලක්දිවපිහිටුවූ බුද්ධශාසනයත් මෙතිපිහිටිකාලයෙන් ඉ
හත අපිරිසිදුනම් ඉත්පසු අපිරිසිදුබව කියනුමකිත්දැයිකියාද, ලක්දිවම
රජකල, පණ්ඩිතපරාක්‍රමබාහු මහරජානන්කාලයෙහි, සොළිමහරට්ත්තෙ
රුන්වහන්සේලා ගෙන්වා ලක්දිවශාසනය පවිත්‍රකළසැටිත්, විමලධම්
සූර්‍යනම්, රජ්ජුකාලයෙහි අරෙක්කාන්රටින් සංඝයාගෙන්වා ශාසනයපි
හිටුවූසැටිත්, දෙවෙනි, විමලධම්සූර්‍ය රජ්ජුකාලයෙහිත් එම අරෙක්කාන් ර
ටින් සංඝයාගෙන්වා ලක්දිවබුද්ධශාසනය පිහිටුවූසැටිත්, කීර්තිශ්‍රීමහරජ්ජු
කාලයෙහිත් සියම්දෙශයෙන් උපාලිස්ථවිරාදීන්ගෙන්වා ශාසනයපිහිටුවා
ගත් පරිදිත් අපිදනිමුය ඒකාලවල එසේලක්දිව ශාසනය හානිවෙවීගියා
නම්, දැනටහානිවනබව කියනුමකිම්දැයිකියාද, රමඤ්ඤරට තෙරුන්
නාන්සේලා කියන්නම්, විසුද්ධසුහද, ටනබා තමන්ටඅනුවවසන අති
කුත් අයවලාටවත්ථවිරුද්ධවකියයුත්තක් ඇත්තේමනැතැයි හැගෙ—

විසුද්ධසුහද, කියන්නේ, කැලණියෙන් රමඤ්ඤදෙශයට ගෙණගිය පි
රිසිදු උපසම්පදාපරම්පරාවේසංඝයා බුරුමරජ්ජුරුවෝ රමඤ්ඤරට අල්වා
යටත්කරගත්කාලයෙහි රමඤ්ඤයෙන්නික්ම සියම්රටටගොස් පුරාණ ප
වත්පැවආ ශුද්ධවූසාංඝයාටඑකතුව සියමේපැවතආ ඉතාහොඳ, කල්‍යාණි
වංශික ලංකාවේ මහාවිහාරපරම්පරාවෙන් උපාලිස්ථවිරාදි තෙරුන්නාන්
සේලා සියමේසිට ලංකාවටඅවුත් කීර්තිශ්‍රීරජ්ජුරුවන්ගේ කාලයෙහි කා
ළාවූඋපසම්පදාවෙන් විසුද්ධසුහද, ලාගේ සියම්සමාගම පැවතඑනවාය ය
නුයි, විසුද්ධසුහද, මහත්වෙහෙසදරා තමන්සමාගම මහාවිහාර පරම්පරා
වෙකරලා හමාරයි. එක්දහස්සසිය තුදුස්වනවර්ෂයෙහි රාජ්‍යයටපැමිණි, වි
ජයබාහු රජ්ජුරුවන්කාලයෙහි, බුරුමරට අනුරුද්ධරජ්ජුරුවන්ට ලියුම්ය
වා සංඝයාගෙන්වා ශාසනයපිහිටුවූකාලයපටන් ලංකාවේ පැවතුනාවූ
සමාගම බුරුමසමාගමටවටකරුණු මෙහිප්‍රථමභාගයෙහිදී මහවංශයන
ප්‍රකරණයෙන් අපිගෙණහැරදක්වා ඇති. එපමණනොව; බුද්ධවර්ෂයෙන්
දෙදාස්හතළිස්හතේදී කැලණියෙන්ගෙණගොස් රමඤ්ඤයෙහි පිහිටුවූ ම
හාවිහාරපරම්පරාවටත්මුල බුරුමසමාගමබව දෙවෙනිභාගයේ ප්‍රකාශකර
ඇති. ඉත්නිසා රමඤ්ඤයෙහිසිට සියමටගොස්සිටියාවූ කල්‍යාණි වංශික

මහාවිහාරපරම්පරාවෙන් ලංකාවේ සියම්සමාගම පැවත එනවාය යන
විසුද්ධසුභාද, ගේ කීමෙ සත්‍යනම් විසුද්ධසුභාදලාගේ සියම්සමාගමේ පැවැත්
මටත් මුල බුරුමරටේ උපසම්පදාවමය ඒකඑසේනොවේයයිකීමට කිසි
මබලයක්ඇත්තේමනෑ. ඉන්නිසාලංකාවේසිට රාමඤ්ඤයටගෙණගොස්ති
බූ මහාවිහාරපරම්පරාව එතනින්සියමටගොස් එයින්තමන්නිකාය පැව
තඑනවාය යන විසුද්ධසුභාදගේ කියමනුත් බුරුමරටින් ලක්දිවට සංඝයා
වැඩමවා මීට අවුරුදුඅටසියයකටපළමු ලක්දිවඋපසම්පදාදියකොට ශාස
නයදියුණුකළායයන මහාවංශයෙහි කියමනුත්දෙකසැඬැනම් සියම්සමා
ගම බුරුමරටේසමාගමෙන් පැවතඑනඑකක්මයි' ඊටනිසින් අනුමාන
යක්නෑ. තවත්, විසුද්ධසුභාද, ගේකීමක් මෙලහටසිහිකරන්ට ඕනෑ. එ
නම්; තුන්වනසංගායනාකාලයෙහි පැළලිප්නුවරින්පිටත්කළ තීර්ථකයන්
සහිත ගොඨාභයරජ්ජුරුවන්කාලයෙහි ලංකාවෙන්පිටකළ වෛතුල්‍ය
වාදීහුත් බුරුමරටටපැමිණ ඔවුන්ගෙන්බෝවූනාවූ පරම්පරාවේ දුස්සීල
අලජ්ජී පාපයන්ගේ සමාගම බුරුමරටේපවතිනවායයනුයි, විසුද්ධසුභාද,
ගේකීම්වලින් තීර්ථකයන්ගෙන්පැවතඑන දුස්සීල අලජ්ජී පාප බුරුම
සමාගම තමන් සහ භාගිවූ සියම්සමාගමට මුලක්යයිහැඟී තිබෙණනිසා
සියම්සමාගමත් දුස්සීල අලජ්ජී පාප තීර්ථක සමාගමක්යයනු ප්‍රකාශවේම
ය. ඒ එසේනොවෙයිකීමට කරණඋත්සාහය නිරර්ථකයි. විසුද්ධසුභාද,
ගේකීම්ඇර අපිඅමුතුවෙන්ගෙණහැරදක්වූවේ මහාවංශයෙහිම පමණයි.
විසුද්ධසුභාදලා හිටියහැටියෙනොහිට අහකතිබූ බුරුම සමාගමත් දූෂ්‍යකරම
කා කිසිකලකතමන්ට උරුමනැති මහාවිහාරපරම්පරාවකත් එල්වෙන්
ටගොහින් කරගත්නපුරකමහත! බුරුමරටසිට ලක්දිවටත් ලක්දිවසිට
රාමඤ්ඤරටටත් එහිසිට සියම්රටටත් පිළිවෙලින් ඔයගියසැටිබැළුවාම සි
යම්රටේ මහානිකාය බුරුමසමාගම නොවේයයි කව්රුනම්කියද්ද? ඒ
හැටියට සියම්රටසමාගම තීර්ථකයන්ගෙණුත් වෛතුල්‍යවාදී පාපයන්
ගෙණුත් පැවතඑන වල්සමාගමයයි තමාමකියාගත්තා නොවේදැයි ජේ
ණකල උනේමහත් නපුරක්යයි පශ්චාත්තාපයටපැමිණ උපායශීලීත්කා
ලකිරීම අත්වෙයි කියමු. තීර්ථකයන්සහිත ලක්දිවින්පිටකළ වෛතුලිකය
නුත් විසූරව සියම්දෙශයයි සත්‍යවිභූෂණ, කී මිථ්‍යාවාක්‍යයදැක විසුද්ධසු
භාද, මහත්ක්‍රොධයෙන්කිපී ඉපිලනැගිට කාරණා අකාරණා කිසිවක්නො
විමසා තමන්නිකායට කිපළිදුව අපසුඔහුටම හරවාකියම් යනසිතින්
ඒ ඒ විට කල්පනා වෙන වෙන මොක මොකවත් මෙන්උත්තරයයිදීසි
වශයෙන් ලියාතිබෙණවාදුටුවූකල කිසුනුතැනැත්තා අර්ථ ධර්ම දෙකනො
දැන ගණඅඳුරටපත්වෙයි යන " කුද්ධො අත්ථං නජානාති කුද්ධො ධම්මං
නපස්සති අන්ධං තමං තදා හොති ,, යනාදි බුද්ධවචනයන්ගේ අතිශය
සාරභාවය ප්‍රත්‍යක්ෂවේමය—

තවද, "බුරුමරටතෙරුන්නාන්සේලා පාපඅලජ්ජීදුශ්ශීලයෝග වල්වස නිජ්ජිකයෝය වෛතුල්‍යකයෝයයි මේ විස්වසුහාද, කියනවා නමුත් මොහුගේකාලයට අවුරුදු අටසියයකටඳුළුමපටන් ලක්දිවපැවැති කථාව ලියාතිබෙණ මහාවංශනම්පොතේ පරිච්ඡෙදකීපයකම, බුරුමරටෙ තෙරුන්නාන්සේලා පිටකත්‍රයෙහිපරතෙරටපැමිණි බහුශ්‍රැතසල්ලේඛගුණයෙන් උතතමයෝබවකියාතිබෙණවා. පූරාණකාලයෙහි ලක්දිව තෙරවරුන්ට උපසම්පදාවදීමත් පිටකත්‍රයපුහුණුකරවීමත් මෙමබුරුමතෙරහුම කාලෝයසිද එකිමශේණවා. ඒකරුණුපහළවන මහාවංශයෙහි ගාථාමෙහි ඳුව මහාගයේ බහාලිමු, ඉතිත්මේ මහාවංශයෙහිනිමන්, විස්වසුහාද, ගේ කීමත්, මේදෙකේ කොපමණමහත්වූ වෙනස්කමක්තිබේද, මේදෙක අතර අවකාශය කොපමණ විශාලද? යතුසලකන්නාවූඅපට මේලපටිවිස්වසුහාදට මෙසඳහායමක්කීම යුදුසුයයිනොහැගෙ. මේමහාවංශ, යනපොත ලක්දිවපමණක් නොව සියම්රටෙහිහා හින්දුරටසහිත එරොපයෙහි අනාගානරාජධානිවලත් විසිරීපවත්නා උගතුන්විසින් ව්‍යවහාරකරණවැදගත් ප්‍රකරණයක්නෙයින්ද, එපමණක්නොව බුරුමදේශයෙහි බහුශ්‍රැතස්ථවිරයන්වහන්සේලාවිසින් කලින්කලතනනලද ධර්ම්වර්ණයපිළිබඳවූ උතුම්ප්‍රකරණසහිත අනාගානශාසනප්‍රකරණත් එසේමබොහෝරටවල පැතිර පවත්නාහෙයිනුත්, බුරුමතෙරුන්නාන්සේලාගේ ව්‍යක්තභාවයසහිත ගුණවර්ණනාව අවුරුදුඅටසියයක් මුලුල්ලේ නොහොත් ඊටත්වඩා දීර්ඝකාලයක් මුලුල්ලේ නොකඩවලෝකයෙහි ඉතාඋස්වපවත්නා එකකි, එපමණමහත්ගුණය මැකීමටනැත්කරන්නහුගේ සියළුම බලාපොරොත්තු නිෂ්ඵලවීමකියයුතුවාපමණක්නොව මේ ගුණවර්ණනාවමැකීමටමෙතැන් පටන් තවඅවුරුදුඅටසියයක් උත්සාහගත්තත් එකාන්තයෙන්ම නොහැකිඑකක්යයි කල්පණාවටගෙණ ඒනිෂ්ප්‍රයෝජනවූ ව්‍යායාමය ඔපමණකින්නවතා බලාපොරොත්තුවෙනහැකියක් කල්පනාවටගන්නාමෙන් අපිආරාධනාකරමු. ගුණවත්වූකල්හිද දුර්ජනයන්කෙරෙන් භයඑළවීමලෝක ස්වභාවක්මය, හෙද කියනලදී—

"භොගෙරොගභයංකුලෙ චුතිභයංවිත්තෙනෘපාලාද්භයං
මානෙදෛන්‍යභයංබලෙරිපුභයංරූපෙතරුණ්‍යාභයං,
ශාස්ත්‍රෙවාදිභයංගුණෙඛලභයංකායෙකෘතාන්තාද්භයං
සර්වංවස්තුභයාන්විතංභුවිනෘණාංවෛරාග්‍යමෙවාභයම්." යි

සැපඇතිකල්හි රෝගභයද, ස්වකීයවර්ගසමූහයෙහි මරණභයද, ධනයෙහි රජුන්ගෙන්බියද, තමාඋතුම්මැයි උසස්වූසිතඇතිකල්හි දිළිඳුභාවයෙන්බියද, බලඇතිකල්හි සතුරුභයද, රූපලක්ෂණයෙහි ස්ත්‍රීන්ගෙන් භයද, ශාස්ත්‍රඥනිම ඇතිකල්හි වාදීන්ගෙන් භයද, ගුණඇතිකල්හි දුර්

ජනයන්ගෙන්භයද, ශරීරයෙහි මරනුගෙන්බියදයි, මෙසේලොවමිනිසුන්ගේ සියළුවස්තුවතෙම, භයින්යුක්තවේ. මොසැ යම භයනැත්තේවේ–

තවද රාමඤ්ඤරටබුරුමරජ්ජුරුවන්ගේ වසඟයටගැණීමසඳහායුධකරණකල්හි එයින්මිරිකුනාවුරාමඤ්ඤරට තලයින්ජාතියේ බොහෝසමූහයාඑවකට සාමඤ්ඤනවපැවති සියම්රටටයද්දී ඒසමග රාමඤ්ඤදෙශයෙහි කල්‍යාණිවංශික භික්ෂූහුද සියම්රටටගොස් ඉන්ඉහත තාරීයසර, රජ්ජුරුවන්ගේකාලයපටන් වෙන්වශයෙන්පැවත ආ රාමඤ්ඤනිකායටම සමගිව විසුවමුන් විශ්වසුහුද, කියනානැවියව සියමේ මහානිකායට එකඟවූබවක් සියමේසමාගම් තොරතුරුදක්වාතිබෙණ ප්‍රකරණයේකියානැතිඑක සියම්නිකායෙඅහේතුවකි. ලක්දිව මහනුවරපටන් සියමේ අයොධ්‍යමහනුවරදක්වා සැතැප්ම එක්දහස් එකසිය හැත්තෑවක්පමණ සාජුවූ දුරඇතැයි සග්‍යහැකි. මේරාජ්‍යයට විශ්වසුහුද ගියකෙනෙක්නොවේ තමන්සමාගමේවත් ඔයරාජ්‍යයටගියකෙනෙක් ජීවත්වසිටිනබවක්වද නොදනිමු: ඉතින්සියම් රට පවත්නා මහානිකාය පිළිබඳවූ තොරතුරු මොහුට දැනගත්ට ලැබීමඉතාඅපාසුය. සැබැයි ලියුම්වලහා පොත්වලසඳහන්වතිබෙණ පමණක්කාරණා ඒපමණට දැනගැන්ම පිළිවන්වඇති ඒපුළුවන්කමනම් අපවත් එසේමයි. සියම්රටේ මහානිකායේ තෙරුන්නාන්සේලා ලක්දිවට එවනලද ලියුම්කීපයක්හා රාමඤ්ඤනිකායෙ තෙරුන්නාන්සේලා ලියාඑවනලද ලියුම්බොහොමයක්ද, ඇතිවතිබේ. ඒකිසිලියුමකවත් සියම්මහනිකාය මහවිහාරපරම්පරාවබවක් පෙණීනැ: තවත්; ලක්දිවහා අන්‍යදෙශවලත් ශාසනපරම්පරාවන් ප්‍රකාශවෙන පාළිසිංහලපොත්ද, ඇතිවතිබේ . ඒකිසිවකත් සියම්රටමහානිකායවත් එයින්පැවතඑනලක්දිව සියම්සමාගමවත් මහාවිහාරවංශයයි නොපෙණේ. සියම්රටේප්‍රධාන මහතෙරුන්වහන්සේලා දශනමයේනාමින් එවාතිබෙණපොතකරාමඤ්ඤරටින් මහාවිහාරවංශිකසංඝයා තුන්වාරයකදීම සියම්රටටගොස් විසූකාලයපටන් එයින්පැවතඑන්නෝ රාමඤ්ඤසමාගමයයි වෙන්වශයෙන්එකමනිකායක්ව මේදක්වා පැවතඑනබවත් සියම්මහනිකාය එහිම පවත්නා අන්‍යනිකායකයන්නුත්පැහැදිලිව ලියාතිබේ— ඒකඑසේමනිශ්චිතයි.ඒගැණ තවත් මින්දුරට යමක්ලියන්ට පෙණෙන්නේනැ, ඒපොතඑවාතිබෙන්නේ දඹල්ලේවාලුකාරාමයෙහි වැඩිවිසූ අමරපූරසමාගමේ නායකස්ථවිරයන්වහන්සේටයි, විශ්වසුහාදට මේපොතදැක්මට නොලත්බැවින් නිශ්චාරවූ මේකියමන් රාශියක් කියාවෙහෙසුනා මේදශමහතෙරුන්වහන්සේලාවිසින් එවනලද පොතේප්‍රකාර මහාවිහාර පරම්පරානුගතවූ රාමඤ්ඤනිකාය සියම්රටේපවත්නාබැව් සහ සියම්මහානිකාය මහාවිහාරපරම්පරාවක් නොවනබවත් අපවිසින්පමණක්නොව මේ අහනබලන අනිකුත්සියලුදෙනාවිසිනුත් ඇදහියයුතුවේ. එසේනොඅදහා තවතවමින්

දුරවත් අනුමාණකරත්නම් ඒකඅඥානයන්ගේ ක්‍රියාව කිසිසම්රවේසම්භතාර
තුරක් එහිප්‍රධානමහාතෙරුන්ටහත්සේලා ලියාතිබෙණලෙසට අදහත්
තේනැතිව මේරවේදූන්තොත් කාරණාරහිතව කිසිමලියමනක් පො
තක්පතක්නොපෙන්වා කියනාහිමිකාවරෙක්නම් අදහාද ? ෴

එබඳුකියමන් ඇදහීමනබා ඇදහියයුතු
යයිකීමත් බලවත්අපරාධයකි. ඉන්නිසා සියම්මහානිකාය මහාවිහාරවංශ
යයි කිසිවෙක් පිළිනොගණිවා. සියම්මහානිකාය මහාවිහාරපරම්පරාවගයි
කියනවිංචසුහාද, එබවසඳහන්ව තිබෙණපොතේනම මෙබනතුරුම නො
කිව්වව ඔහුගේ ලියුම්කියවූ සියල්ලෝම දුටිහි. අසවලෙක්විසින් ලියනලද
ලියුමක එයසඳහන්වනවායයි කියාදනෑ: අසවල [illegible] ල්නම්
ඇතිතෙරුන්නාන්සේපටන් නොහොත් අසවල්රජ්ජුරුවන්කාලයෙහිප
ටන් මහාවිහාරපරම්පරා සියම්මහානිකායට අයිතිවනායයිකියනපමණ
වත් තාවවනතුරුකිව්වානොදුටිමු. එබඳුපොතක්තිබේනම් ඔයඅනික්කිය
න ඒවාවාගේම ඒකේනාමයවත් කීමයුතුවමඇත. දැනටමේව්වාදයසඳ
හා විංචසුහාද, උත්තරලිවීමට පටන්ගෙණ දෙලොස්මාසයක්වීමට අඩු
වෙනත් සවල්පයකි. මේඅතරේ දීර්ඝවූ ලියුම්අටක්පමණ ලියාතිබෙණවා
එයින්සමහරලියුම් කඩදාසියේ හිරගතනමාරපමණවත් දීර්ඝවගොස් තිබූ
නි. ඔයඅතරේ නමත්පරම්පරාව සඳහන්වතිබෙණ පොතේ නම පමණ
වත් කියාපෙන්වාදීමට කාලයත්අවකාශයත් නොතිබූනායයි කවරෙක්
නම්කියාද, අවකාශයතිබීලාත් කියත්තේ අපේවංශය කියාපෙන්වාදීමට
මොකොදම්නෑකම. සත්‍යවිභූෂණ, කියනවිට ඒකපෙන්වීමට සත්‍යවිභූෂ
ණ, අපේප්‍රධානියෙක්නොවෙයි. අපටමනාපවිටක අපිඒකපෙන්වමුයයි කි
යාලයි. අපටහැගෙණහැටියට වංශයක්පෙන්වීමට ඇතිවතිබේනම් මිටව
ඩාඑයදැක්වීමට මණාපවියයුතුකාලයක් ඇතැයිකියනොහැකියි, සියම්මහා
නිකායට මහාවිහාරවංශය අන්වූකාලයවත් පරම්පරාවදුත් නොහොත් ලැ
බ තෙරවරුන්ගේනමවත් එයසඳහන්වනපොතේ නාමවත් මෙකිසිවක්
නොකියා ඔයලෙසින්සමාගමක් උරුමවූනායයිකීම මටනම් ලැජ්ජාවිය
යුත්තකි. අනුන්ටගැරහිමපිණිස රටේකාගේකාගේවත්වගතුග ඔපමණ
දීර්ඝන්දීගටම ලියලියාවෙහෙසෙනාඅතර තමංගේවංශය සෑදුනාඅන්දමක්
කියන්ටඇතිවතිබේනම් ඒකාන්තයෙන්ම පෙන්විනවාඇත. එසේතිබේ
නම්ඒකමපමණක්ඔපමණදුරටරහස්කරවසාගැණීමටම්නෑකමක්නැතැයිසි
තමි. ඉන්නිසාඑබඳුපොතක් නොහොත්ලියුමක්හෝ යම්දැක්වියයුක්තක් නැ
තුවාමයයි. අපිපමනක්මනොව ඒපත්‍රයකියවූකාටත් දැන් ඒකාන්තයෙන්
විශ්වාසකිරීමට සුදුසුකාලයයි. සියම්මහානිකායම මහාවිහාර පරම්පරාව
බව වැදගත්සාක්ෂිසහිතව ඔන්නාඔප්පුකලා ඔන්නාඔප්පුවුනා කියකියා ද
හවිසිපලේ ලියාතිබෙණඒවා අපිබැළුවාම සාක්ෂිපෙන්වීමට ගොහින්තිබෙ
න්නේ කාරණය පලමුවරට නොපෙන්වයි. මහාවිහාරවංශය තමන්ටඋරුම

ම උනුහැටි ජේණිඉඩමකින් පළමුවෙන්ඒකාරණය පෙන්වා සාක්ෂිපසුව
පෙන්වූවානම් වඩාහරි. ඒවාකොයිලෙසනමුත් විසාවසුහෘද, විතක්වරද්
දූගෙණ තිබෙණබවකීම අපේසාධාරණයුතුකමකි, “ මහාවිහාර වංශය
ඔත්තඔප්පුකරලා තිත්ලුයි ,, කියාතිබෙණඑකෙන් තවත්මණපවේලාව
කා පෙන්වීමට වංශයක්ඉතිරිවතිබෙණවාය යන්නක් නොහැගෙ. නො
නොත්; ඒකීමමිථ්‍යායයි කියයුතුවේ. වංශයමණපවෙලාවක පෙන්වනවා
යකිව් කීවෙහැටියට ඒපෙන්වීමට මනාපයවත් මෙවනතුරුනුපන්බැවින්
“ ඔත්තඔප්පුකළා ,, කීවිත මිථ්‍යාවියයුතුය. සියම්මහානිකාය මහාවි
හාරපරම්පරාවබවට විසාවසුහෘද, සාක්ෂියයිපෙන්වන්නේ, දළඳිකම්නො
කිරීමතුත් ඇස්බැමදෙකේ ලෝමකැපීමතුත් කඳමැද පිටින්බඳින පටිග
තුත් යනමේකාරණාතුනකි. මෙකීමූලටමකිවූ දළඳිකම්ය මහාවිහාරප
රම්පරාවට නැතැයිමොනුකියනතාමුන් දළඳිකම්ය මහාවිහාරපරම්පරා
වේසංඝයා පැවැත්වූබව සැකනැතිපරිද්දෙන් අපටපෙන්වියහැකි. ඒනැ
වත මෙහිප්‍රකාශකරන්නමු. සියම්මහානිකායේ තෙරුන්නාන්සේලා දළඳි
කම්ය පවත්වන්නේනැතැයි කියනනමුත් පූරාණකාලයෙහි ඒකම්යපැ
වැත්වූසැටින් ප්‍රත්‍යක්ෂපරිද්දෙන් පෙන්වාලීමඅපටබාරයි. හෙද දෙවනුමෙ
තිම පහළවේ- මහාවිහාරපරම්පරාවේ භික්ෂූහු බැමලොම්සමග ඉසකේ
කැපූවෝය යන්නවත් සංඝාටිය මතුපිටබඳිනා අමුතුපටියක් බැන්දෙය
යන්නවත් පෙන්වියනොහේ. ඔයකිව්කාරණාදෙකෙන් බැමලොම්කැපී
ම සියම්සමාගමේ ඇතම්භික්ෂූන්කරණ පමණක්මිස, යථොක්ත අනික්පටි
ය බඳිනසැටිගතුත් නොදනිමු. සියම්සමාගමේ භික්ෂූහු, ගාල්ල, කොළඹ,
මාතර, මහනුවර, ආදිබොහෝරටවල වසන්නො ඒඒ ස්ථානවලටයන
එනකලත් ගම්වලහාමාර්ගාදියෙහි හැසිරෙණකලත් පිරිත්බණදහම්කීම්පි
ණ්ඩ පැමිණෙනවිටත් සඟළසිව්රුපොරවාවැඩමවනපමණක්මිස සඟළසිව්
රට පිටින්පටියක්බැඳ හැසිරෙන්නන්දූකීමටනොලැබෙණබව බොහොදෙ
නාටප්‍රත්‍යක්ෂව දනුම්ඇත. විසාවසුහෘද, පටා ඔයකියන පටියබැඳගෙණ
හැසිරෙණවා නුදුටුමු. ඉතින්මහාවිහාරපරම්පරාවේසංඝයාටමේම සියම්ම
හානිකායේත් මේපටිබැඳිම මේතතුරු පවත්නානිසා සියම්මහානිකා
ය මහාවිහාරපරම්පරාවයයිමොනුතුමටකියනවාද? ලියුමේකීයනලකුණ බැ
එවාම පෙණෙන්ටනැති.කල මෙහිකීහු මහාවිහාරවංශයෙහියයි කියන
වාටවාඩා විසාවසුහෘදගේකීම්ලෙස තිතුවක්කාර වල්සමාගමකින්පැවතඑ
න වල්අයමයයිකියන්ටපේණවා. බඳින්වලජ්ජාපට්ටයේවග කියන්වලජ්ජා
නුනේ විසාවසුහෘදයයි අමුතුනාමක්පටබැඳගත් බලයනිසයි, නොදනී, විසාව
සුහෘද, ලාට ඒපටිය පූරාණකාලයෙහිතිබී දූනාටඅත්ඇරීගියා යයිකියත්
නම් ඒහැටියටම මහාවිහාරපරම්පරාවටත්තිබී එයින්බූරුම රාමඤ්ඤර
ටවලත්පැවතී කල්යාමකදී අත්ඇරියාම පිළිවනැයි විසාවසුහෘද, ගේකී
මලෙසම තමන්විසින් සිතියයුතුවතිබූනා. ඒවිකාස්නොසිතා කීඑකතමන්

ගේනීමේක්‍රමයටත් විරුඬව අනතිගාමිනීමයි. යම්ලෙසකිත් බුරුමරමඤ්ඤ රටවලත් ඔයකියන පටිබැඳිම තිබුණානම් මේ සියම්සමාගමේ දැනට ඒ නැතිවී ගියාමෙන්ම එහිත් නැතිවියන්ට පිළිවන. පටිය එයාකාරනම් අනික්කාරණා දෙකත් එසේම වෙනස්වීමට බැරිකමක්වත්, තහනමක් වත්, ඇතැයි කෙසේසිතමුද? මේවායේ තත්වය බැලුවාම ඉහතකී දළ්හි කර්මය ආදිවශයෙන් මහාවිහාරපරම්පරාව ඇතිනැතිවවට කීකරුණු මේ කියනකාරණයට ප්‍රයෝජනවත් නොවනබව හොඳකාර පෙණීගියා—බෙන්තර අත්ථදස්සීතෙරුන්වහන්සේවිසින්ද, සියම්රාවජිරඥාණ මහාස්ථවිරයන්වහන්සේට සවනලදලියුමක, මහාවිහාරවංශික සංඝයාඅතරේ උපසම්පදා කර්මාසඳහා දළ්හිකර්මයක් ඇත්තේනැත. සිවුරුබැඳීමහා බැමලොම්කැපීමත් පිළිනත් චාරිත්‍රධර්මව තිබූනාය. ඉදින් නුඹවහන්සේලාගේ නිකාය එමමහාවිහාරවංශයෙන් පැවතඑන නිකායක්නම් දළ්හිකර්මය තිබෙන්ට නුපුළුවන. බැමලොම්කැපීමහා සිවුරුබැඳීමත් විද්‍යමානවෙන්ට ඕනැනොවේදැයි; ලියායව්වාඇත. ඒටවජිරඥාණ මහතෙරුන් වහන්සේ ලියාඑව්වාහිබෙණසැටිනම්; නිකායවල පවත්නාවූසිරිත් කල්ත්කලආ ගමධාරී පණ්ඩිතයෝ එකියම්ගම් අයුක්ති අකැපබැව්සලකා නොපවත්වා හැරදමත්. එසේම පරම්පරාවල සමහරරටකනැත්තාවූ චාරිත්‍රධර්මවිනය දෙක්හි යුක්තිවීමසා ඒටඅවිරුඬවශයෙන් වැඩපේණකල පැවැත්වීමටද ඉනින්, බැමලොම්බැම සිවුරුබැඳීම යනමේක්‍රියාදෙක බුඬශාසනයෙ සික්‍ෂුත්ගේ මුල්ධර්මනොවේයි. ලකුණුත්නොවෙයි. මූල්වූලකුණුනම්, අසංරුම්චාරණ ශිමාගොත්ථනාදී වැදගත්ප්‍රධාන ඒවාවෙත්. එබඳුමුල්වූධර්ම යම් සමාගමක පිහිටුව නැත්නම් මුල්ලකුණුනොවන බැමලොම්කැපීම සිවුරු බැඳීම්ආදී ලක්‍ෂුඅපීයක්නැති ලකුණු සියයක් දහසක් නොහැර පැවැත්වූනමුදු ඒසමාගමෙන් ශාසනයට වැඩක්නැතැයි යනමේආකාරයටයි. ලූකින් විජසුහංද, දිගාම ඔයාකාර වෙනෙශගෙණ දක්වූ සාක්ෂී දෙක බෙන්තර තෙරුන්වහන්සේ ලියායව්කල ඒවලතතරදී සියම්රජතුමා ලියාඑවුලියුමේ ඒරටෙත්එවනලද පිටපතඅපවෙත තිබෙනුය. බෙන්තරතෙරුන්වහන්සේ ඒටකිසිත්ලියානොහැර තුෂ්ණීම්භූතවී සිටිබවද දනිමු. එකල උනානාදී නිෂ්ප්‍රයෝජන යයි පිටරටවල උත්තමයෝ ඉවතදමා අවලංගුවීතුබූ මේකාරණාදෙක විජසූහාද, මෙවාරයේත් අවලාරැගෙණ ඒකමසාක්ෂිය ඒසාක්ෂිය බිඳියනොහැකියයි, විවිත්වීමකියන්නේ සියම්රජතුමාඑවූ ලියුමේපිටපතක් අපවෙතඑවා තිබෙණබව නොදනායයිසිතමු. ඒකොහොමවූනත් ඒමලතතරයම අපි විජසූහාද, වත් මන්නදුන්නා. ඉතිත්විවාදය සියම්රජතුමාහා විජසූහාදත් දෙදෙනාඅතරෙයි: සඟලසිවුරට පිටින්බඳිනා අමුතුපටියත් බැමලෝමකැපීමත් දෙක මහාවිහාර පරම්පරාවබවට එතකොට ලකුණුයි. අනිත් ගුණධර්මයකින්

කම්නෑ. සමාගම ඕනෑ එකක් ඔසදෙක කොයිසමාගමකතිබුනත් ඒකම භාවිහාරසමාගමනමයි. මෙසේ දනා ක්‍රමවිධි කථාවිකක් සියම්රටේ මහානිකායේ විසුංග්‍රාම සීමාග්‍රහණයකරණපරිද්දෙන් මෙහිද අස්ගිරිවිහාරයෙහි උපසම්පදාදිකර්ම විසුංග්‍රාමසීමාවෙහිකෙරෙන්, ඒකමසමාගමේ මල්වතුවිහාරෙ විසුංග්‍රාමසීමා ග්‍රහණයනොකොට බඩසීමාවෙහි උපසම්පදාදි කර්මකෙරෙත්. ඉතින් සියම්මහානිකායෙ සීමාවලජනවිධිය වෙනස්කර අමුත්තක්පවත්වන මල්වතුවිහාරපක්ෂය සියම්සමාගමයයි, නොකියා අමුතු නාමයක් නියමකර ඔවුන්ට කිසිකලකවත් සියම්මහානිකාය උරුම නැතවෙනින් කොයිබුදෙ, අමුතු වල්සමාගමකින් පැවතඑන පරම අලජ්ජී දුශ්ශීල රැලක්යයිකීම, විසඩසුහාද, ට උරුමවතිබේ. අස්ගිරිය, මල්වත්තය, යනවිහාරදෙකේම්දැර ලක්දිව අන්කිසිතැනෙක උපසම්පදාකළනොහැකියයි, කීර්තිශ්‍රීරජතුමාගේ අණද, වැලිවිටසරණංකර සංඝරාජ මහාස්වාමීන්වහන්සේ ප්‍රධානකොට ඇතිසංඝයාගේ නියමයද කඩකරදමා දැනටමදකාලයකපටන් මල්වතුවිහාරපක්ෂයෙ පාතරට ඇතම්කෙණෙක් කැලණිගඟෙ උදකුක්ඛෙපසීමාවෙහි උපසම්පදාකෙරෙති. ධම්මචෙතියරජහුගේ අණපරිද්දෙන් බැමලොම්නොකපණ පටිනොබඳින මහණුන් විහාරපරම්පරාවේනොවෙන තී වචනාය මෙතිද්ත් විසඩසුහාද, එසේමකල්පණාවටගෙණ කීර්තිශ්‍රීරජතුමාගේ අණකඩකර අමුත්තක් මෙපරිද්දෙන් කරන්නෝ සියම්මහානිකායෙ වියනොහෙත් සියම්නිකායිකයෝනම් මුලකිරජ්ජණ කඩනොකරත. ඉන්නිසා මෙදසවල් වෙනිත්පිටවල්සමාගමකින් පැවතඑන වල්අයවල්ය. ඒදතනෑණ්මට සිහිඅැන්තන්ට මෙනදියෙහි උපසම්පදාකරණලකුණන් මහණුම්රඅැර අමුඅඉඩ ක උපසම්පදා කිරීමට පටනගත්ලකුණත් හොඳටමඇත. මෙලකුණ මේසාක්ෂිය බිඳිය නොහෙයි කීම බාරයි. මෙබඳු රාජකාරියක් විසඩසුහාද, ට බාරවන බවක් කිසිසේත්නොසලකා ඉහතකිලෙස කථාමාගයක් යොදාගත්නිසාද නාට මෙපලවෙනඑවානමයි. තවද, ඉහතකාලයෙදි සියම්සමාගමේ තෙරුන්නාන්සේලා බඩාබඩකීසිමසීමාවකට නොපැමිණ වස්විසූ ඒඒස්වානාවලට අශුඩග්‍රාම වලදී සිතාය දෙසා කටයුතු, සඳුන්ගිපිල, තමියයි විකාරයක් සිරිතවශයෙන් අගම්නොදත පැවැත්වූවෝය. අමරපුර රාජධානියටපැමිණී උන්නාන්සේලා උපසම්පදාවලැබ අවුත ඒමසමාගම අපේරටේපැවැත්වීමට පටන්ගත්පසු සැරිනවසතුරැගෙණ සීමාවලට එළඹෙන්නාවූ අමරපුරසමාගමේ ස්වාමීගැනදුක මුලකීසියම්නිකායෙ තෙරුන්නාන්සේලාත් ඒයේකසිනවසතුරැගෙණ සමාවලටපැමිණ විතයකර්මය කර්මවපටන්ගෙණ මේවනාතුරුම එසේකරමින් මුලදීපැවැත්වූ සිරිතඋපසම්පන්නානට කියනපමණවත් අප්‍රියව සිටිනාබැව්දනිමු. මේ තෙරුන්නාන්සේලා සියම්සමාගමේ පැවැත්ම හැරදමා අමුත්තක්කරණ නිසා සියම්සමාගමයයි කීමටසුතුසමක්නැත. එක්කෝ සියම්සමාගමේ

නොවෙයි. මේතෙරුන්නාන්සේලා කොයිසමාගමකද ගනබවනියමකිරිමත් විසඳුසුනාදමම බාරවඇති. පළමුසියම්සමාගමේ තෙරුන්නාන්සේලා තනිපටසිවුර සාංඝාටිනාමයෙන් අධිෂ්ඨානකර දෙපටසිවුරයයි, දෙකටනමා පොරවති. අමරපුරසමාගමේ හිඤුහු එමරටින් දෙපටසිවුරුමැහිමඉගෙණඅවුත් මෙහිදී දෙපටසිවුරු මැහිමටපටන්ගත්පසු සියම් නිකායිකයෝත් දෙපටසිවුරුමැසීමට දැනව දනාවනියම්දෙපටසිවුරු අධිෂ්ඨානකර පොරවති. මෙසඳහාත් සිවුරුදෙකට නාමපෙරවූ සියම්නිකායේ පුරාණතෙරුන්නාන්සේලාගේ සිරිතකඩකරදමා දනාවමේ කිසිඅගමකට නැති හිතුවක්කාරකමක් පිටරටවල මෙලෙච්ඡ ජාතිවල අන්‍ය නිකායකයන්ගෙන් ඉගෙණ දෙපටසිවුරුමහා අදින්නෝ පළමුපැවති සියම්සමාගමේනොවෙයි; කොයිබඳ වල්ලුරන්වූවක දයවිල්යයි කිමට මේලකුණම ඇත. සියම්සමාගමේනම් ඒ පළමුතුවුලකුණු එසේමතිබෙන්ට ඕනෑයයිනොකියානම්, විසඳුසුනාද, ට වෙනකියන්ට කිසිත්නෑ—

බැමලොම්කැපීමත් පව්බැහීමත් කරන්නෝ මහාවිහාරපරම්පරාවේ බවටත් එසේනොකරන්නෝ වෙනින්අමුතු වල්හිතුවක්කාරසමාගන්වලින් පැවතඑන පිරිසබවටත් ඉහතකී ක්‍රියාදෙකම ලකුණුනම්, ආචාර්යපාරායකී පරම්පරාවශයෙන් පැවිදිඋපසම්පදා ලබාගැණීමෙන් ගුරුපරම්පරාවක්‍රමයෙන් පිළිවෙළට පරම්පරාවෙන් පරම්පරාවදක්වා පැවතඑමිවශයෙන් ගුරුපරම්පරාව දනගැණීමක් ඇත්තේනැත්නම් අපවිසින්මෙහි දක්වනලද යථෝක්තකරුණුත් එසේමයි. ඒකිසිවකුත්වෙනස්වීමට හේතුවක්ලැබෙන්ට නුපුළුවනි—

තවද, විසඳුසුනාද, හැත්තෑතුන්වෙනිවර්ෂයෙ මැයිමස විසිදෙවෙනිදින ලක්රිවිකිරණේ කියාතිබෙණසැටි මෙන්න ☞ "මහාවිහාරපරම්පරාව සියමටගියසැටි දනගන්ඩඕනෑනම්,

> යොනකරට්ඨවාසිනො මහාධම්මගම්භීරත්ථෙරමහාමෙධංකරත්ථෙරා ච සද්ධිං බහූහි භික්ඛූහි සීහලදීපං ගන්ත්වා තතො පුනාගන්ත්වා සොක්කතායඤ් නගරම්පත්වා තත්ථ නිසීදිත්වා * * * සාසනං පග්ගණ්හි එවං යොනකරට්ඨෙ සාසනං ඨිතං „

යනාදීවශයෙන් කියාතිබෙන්නා, මේපාළිවාක්‍යගම බුරුමරට ශාසනවංශයෙන් උගෙණ මෙහිටහාතිබෙණබැව්පෙණේ. එහෙත් ශාසනවංශයේ පේණපරිද්දෙන් අභිප්‍රායප්‍රකාශවන හැටියකටනොලියා තිබෙණප

දන්අන්ඇර අමුතුපදන්යොදා වෙනස්කර තිබෙණබවකියමු. එසේකලේ නම්, එහි දැක්විකමීග සියම්රටේ පැවතිසැටි ප්‍රකාශවතිබෙණහෙයින්ද, මහාවිහාරපූරම්පරාවක් අත්වූබව නොපෙණෙනහෙයින්ද, වියයුතුයි. ඒ කොයිලෙසවූවත්, එයින්කම්නැ. විසුවසුහාද, බුරුමරට ශාසන වංශය බොරුමල්ලය ඒකෝකීම් වල්හැලියයි, ඒපොතට අපමණ ගැරහුම්කලා-දැක්ඒකලගැරහුම ඔහුටමසිහිනැත්තෙක්මෙන් අපටත්ඒසිහිනැතිවෙන්වඇතැයිසිතා අදහසින්දෙ, ඔහුගේවංශය පෙන්වන්ටය කියන්ටයයි සත්‍යවිභූෂණ, කාරණ හිරිහැරයෙන් මිදෙන්ටතුප්පුළුවන්ව පෙන්වාගැණීමටත් අනියම්වංශයක්වත් තමන්ටනැතිව බොහෝසෙයින්මිරිකී වෙහෙසවිඳ කම්කවිගේ මහාවිහාරවංශයතමයිකියා අල්පශ්‍රැත ගිහිපැවිදිසමූහයාමුලාකරවීමට මෙපමණඇතැයි සිංහලවිපගෙහි නායකසියම්රටනාමයත් යොදා ඔය මහවිහාරපරම්පරාව සියමටගියානැවිතමයිකියා බුරුමරට බොරුමල්ලේ වල්හැල්ලෙන්ම යන්තම්පිරිමසාගෙණ ගැලවීගත්ට පුලුවන්දෙසිතා ඒකමටදගත්තා, අඹගහවත්තේ උන්නාන්සේම බොරුමල්ල බඳගෙණ නාවානම් ඔයවංශයඒකෙන්පෙන්වාගන්නේකෙසේදැයි නොදනිමු. කැමතිවිටක පෙන්වීමට වංශයක් තිබෙණවාගයි ඉහාරසකරකර කිව්නාවූත්මේබොරුමල්ලයකියා පිළිකුල්කර ඉවතලූඒකේම නැවතඅතදමා වංශයපෙන්වීමට ගියඑකෙන් වංශයදැක්වීමට මේඇරවෙන අමුතුලඬමක් ඇත්තේමනැතගනු හොඳාකාරම අපටප්‍රත්‍යක්ෂවූනාබුරුමරටශාසනවංශයට බොරුමල්ලයකිකිව් ශාපයෙන් දැනටඒකේම එල්ලීගැලවීගන්ට සිදුඋනාවෙන්ටඇති. විසුවසුහාද, වරදවා ලියාතිබෙණ ශාසනවංශයේ පාඨ අප්මෙහි ඇතිසැටිලියන්නමු.

" තදා මහාධම්මගම්භීරත්ථෙරො මහාමෙධංකරත්ථෙරො
චාති වෙථෙරා යොනකරට්ඨතො සද්ධිං බහූහි භික්ඛූහි
සීහලදීපං අගමංසු තදා ච සීහලදීපෙ දුබ්භික්ඛභයෙන
අභිභූතා හුත්වා තතො සියාමරට්ඨෙ සොක්කතාන
ගරං පුන අගමංසු තතො පච්ඡා ලකුනනානගරං
ගන්ත්වා සාසනං පග්ගණ්හනානං ලජ්ජීපෙසලානං
භික්ඛූනං සන්තිකෙ පුන සික්ඛං ගණ්හිංසු තෙ ච
ථෙරා සියාමරට්ඨෙ යොනකරට්ඨෙ ච සබ්බත්ථ සාස
නං පතිට්ඨාපෙසුං "

එකල්හි මහාධම්මගම්භීරත්ථවිරද, මහාමෙධංකරත්ථවිර දැයි, මේතෙරුන්නාන්සේලා දෙනම බොහෝභික්ෂූන්හාසමග යොන්රටින් සිංහ

ළංචීපාව ගියාහුය. එකල්හිද ලක්දිව දුර්භික්ෂභයින් මිරිකී ලක්දිවින් සියම්දෙශයෙහි සොකාතානුවරට නැවතගියාහුය. සොකාතානුවර කොරෙන් ලකුනනනුවරටගොස් ශාසනයට සංග්‍රහකරන්නාවූ ලජ්ජීප්‍රිය සිලීභික්ෂූන්ගේ සමීපයෙහි දළ්හිකර්මය ගත්තාහුය. ඒඅවුරුදෙදෙනා සියම්රටද, යොන්රටද, සියළුතැන්හි ශාසනය පිහිටුවූවාහුය. දන්මෙසින්සෙවීය යුතුවතිබෙන්නේ මහාවිහාරවංශය සියමටගෙණගියාහැටියක් මෙහිප්‍රකාශවේදනැද්දයනුයි. මෙහිනාම්ප්‍රකාශකළ ඇවිරදෙනම යොනකරටේ සුබකොළාහලයනිසා තවන්භික්ෂූන්හාසමග ලක්දිවටආවොයයි කීපමණක්ම ලක්දිව මහාවිහාරපරම්පරාවෙන්වත් වෙනපරම්පරාවකින්වත් මහණකමක්ලබාගත්සැටියක් කියානැතිවග තිතටගතයුතු එකක්, එසේ යොන්රටින් ලක්දිවටඅවූන් නිකම්මහියමටගිය නොරුත්තාන්සේලාගේ කථාව පෙන්වා මහාවිහාර පරම්පරාව සියමටගියහැටි දනගන්ටඹිනැනම් කියාත්ලියාතිබෙණවා. ලක්දිවටඅවූන් ගියපමණා එතිතුබුමහාවිහාර පරම්පරාව ඔවුන්හාසමග ඇන්ටපුළුවන්හැටි බාගවෙලාවට විසඳිසුහෑද, ට දැනුම්ඇති. අනේඅපට නම් ඔයින්ලක්දිවතුබු පරම්පරාවක් එහිගියහැටියක් පෙණෙයනෙනෑ. ඉහින් සියම්මහානිකාය පිරිසිදු මහාවිහාර පරම්පරාවෙත් පැවතඑනනිකායකැයිකියා ප්‍රසිද්ධකරතුබුයිම් රාජ්‍යම තුච්ඡවූබොරුඹව දැන්හොඳින්ම පෙණිගියා ඒකත්එසේම සිත්තිගිටුවාගැණීමට ඕනැකරණඑකකි. ලක්දිවඑකල දුර්භික්ෂකාලයක්වතුබුබැවින් ඒතෙරුන්නාන්සේලා සියම්රටේ සොකාතානුවරටගොස් නැවතඑසින් ලකුනනනම්නුවරටගොස් එහ්ලජ්ජීභික්ෂූන්ගේ සමීපයෙහි දළ්හිකර්මයගෙණ සියම්රටේද, යොන්රටේද, ශාසනයපිරිසිදුකර ඒසමාගමපිහිටුවූබව කියෙසින් ලකුනන, නුවර යම්නිකායක්හිටුනානම් සියම්රටේපැවතීමට ආවේ ඒනිකායයි. ඉන්නිසා, ලකුනනනුවර කොයිරටකදයනු දැනගතයුතු එකකි.

“ යොනකරට්ඨෙ ලකුනනනගරෙ ජිනචනෙතා පංචව
ස්සසතෙ මණීමයං බුද්ධපටිමං මාපෙත්වා වියාතමම
දෙවතුතෙතා නාගසෙනතෙථෙරස්ස අදාසි ,,

සනාමේතීමෙන් ලකුනනනුවර යොනකදෙශයෙහි නුවරක්බව පේණවා, ඉහතකීඅවිරුදෙනමසහිතභික්ෂූනු මෙමලකුනනනුවරදී දළ්හිකර්මය ලබාගෙණ ඒසමාගම සියම්රට සැමතැනම පිහිටෙව්වෝයයනන්මෙන් සියම්රටමහානිකායත් ලාවාරටසැමතන්හිම පවත්නා සමාගමත් දළ්හිකර්මසමාගමක්බව පැහැදිළිව කොටින්ම පෙණීගියා. එපමණක්නොව ලකුනනනුවර එකලවිසු සංඝයාත් දළ්හිකර්මනිකායක්බවත් ඔප්පුවූනා. සියම්රටට මහාවිහාරපරම්පරාව ගියසැටි පෙන්වීමපිණිසයයි ගෙණහැර දක්වූ වංසගමබැළුවාම ගොහින්තිබෙණඑක තමාටඅම්හිරිවූ පිළිකුල් කා

රණ දුෂ්ප්‍රතිපත්තියක් සියම්රටේපුරාණකාලයෙහි මෙසේපැවතුනාවූ දළ්
ඟිකම්ය සම්නැතියකින් අපිදක්වාලිමූනම් ඒ විසංවසුහාද, ඕයබොරුමල්
ලේ වල්නැල්ලක ඕවාපිළිගන්නෝ නව්දකියා හෙළාදක ඉටතදමණවා
ඇති, ඡෙනිදිදූන් විසංවසුහාදම තමන්වංශයයි අගයකරපෙන්වා තිබිය
ඒකම් අසත්‍යයයි කියතොත් තමාම දළඳකම්ය උරුමකරගත්බව දූනී
ම බෞපොතකියවන්නාවූ සිහිඇත්තවුන්ට විසංවසුහාද, ගේ කපටිභාවය
නියතකරගැණීමට සාක්ෂියකි. පිරිසිඳුනිකායකතම් දළඳකම්යඇත්තේ
නැතැයිකීමට ඇතිපම්ණවූවචනවලින් පිළිකුල්කල ඒමකම්ය පිරිසඳුයකි
යත හරිශාසනපරම්පරාවවූ සියම්මහානිකායෙකින් මූලදිපැවිතිඒනනිසා
ඒනිකායේඅයත් දුසීලවල්ලුම්යයිනොකියා විසංවසුහාද වෙතදූත්කුම්ක්
නම්කියනවාද ? තමන්නිකායට දළඳකම්යමූලදී ඇතිවතුබූසැටි තමාම
කියාතිබෙණ මේඉඩම මේනිච්චවාදයෙහි ප්‍රතිඵලලත් ඉනාවැදගත් නැ
නක්යයි, මෙයකියවන්නෝ තදින්අරමුණුකරගණීත්යයි සිතමු.

බුරුමදෙශවාසීනු " මෙලච්ඡ ජාති, යනැයි, විසංවසුහාද, කියාතිබෙණ
කාරණය දූත්මෙතිදී විභාගකරබැලීම සුදුසුයි. මෙලච්ඡ, නාමය දෙශ
ඥදයෙහි පෙණෙ,

" හිමවද්වින්ධ්‍යයො මීධ්‍යං යත්ප්‍රාගවිනශනාද පි,
ප්‍රත්‍යගෙ ච ප්‍රයාගා ච්ච මධ්‍යදෙශඃ ප්‍රකීර්තිතඃ,
ආසමුද්‍රා ත්තු වෙ පූර්වාද සමුද්‍රාත්තු පශ්චිමාත්,
තයොරෙ වා න්තරං ගිරියොරාර්‍යාවර්තං විදුර්බුධාඃ,
කෘෂ්ණ සාර සතු චරති මෘගො යත්‍ර ස්වභාවතඃ,
ස ඥෙයො යඥියො දෙශො මෙලච්ඡදෙශ ස්ත්වතඃ පරඃ ,,

යත්තෙත් උත්තර දක්ෂිණ දෙදිශාවෙත් හිමාලවින්ධ්‍යපර්වතදෙක මැ
දකුරැලෙ ක්ෂත්‍රයකෙරෙත් පූර්විදිග ගංගායමුනානාදිදෙක එකාවබවූ සථාන
යවන ප්‍රයාගතීර්ථයකෙරෙන් අපරදිග මධ්‍යදෙශයයි කියනලදි. පූර්විදි
ශාවකෙරෙත් සමුද්‍රයදක්වාද, උතුරුදකුණුදෙදිශාවෙන් එම්හිමාලවින්
ධ්‍යපර්වතදෙදෙනාගේ මධ්‍යයතෙම ඇයර්‍යාවර්තනම් පෘණියතයෝදනින්, කෘ
ෂ්ණසාර, නම් මුවවගීයතෙම යම්තැනෙක්හි ස්වභාවයෙන් වෙසේදහෙ
තෙම යාගකිරීමට සුදුසු දෙශයයි දතයුතුයි. එතැන්පටන් මෙලච්ඡ
දෙශය මෙසේ ව්‍යවහාරයි. මේක්‍රමයට සියම්රටලක්දිවඅැදි අනනාන
දෙශයන්ට ශාධාරණව තිබෙණ මෙලච්ඡ නාමය තමන්ට නැතිසේ
බුරුමරටට එලාතිසැටිනොවෙයි. තමන්කෙරේඅවිද්‍යමානවූ දොෂයක්අනුන්
ටකීමෙත් අනුන්ගේ ලඥ්ජය ප්‍රකාශවන බවත් තමන්ට කිම් දොෂය

ක් අනුන්ටකීමෙන් තමන්ගේලාමකභාවයම ඥාවණ්‍යත්තන්සලකණ්වම ත් කල්පණානොකර විසච්ඡුගාද, මෙලච්ඡ, රටවාසිකෙනෙක්වසිවගෙ ණ තමන්ගුරුවූ මුල්රටත් එසේම මෙලච්ඡරටක්වනිබියදී බුරුමරටටත් නාමය ව්‍යවහාරකලකාරණයට අපිකෙසේනම් ප්‍රසංසාකරුමුද?

තාවද, "කර්තව්‍යමා චරන්කාමම කර්තව්‍යම නාචරන්,
තිෂ්ඨති ප්‍රකෘතා චාරෙ ස වා ආර්ය ඉතිස්මෘතඃ ,, යි

නොකටයුක්තෙනි ඒකාන්තයෙන් නොහැසිරෙන්නාවූ. කටයුක්තෙනි හැසිරෙන්නාවූ මනාපැවැත්මෙහි පිහිටිතැනැත්තේ ආර්යනම්වෙයිකියා තිබෙණ නියාවට නොකටයුක්තෙනි හැසිරෙන්නෝ මෙලච්ඡ ජනයෝ වෙත්. ඒක්‍රමයට බූරුම්දෙශවාසි මණුෂ්‍යයෝ මෙලච්ඡනම ඉසිල්මට සුදුස්සෝනොවෙත් මින්දූරටත් මේ මෙලච්ඡ ජාතියසඳහ විස්තරකථාවක් ගෙණහැරදක්වීමට කැමැත්තෙමි. ඉක්ෂ්වාකරජනුගේ පුත්‍රවූ බාහුක යනනම් ඇති රජනුගේදෙශය, හෛහය, දෙශ, තාලජංඝදෙශ, ශකාදෙශ, ය ය නමේ දෙශවාසින්විසින්, යවන පාරද, කාම්බෝජ, පහලව, ඛශ, යන මේ රටපහේ සෙනාගහාසමග පැහැරගත්කල්හි බාහුකරජ ප්‍රුකමපැමිණීයේ වනයටගොස් නැසුණේය. සතුරැකීසමිඳ විසින් පළමුකොටදෙනලදවිෂඇත්ති ද්‍රැගැප් සහිතවූරාජදේවියද රජපසුපස්සේව නයටගොස්රජහුගේ අඳනණකානායකොට ඖර්වනම් සෘෂිහුගේ ආශ්‍රමයෙහිවැස ගබ්ය මූතුරුවාජිෂ්යහාසමග කුමාරයෙක්දසූතකලාය ගර, යන නම්ඇතිවිෂය හාසමග උපන්බැවින් ඔහුගේනාමය, සගර, නම් වූයේය. ඖර්වනම්සෘෂිහුද ජාතකර්ම්යකොට උතුම්මේකුමාරයාහට සියලුවාතුවේදයහදුරවා අසුධසිල්පයෙහිද හික්මවූයේය. සියළුබලයෙන් සමන්විතවූ මේසගරකුමාරයා විසින් ශක, යවන, කාම්බෝජ, පාරද, පහලව, යනමොවුන්සහිතවූ සියල්ලෝ බඳීනුලටන්නාහු, ඖර්වසෘෂිහුගේ සරණගොස් වැන්දහුය. සෘෂීතෙම ඔහුන්ටඅභයදී සගරකුමාරයා වැලැක්වූයේය. සගර තෙම ආචාර්යයාගේ වචනයඅසා ශකදෙශවාසින්ගේ ස අඩිසක්මුඩුකිරීමටද, යවන, කාම්බෝජදෙශවාසින්ගේ සියළුඉසමුඩුකිරීමටද, පාරද, දෙශවාසින්ගේ ඉසකේමුදුනැබීමටද, පහලවදෙශවාසින්ගේ රැවුල් නොකැපීමටද, නියමකොට වේදපුනුණුකිරීම්ආදියෙන්ද, තොරකාළූයේය—

"තතඃ ශකාන් ස යවනාන් කාම්බොජාන් පාරදාංස්තථා
පහ්ලවාංශ්චෛව නිඃශෙෂාන් කර්තුං ව්‍යවසිතඃකිල
තෙ බධ්‍යමානා වීරෙණ සගරෙණ මහාත්මනා,
වශිෂ්ඨං සරණං ගත්වා ප්‍රණිපෙතු මනීෂිණං,

වශිෂ්ඨ ස්තු ඵ තාන් දෘෂ්ට්වා සමයෙන මහාද්‍යුතිඃ,
සගරං වාරයාමාස තෙෂාං දත්වා භයනාද්‍ද,
සගරඃ ස්වාම්ප්‍රතිඥං ච ගුරෝ ර්වාක්‍යං නිශම්‍ය ච,
ධර්මං ජඝාන තෙෂාං වෛ වෙශාන්‍යත්වං චකාර හ,

අර්ධං ශකානාං ශිරසො මුණ්ඩයිත්වා ව්‍යසර්ජයත්,
යවනානාං ශිරඃ සර්වං කාම්බොජානාං තථෛව ච
පාරදා මුක්තකෙශාශ්ච පහලවාඃ ස්මශ්‍රුධාරිණඃ,
නිඃස්වාධ්‍යාය වට්කාරඃ කෘතාස්තෙන මහාත්මනා ,,

යනාදින්මෙහි ප්‍රකාශවූපරිද්දෙන් කාම්බොජදෙශයසහිතවූ මේරටවල සමූහයාට ම්ලෙච්ඡ, නාමයද, මෙසේසගරරජවිසින්ම නියමකරණලදැයි විෂ්ණුපුරාණ, යෙහිකියේය. "පඤ්චනදං ස මාරභ්‍ය ම්ලෙච්ඡාද්‍ද සකීර්ණපූර්වතඃ, කාම්බොජදෙශ,, යනමෙහි කාම්බොජදෙශය ම්ලෙච්ඡරටක්යයි පෙණීතිබෙණබව දුටුකල අහකතුබු බුරුමරටනැතිනමක් අමුතුවෙන් පවතිඳින්වගියනිසා මේවා එළිදරව්වූනායයි පසුතැවිල්ලටකාරණයක්ව තිබෙණවාදැනිම අපටද අනුකම්පාවට කරුණකි. සියළුරටආත්බූකල ම්හරජවරු දූත්බැන්කොත්නුවරට පැමිණීමට පළමුවීනු අයොධ්‍ය මහනුවර මේකාම්බොජදෙශයෙහිනිසා ම්ලෙච්ඡනාමය සගරරජහුගේඅනාවූ පරිද්දෙන් මෙතෙක්කල්තිබීආ සියම්රටටතිබීමටනොහැර බුරුමරටට අයිතිකිරීමට කොපමණදුරට වෙහෙසගත්තත් බැරිවැඩකි. මෙසේකිසිම ම්නැතමක්නැති ම්ලෙච්ඡනාමය ගඟිාවශයෙන් උරුමනැති බූරුම රටට අයිතිකර කථාකළනිසා දැනටඅපි, විසවසූභාද, ටකිසිවක්නොජයා, සියම්දෙශයට ම්ලෙච්ඡ නාමයත් ශාසනාපුහුණුකිරීමත් තහනම්වර්ගයක්ය යන්නන් සැමවිටම යුතුවූපරිද්දෙන් ව්‍යවහාරකිරීමට කල්පණාවටගනිමු—

සොභිතසාමි, දීපමුනි, සාමියයි මහානිකායේ ත්‍රිපිටකධාරි තෙර දෙනමක් සියම්දූත්තාවව ඇසූවායයිකිව්වේ සවප්ණයක් වෙන්ට ඇති. එමදෙශයෙහි වජිරඥාණමහතෙරුන්වහන්සේ ලියාඑවාතිබෙන්නේ, සංඝරාජ විහාරයසහිත මහානිකායේ ප්‍රධාන විහාරහතරේ ලංකාවෙන්ගිය සිංහලජණයාහාසමග පාලිභාෂාවෙන්කථාකිරීමටහැකිකෙනෙක් ලැබුනේ නැත යනුයි. ඒවාඇසූඅපෙකන්වලට ඔයකියන සකානිකාධික සන්ගේ ත්‍රිපිටකධාරිභාවය නොවැවේ, සොභිතසාමි, දීපමුනිසාමි, යන නම්ඇති ත්‍රිපිටකධාරිතෙර දෙනමක් මහානිකායේ සිටිනාබවක් ලියාඑවානැතැයිකී, සත්‍යවිභූෂණ, වත් ඞාංචසූභාද, මොක මොකවත් කිව්වාමිස

සීඅම්රටවාසීන්ගේ කිමකින්වත් වෙනසම්සැලකියයුතුවූ ඉඹමකින්දක්වා පිළිගතයුතුහැටිකලේනැහැ. ඉන්නිසා සියම්රජතුමාගේ අත්සන්සහිත ලිසුමේ කිම්වලටවිරුඬව විසඩසුහාද, ගේ කටටආපමණින් කියනබොරුප්‍රලාපවලට අපි නොරැවටෙමු. තවද, සඟළසිවුරට පිටින් බඳිනා විසඩසුහාදලාගේපටිය බුදුබනෙන් කියානැතිබව මේවලන්නාවූන්ට අවබොධකරගැණීමපිණිස ශාසනයෙහි භික්ෂූන්විසින් ගුරුවරයන්ට කටයුතුවූ වත්දෙශනාකරතිබෙණ බුඬවචන පඞ්ක්තියක්දක්වමි.

"සචෙ උපජ්ඣායො ගාමං පවිසිතුකාමො හොති නිවාසනං දාතබ්බං පටිනිවාසනං පටිග්ගහෙතබ්බං කායබන්ධනං දාතබ්බං සගුණං කත්වා සංඝාටියො දාතබ්බා ධොවිත්වා සඋදකො පත්තො දාතබ්බො එත්තාවතා නිවත්තිඃසති" යි

ඉඳින් උපාධ්‍යායනෙම ගමටයනුකැමතිනම් ශිෂ්‍යයාවිසින් අඳනයදියයුතුය, ඇඳලාතුබූ අඳනය පිළිගතයුතුය, පටියදියයුතුය, නැවත තනිපටසිවුරහා දෙපටසිවුරයන දෙක එක්කොට ගලපාදියයුත්තාහුය, සෝද දියසහිත පාත්‍රයදියයුතුය, මෙපමණෙකින්නැවතියයුතුවේ, අඳනය මතුපිටබැඳයුතුපටිය ගෝලයාවිසින් ගුරුන්නාන්සේට දියයුතුයයි මෙහි දක්වූ පමණමිස සඟළසිවුරටපිටින්බඳින අනික්පටියක් දෙනාඅඳුමක් මෙහි දෙශනාකරනැතැයිසිහියේ පිහිටුවාගතයුතු. මේසඟළසිවුරට පිටින් බැඳයුතුයයි–විසඩසුහාද විසින් කියනලදපටිය බුඬදෙශනාවේ නියමකරනැති එකක්බව මෙහිදී පැහැදිළිවපෙණීගියාය. අඳනය පටිය තනිපටසිවුරහා දෙපටසිවුරයනමේ පිරිකර ගනනාදෙනඅතරේ අනික්පටියක වගත්ස්යානැත්තේ එබඳුපටියක් භික්ෂූන්ට නැතිබැවිනැයි දතහැකිවතිබේ. නුමුත් මේපටියමහාවිහාරපරම්පරානුගත මනාවූ ගුරුපරම්පරාවලඅයටනම් ඇත්තේමය; ඒකමහාවිහාරපරම්පරාවබව ඇඳිනගැණීමට තිබෙණ වැදගත් ලක්ෂණයයි; මනාවූගුරුපරම්පරාවක්නැතිවල්අයවළුත්ගෙන් පැවතඑනනාවූන්ට මේලකුණඇත්තේනැත; එයින් ඔවුන්ඇඳිනීම ඉතාපහසුයයිකියාතිබෙණ කිම්පිළිගතයුතුනොවන ප්‍රලාපබවකියමු; එහෙයින් මේ ලකුණුවලින් පාපයන්ගෙන් පැවතඑන වල්පරම්පරාවක අයවල්යයි ඇඳිනගතයුතුය යනුකිවාටකිසිවරදක්නොපැණේ. බුදුබනෙනැත්තාවූ මෙබඳුදුෂ්ප්‍රතිපත්ති මනාවූප්‍රතිපත්තියයිකීමහා ඒපැවැත්වීමත් දෙකම අධර්මවාදී පාපයන්ගේ ධර්මයෙකි. මේපටියෙහි ප්‍රයොජනය සීමාමාලකයෙහිදී පාත්‍රාසිවුරු අත්පසෙන් දුරුනොවීපැවතීම්ආදියයි; යනු, විසඩසුහාදගේකීමඅපිදුටුයෙමු. විසඩසුහාදලාගේ උපසම්පදාව ලබාගැණීමයයි කියනකාලයෙහි පාත්‍රය උපසම්පදාපෙක්ෂයාගේ ශරීරයෙහි පටියකින්බඳිති; ඒසඳහා මේ කියනලදී; සිවුරුශරීරයෙහි ඇඳපොරවාතිබූනාම අත්පසේනොතිබී කොහේයෙද්ද; පාත්‍රය ඇ

ණත් බැඳගෙණ එහිවැදීම්ආදි ක්‍රියාවන් විකාරසේ නොකළාට ඒකඅත්පසේ
ඒමදවෙලාවතුලතබාගැණීමටඇති අපාසුවකවරේද; හොඳයි ඔයකාලයේ
හි ප්‍රයොජනගත්පටිය නිතරමබැඳගෙණ හැසිරීමට තිබෙණ ඕනෑකමතුම
ක්ද; ක්‍රියාපාසුව පිණිස අනුහොඳත් ඇඳුම් පැළඳුම් පාවිච්චි කිරීමට බලය
කාගෙන්ලැබුනාද; ක්‍රියාපාසුවසඳහා පටිය බඳිනවාය යන උත්තර දීමෙ
න් බුදුන්ගේ අනුදැනීමකින් නොවනබව ඔප්පුවුනා; ඉතින් අනික්වත් ඔ
හොමතමයි, ඔයපටිය බැඳීමට තිබෙණ යුතුකම බනෙත් පෙන්නුහැටි ඉ
තානින්දිතයි; මේ බුඩාගම එහෙනම් ඒඒඅගාට පාසු පාසු හැටියට ඕනෑ ඕ
නෑ අන්දමට මනාපමතාපිට ක්‍රියාකරන්ට පුළුවන් එකක්, එහෙමණම් ඒ
ක විශ්වසුහාද ටත් තමන්නිකායේ පාපිත්ටත්මිස විනයානුකූලව පවතින්
නවුන්ට රුචිනොවේ; ඔහොමකියන විශ්වසුහාද ආයේවිටෙක මනටනක්
විනයක්පාතිටිනවා; මේගැනම විශ්වසුහාද කියන පටියත්සමග අටපිරික
ර නවපිරිකරවන බවත් නොපෙණුනා පුදුමයි. ඔයපටිය බුදුන්කාලයෙහි
අයාජී–පුනබ්බසුක –මෙත්තිය–භුම්මජක–ගන නොහික්මුනු අලජ්ජීඋන්
නාන්සේලා බැන්දහැනදී බුදුරජාතන්වහන්සේ ඒබවදැනඔවුන්ට නිග්‍රහ
කොට "න සිඤ්චවෙ කටිසුත්තං ධාරෙතබ්බං,,යි, මහණෙනි කටිසූත්‍රයනෙ
වත්හාදයෙහි වලපටත්පාත සගළසිවුර මතුපිටබඳිනාපටියක් නොබැන්ද
යුතුයයි තහනම්කර වදාරාතිබෙණ වැදගත්, ඛන්ධක, පාලිආදිපොත්වලහි
ටෙණ ශික්ෂාවන්කඩකරන්නාවුන්ට අපිතුමට නිග්‍රහකරමුද.

බැමලොම් කැපීම මනාවූ ක්‍රියාවෙකැයිහැඟවීමට–විශ්වසුහාද–අප
මණකරුණුකීයේය; ඒගැනනොයෙක්වර නොයෙක් කාරණ ලියාතිබෙ
ණවාදුටිමු, බැමනොකපා වවාගෙණ බැම් නටව නටවා ඉත්නෝ බුඩගා
සණයේශුඩවූ පිරිසිදු පරම්පරාවක්ඇතෙනානොවෙත්යයි නොයෙක් ලෙසි
න්ගහිාකර යොනුත්හාසමාතායෝයයි කියාත්වුනි. ඒකීම්ඇසූ සමහර නූග
ත් සමූහයාට බැමලොම්කැපීමත් ආගමයෙහිනියමවූ සුළුසු චාරිත්‍රයෙකැයි
සිහියන්ට ඇතයනකල්පනාවෙන් එබන්දන්ගේ සැකදුරුවීම ප්‍රයොජන
කොට ඒසඳහාමෙහි කරුණුලිවීමට පටන්ගනිම්. බැමකැපීම කටයුතුයයි කි
යනලද–විශ්වසුහාද–විසින් බැමකැපීමකළ ඉඩමක්හෝ ඒයකටයුතුයයි ද
ක්වාතිබෙණ පොතක්හෝ නොදක්වනලද්දෙය— තමන් ගුරුපරම්පරා
වේ බැම කැපීම පවත්වාඑනබැවින්දෝ එයමනාචාරිත්‍රයයි හඟවනුපිණිස
තමාගේ ස්වයම්බුද්ධියෙන් හෙවත් තමන්කල්පනාවෙන් එහි ගුණකියයි;
බැමලොම් කැපීම; සුදුසුයයි කියනලද–විශ්වසුහාද–විසින් තමන්කීම පි
හිටුවීමපිණිස ඒකීම අසවල්පොතේ මෙසේ සඳහන්වතිබෙණවායයි කියයු
තුවමතිබුනා; එබඳු කීමක්කිසිලෙසකින් නොදක්වනලදබව මඉමෙහිනො
කිව්නමුත් ඒලියුම්කියූ අයවලට සිහිඇති, ඒමෙම්වද හොඳකාර සැලකිය
යුතු, බම්විනාසදෙත්හි පෙළපොත්වල ඉසඹත්රැවූල්තපා ශාසනයේ පැවිදි

බූවත් ප්‍රකාශවත්නාවූ "කෙසම්ස්සුං ඕගාරෙත්වා" යනාදිය සියගණන් ඉඩම්වල පෙණේ; ඒ කිසිතැනෙක බැමලොම් සඳහන්කර නැතුවාමයි–ඉසකේකැපීමට බැමලෝමත් උපචාරවශයෙන් ගතයුතුයයි–විඥසුහෘද–කී යයි; හොඳයි එපඋපචාර වශයෙන් ගතයුතුනම් යටත්පිරිසෙයින් ඔයින් එකම්ඉඩමකටවත් අට්ඨකථාවල ඒඋපචාරය සඳහන්කළ යුතුය කියයුතුය; ඉදින් අට්ඨකථාවෙනිත් යම්හෙයකින් නොකියාගියත් ඒපොත්කරණකාලවලඒනියම නැතික්‍රියාවක් උපචාරවශයෙන් ග්‍රහණයකොට සිකුහුකළාහුනම්හෝ ඒකටයුතුඑකක්වහෝ තිබූනානම් ඔපමණ මහත්ගණනක්තිබෙණටීකාවලඑකම්ඉඩමකපමණවත් ඒඋපචාරලක්ෂණයසඳහන්කිරීමඒකාන්තයෙන්ම යුතුවමඇත; නැතහොත් වෙනයම් ප්‍රකරණයක සංග්‍රහයකවත් ඒ කාරණයත්ලිගාතබත්වමයුතුය; මෙකිසිමඉඩමකවත් එබඳුඋපචාරයක්වත් නියමයක් නොහොත් පැවිදිවන්නෙක් බැමසමග ඉසකේකැපුවාසයත ඉඩමක්වත් පෙණෙන්ටනැත්නම් එපමණෙකින්ම මෙබැමලොම්කැපීම බුද්ධශාසණයේ ප්‍රව්‍රජිතයන් විසින් නොකටයුතුබව තීන්දුකරගැන්ම පුළුවන්ව ඇත; ඉසකේරැවුල දෙකකැපීම කටයුතුවතිබෙණක්‍රමදනොකටයුතුක්‍රමද ප්‍රකාශකිරීම්පිණිස පොත්වල බොහෝදුරට කරුණුදක්වනලද්දේශ, මෙක්‍රියාව යමෙකු ශාසණයේ පැවිදිකරණකළ පළමුවරටකරණඑකක්වදතිබේ, මෙනෙක්කාරණයත් දක්වනඅතරේ බැමලොම කැපීම කටයුතුවූඑකක්ව තිබූනානම් ඒගැන යමක්නොකියාත්ව යුතුකමක්නැත්තේමය, ඉසකේරැවුලදෙකකැපීමට නියමකොට ශරීරයෙහි අන්නැනෙකලොම නොකැපියයුතුයයිද තහනම්කරතිබේ; හෙද යම්රෝගයක්සඳහා කැපීමට අවසරතිබේ; ඉසකේරැවුල දෙකහැර අනික්ශරීරයේ ලොමකැපීම තහනම්කළහෙයින් බැමත් ඒතහනම්වූ ඉඩම්වලටම අන්තගීතයයි ගතයුතු; ඉසරැවුලඇර නලලෙනිහෝ බැමදෑසිකාදෙකෙහිහෝ යම්ලොමයක් භයානකව පැහීහෝ තිබේනම් ඒලොමයපමණක් අඩුවෙන්ඉගිලියයුතුයයිද විශෙෂවිධාණයක්කරණලද්දේය, මෙකීමනිසා බැමලොම්කැපීමක් නොහැගෙයිශනුත් මේකාලයෙහි අල්පශ්‍රැතයන්ගේ මතයි; මහබෝසතානන් පැවිදිවන සමයෙහි ඉසකේකපනලදබැව් "දක්ඛිණෙන හත්ථෙන අසිංගණ්හිත්වා වාම

හත්ථෙන මොලියා සද්ධිං චූලං ගහෙත්වා ඡින්දි කෙසා ද්වඞ්ගුල
මත්තා හුත්වා දක්ඛිණතො ආවත්තමානා සීසං අලලීයිංසු
කෙසා යාවජීවං තදෙව පමාණං අහොසි මස්සුච තදනුරූ
පං අහොසි පුනකෙසමස්සු ඔහරණකිච්චං නාම නාහොසි"

යනුවෙන් දකුණතින් කඩුවගෙණ වමඅතින් ගැවසුකේසයහාසමග හිස්මුදුනේ කොණ්ඩයගෙණකැපූයේය, කේසයෝ ඇඟුල්පමණවූවාහු දකුණෙන් කරකැවී හිසට ඇලුනාහුය ඒකේසයන්ගේ ප්‍රමාණයතෙම දිවිඇතිතෙක්වූ

යේය, ඊට සුදුසු රැවුලැඳවූයේය, ඉසකේ රැවුල් පහකිරීමක්නම් නැවතනු
වූයේයයි මෙසේ නිදානකථාවේ පෙණී තිබේ, නික්මුණුදිනයෙහි කපුවාවිසි
න්රැවුල කපනලදහෙයින් මෙහිරැවුලකැපූසැටියක් නොපැණේ, එහෙත්
බැමලොම්කැපූසැටියක්වත් බැමලොමසඳහා වෙනයම්වචනමාත්‍රයක්වත්
කියානැත්තේ එයකැපීමක්ම නැතිහෙයින්වියයුතු; තවද; මස්සුශබ්දයට උ
පචාරවශයෙන්ගෙණ දාඩිකාවේ ලොමකපන්නාක්මෙන්ම; කෙස, යන්න
ට උපචාරවශයෙන්ගෙණ බැම්ලොම් කැපියයුතුයයි–විශ්වසුභාද–විසින් ද
ක්වනලදඅත්තනොමතිය විශෙෂයෙන්සිඳදැම්මනැතිවේ. විශ්වසුභාද–[1]මේ උ
පචාරදෙකක් අතුසක්මෙන්සිතා තමන්කිමකට විරුඩකරුණු දක්වාල
න්නෙක්නැතැයිසන උඩගුතාවයක්සිතවනගාගෙණවැඩිදුරනොසලකා
බලාම අල්වාගන්ටගියනුමුත් මම බැලූවාම අන්තිමරාජ්‍යවටදෙකක් ඇල්
වූවතුමෙන්වෙහෙසයටපැමිණෙන්ටවනබවපෙණෙයි, මස්සු, යනුරැවුලයි;
දාඩිකායනු; උඩුතොලරැවුලයි, මේමස්සු, යනශබ්දයෙන් උඩුතොලරැවුල
ප්‍රකාශනොවෙයි, එය උපචාරයෙන් ගැණෙයිකියනා–විශ්වසුභාද–ගේකීම
සිඳදැම්මපිණිස අපවිසින් දාඩිකාවෙහිලොමයත්, මස්සු; ශබ්දයෙන් වාච්‍ය
වනබව පමණක් දක්වියයුතුය; සකල ශරීරයෙහිම ලෝමයො "ලොමංත
නුරුහංරොමං" යන්නෙන්ද, ඇසෙහිවූරෙමයෝ "පම්හමාවුමමක්ඛිගං"
යන්නෙන්ද, පිරිමින් මුඛයෙහිවූ ලෝමයෝ; "මස්සුවුත්තං පුමමුඛෙ" ය
න්නෙනද, බැමයෙහි ලෝමයෝ "භූකුටීත්වී භමුකො භමු" යන්නෙනද; දක්
වනලද්දාහුය; මෙහි මුඛයෙහිවූ ලොම, මස්සු; ශබ්දයෙන්වාච්‍යවෙයි දක්
වූවේ උඩුතොලත්සමග සියළුමුනෙහිලොමසඳහාබැවින් දාඩිකානම්වූ; උඩු
තොල ලොමයන්ට අන්‍යනාමයෙක් නොදක්නාලැබේ; උඩුතොලඇරලා
මුහුනක් නැතිබැවින් උඩුතොලෙහි රැවුලත්, මස්සු; ශබ්දයෙන් ප්‍රකාශවූ
බව මෙයින් කිසිඅනුමානයක්නැතිව පෙණීගියා, "තනූරුහං රොමලොම
තද්වෘද්ධෞශ්මශ්‍රුපුංමුඛෙ," යන්නෙනද, රොම; යන්පුරුෂයන්මුඛයෙහි වැ
ඩුණුකල්හි; ශ්මශ්‍රු, ශබ්දයෙන් වාච්‍යවෙයිද, කියණලද්දේය, දාඩි,හෙවත්
දාඩිකා; යන්න සිංහලට බිඳීතිබෙන්නේ; දැළි, කියයි, දැළි; යන්නෙන්රැ
වුලමවාච්‍යවනබව නාමාවළියෙහි, "මස්, දැළි, රැවුළු, (දනාගත්දැළිරොදට
නම්),, යනාමෙයින්දතහැකි, මස්සු, ශබ්දයෙන්මදාඩිකාවෙහි රැවුලත්මුඛ්‍ය
වශයෙන්ම කිවූබැවින් මස්සු; ශබ්දයට උපචාරවශයෙන් දාඩිකාව ගන්නා
ලැබෙයි යනා–විශ්වසුභාද–ගේකීම තීන්දුවටම බිඳීගියබව දැන් පැහැදිලියි,
ඔන්න එකඋපචාරයකටවූසැටි, ඉතින් අනික් උපචාරය දිශාව බලන්ටම්
නෑ, කෙස; යන්නට උපචාර වශයෙන් බැමගතයුතුය යනු–විශ්වසුභාද–
ගේකීමයි, කෙස්ලොම්දෙක එකක්මබව දක්වීමසඳහා

"සීසෙලොමානිවිෂමානිහුත්වා ජාතානාතා විසමලොමො නා

ම් ජනෙතා,, යන්නක්ද විඝටසුහෘද කියා තිබුනි. කෙසලොම්දෙක එකක්
වූඉඹමක් වෙනනැතිබැවින් ඒපාඨයක්, කායෙලොමානි විසමානි භූතවා,කි
යා මෙතැන් පටන්වත් නිසිලෙස ශුද්ධකර ගතයුතු, කෙස්ලොම්දෙක එක
ක්වූවොත් "කෙසාලොමා" යනාදීන් වදාළ වත්තිංසාකාර කම්මට්ඨානයති
ස්එකක්වෙයි "තචපංචකයන්න" වෙනුවට, තච,චතුක්කයයි, කිය
යුතුය. "කෙසානලොමා ලොමානකෙසාති එවං අවසෙස එකතිංස කොට්
ඨාසෙහි අසම්මිස්සීකතා කෙසානාම පාටියෙක්කො කොට්ඨාසො," යන්නෙ
න්, කෙශයෝ ලොමයෝ නොවෙත්, ලෝමයො කෙශයෝ නොවෙත් ය
යි, මෙසේ අනික්එක්තිස්කොට්ඨාසයන්හා මිශ්‍රනොකරණ ලද්දාහුය, කෙ
සානලොමා, යනමේ පද තුනම පමණක් පාඩම් කියකියා විනක්වේලාඉ
න්නාකොට–විඝටසුහෘදට–ඔයඋපචාරය නැත්තටම එපාවෙනවා ඇති,
කෙශයෝනම් වෙන්වූ කොට්ඨාසයක් යයි මේ විසභාග පරිච්ඡෙදය, යනු
සැලකියයුතු. මේක්‍රමයට කෙස; සැබ්දයෙන්මලොමත් ග්‍රහණවෙයි යනමේ
උපචාර ලක්‍ෂණය දූරුවක්නු කම්මට්ඨාන භාවනාවෙහි යෙදෙනකලකෙස්
ලොම්නොවෙත් යනාදි විසභාගපරිච්ඡෙදය මෙනෙහිකරණකල්හි මේක්‍රම
ක්ද, කෙස, යන්නටඋපචාරවශයෙන් ලොමයත්දගැණෙයියන්නාද සිහිවී
මේභාවනාවෙන් අභිමතවූ සමථයට සිතනොනැගී මනත්වූ වික්‍ෂෙපය
ට පැමිණෙයි· ඔහට මේ උපචාරලක්‍ෂණය එසේධාරණවතිබෙණ නොක්ම
වත්තිංශාකාර කම්මට්ඨානයෙන් ඵලයක්නැතිමවෙයි, ඉතින්මේ උපචාරල
ක්‍ෂණයේ පිහිටා බැඹකපන්නාත් සියල්ලටම මේ කම්මට්ඨානයෙන් ඵලනැති
වමයෙයි; ඉන්නිසා දැනට අව්රුදු දෙදහස් ගණනක්වූ මෙතෙක්දීර්ඝකාල
යක්මුළුල්ලේ මේ ශාසණයෙහි කිසිවෙකුටවත් නොවැටහී නොකියා ආවාවූ
සත්‍යවිභූෂණ–ගේවාදයෙන්ජනු මේඅත්‍යනොමහි වශයෙන් දක්වූඋපචාර
යත් ඒබලයපිට පිහිටා කරණ දූරාචාරවූ බැමලොම්කැපීමත් ශාසණයෙහි
ක්‍ෂුන්අතුරෙන් හැරදැමීමවත් වාත්‍රිංශාකාර කම්මට්ඨානය ශාසනයකෙරෙ
න් නැතිකිරීමවත් මේදෙකෙන් එකක්නොකොට මේගැන වෙන කටයුතු
වූ වෙදකමක්නම් නැතුවාමයි; මේදෙකාරණයෙන් දූරුකටයුතු ක්‍රමක්දය
න්න පමණක් මේ ලඟට නිගමකරගතයුතු.

> " ඔකාසතො උභොසුපස්සෙසු කණ්ණචූලිකාහි පුරතො
> නලාටන්තෙන පච්ඡතො ගලවාටකෙන පරිච්ඡින්නා සී
> සකටාහවෙඨං අල්ලචම්මං කෙසානමොකාසො "

යන්නෙන් අවකාශ වශයෙන් දෙපාශ්වයෙහි කන්සිළි දෙකෙළ, ඉදිරි
යෙන් නලළකෙලවරින් පිටිපසින් බෙල්ලවටවූනැතින්ද ඉම්කරණලද්දාවූ
ඉස්කබල වෙලාසිටින්නාවූතෙත්වූ සමකෙශයන්ට අවකාශයයි, කියනලද
ස්ථානයක් කෙරෙන් පිටත කෙශනාමයෙන්ගතයුතුද්‍රව්‍යයක්නැත්වාමයි,

නිලල කෙලවරසනි නවූ මෙහි දක්වනලද ඉම් සහරතුල ඉසබවින් ඉසකේ එයින්පිටතහැතිබවත් මෙයින්නියතයි; බැම මෙකී සීමාවලින් පිටතබැවින් එහි පවත්නා රෝමයන් ඉසකේ නොවනබවමේලහට නියමකර ගතයුතු දත්මේවිකබව්ලියත්ව පවා හින්දුකරගැණීම පුළුවනි; ඉසකේකැපියයුතුය යන පදයසඳහා ඔයකියනලද සීමාවලින් පිටත ඉඩමකතිබෙණඅන්‍ය ශ්‍රී ව්‍යයක්වූ ලොම් කැපියයුතුයයි යන්නම්වත් සිතීකල්පනා ඇත්වෙතුටකිය නොහැකියි; රැවුලය කියන්නේ මුහුණෙහි ලොමයෝයි ඉසකේරැවුලදෙක ඇර; අත්කිසිඉඩම්වලත් ලොම් ඉදිරියයුතු බවද නියමයි; ශරීරයෙහිකො සිටවූනත් ලෙඩනිසා ලොම්කැපීමත් නියමයි; ඔය කියා තිබෙන්නාවාගේම බැමයෙහි ලොම් ඔයදක්වූසීමාවලින්පිටතනිසා එයකැපියයුතුනම් කිසියම්පොතක කියනවාමඇතැයි සිතිය යුතුවපේණවා; ශික්ෂාපද පැණවීම සර්වඥයන්වහන්සේම කල එකකි විසවසුභෘද–වහෝ තමන් නිකායේ අන්‍ය අයවලටහෝ ඊටපුළුවන්කමක් ඇතැයි කවරෙක්කියාදඉන්නිසාබැම ලොම් කැපීම අතිශයින්ම නොකටයුතුබව මෙයින් පෙණීගියා ඒඑසේපිළිගෙණ විසවසුභෘද–ලාගේ පිරිස්අතුරෙහි නුමුත් ශ්‍රද්ධාසිත්ඇත්තො මින්මතු එසේ පවත්වත්නම් ඒකධර්මකාමීන්ගේ ක්‍රියාවෙකි. සම්කිසි අව්‍යක්තයන්ගේ උපදේශවලින් ඔබඳුක්‍රියා පටන්ගෙණ බොහෝකල්නුමුත් බොහො දෙනා අතුරෙහිත් පැවත එන්නපුළුවනි එපමණකට ඔබඳුක්‍රියා ආගමානුකූලනොවේ. අමරපුර නිකායිකයන්ගේ පිළිපැදුම්චාරිත්‍ර අපට කුමටදැයිසලකාහෝ වෙනයම්ප්‍රමාදකල්පනාවෙකින්හෝ යථෝක්ත නුසුදුසුක්‍රියාවම නොහැරපවත්වත්නම් "සන්දිට්ඨිපරාමාසී ආධානගාහී දුප්පටිනිස්සග්ගී" යනාදීන්වදාළපාපයන්ට අන්තර්ගතවූවෝයයි සිතමු; මේපොත කියවන ගිහියෝපවා එසේම සිතත්. ඉසකේකැපීමයයන්න ලොකයෙහි ව්‍යවහාරවූ එකකි; ඒව්‍යවහාරයේහැටියට; කෙශයන්නාට උපචාරවශයෙන් බැම්ලොම්දගෙණ ගෘහස්ථයන්ගේ බැමලොම්සමග ඉසකේකැපීමක් කොයියම්භාෂාවක් ව්‍යවහාරකරන්නානුනමුත් නොකෙරෙත් නම් එමවාක්‍යය ශාසනව්‍යවහාරයට ආකල අමුතුඅප්‍රධානාර්ථයක් යෙදෙන්නෙ කෙසේදැයියනමේටිකපමණවත් මෙපමණ විශාල ව්‍යක්තතාවයක් ප්‍රකාශකරගිටින විසවසුභෘද–වකොනෙත්ම නොසැලකී මේඋපචාරලක්ෂණය ලියූනුමුත් දැන්මේබලනකල ඔයඋපචාරය නොකිව්වානම් වඩාහොඳයයි මිහටමසැලකියනවා ඇතැයිසිතමි. විසවසුභෘද–වමෙතෙක්ධර්මස්කන්ධරාශියක්ඇති ශාසනයෙන් මේගැන දක්වාලීමට එකධර්මපදයකින්පමණවත් පිහිටක් නොලැබ කීමටඇතුවපෙණුනෙත් තමන්විසින්පාහිටියෙත් ඔයඑකමඋපචාරයෙහි බලශපමණයි ඒඋපචාරයෙන් කිසින්පිහිටක්නැතිවගියාම තමන්ගේදුරාචාරවූ බැමලොම්කැපීම දුෂ්ප්‍රතිපත්තියක්බවත් බැමලොම්නොකපන්නාවූන්ට කරණලදනින්දා අපහාස සියල්ල තමන්මපිළිගතයුතුබවත් සැලකීමට ඔහුමපොහොසතැයි

සිතම්. සංඝාටිය මතුපිටබඳිනපටියහා බැමලොම්කැපීමයන මේබුද්ධශාසනයෙහි ප්‍රව්‍රජිතයන් විසින් නොකටයුතුවූ විනයානුකූලවූක්‍රියාවන් කල්‍යාණිප්‍රකරණය කළාවූ කාලයෙහි ධර්මවිනයධර ලක්දිව්වාසීමහාවිහාරපරම්පරාවේ මහතෙරුන්වහන්සේලා පැවැත්වූබවක්වත් ධර්මචෙතියමහරජානන්විසින් ඒක්‍රියාවන් පැවැත්වීමට නියමකළබවක්වත් කල්‍යාණිප්‍රකරණයෙන් ප්‍රකාශවෙනවායයි කෙසේනම් කියමුද; කල්‍යාණිප්‍රකරණයෙහියයි–විශ්වසුහෘද–තියාතිබෙන කෙසොරෙහණං, යනපදයෙහි අර්ථය ඉසකේකැපීමයයි ගතනොහේ, ඉසකේකැපීමෙහි; කෙසොහාරණ; කෙසොරොපන, කෙසච්ඡෙදන; යනාදිය නොයෙක් ආකාරවලින් යෙදීතිබෙණතැන් පොත්වල පේණනමුත් කෙසොරෙහන යන්න යෙදිනැතිඑකකි; ඉතින් එහිඅර්ථය ඉසකේකැපීමයයි කෙසේනියමකරකියමුද; චීවරබන්ධනා යන අතික්පදයෙනුත්, පටියක්නොහැඟේ; කිත්සූට අනුදනවදාළ පටි පෙළ අටුවාආදියෙහිහා නිඝන්ටුශාස්ත්‍රයෙහිත් කායබන්ධනාදි නාමවලින් ප්‍රකාශිතයි; චීවරබන්ධන යනනාමයක් කිසිමතැනෙක නොපෙණේ; එහිඅර්ථය පටියබැඳීමයයිකියාද කියනොනෙ; සිවුරුබැඳීම; නොහොත් සිවුරුබඳිනයමක් කියාගතහැකි; ,,කෙසොහාරණං චීවරබඬනං,, යනමේපදදෙකින් බැමලොම්කැපීමත් පටිබැඳීමත් යනමේක්‍රියාලක්දිව පුරාණකාලයෙහි මහාවිහාරවංශික තෙරුන්වහන්සේලා පැවැත්වූවෝය යනබවත් ධර්මචෙතියරජ්ජුරුවන්විසින් භික්ෂූන්ටපැවැත්වීමට නියමකරණලද්දේය යනබවත් ප්‍රකාශවෙයිකියා–විශ්වසුහෘද–ඉතාදීර්ඝවශයෙන් කීනුමුත්, බැමකැපීම පටිබැඳීම; දෙක ප්‍රකාශවෙයි කියනලද ඒපදදෙකෙන්ම තමනටප්‍රයොජනවත් කාරණාදෙකම ප්‍රකාශනොවිගියකල එයින් කිසිමප්‍රයොජනයක් ලැබුනායයිකියනොහේ; මින්දුරට මේසඳහා කරුණුනොලියමු. බැමකැපීම් පටිබැඳිම්ආදිය මහාවිහාර පරම්පරාවේ තෙරුන්වහන්සේලා පැවැත්වූපරිදෙන් සියම්මහානිකායේ පමණක්පවත්වනනිසා ඒනිකාය මහාවිහාරපරම්පරාවේය මේඑකමසාක්ෂියක්දින්ට නොහැකියයි ඉතාදෘඪවශයෙන් ගෙණහැරදක්වාතුබූ එමකාරණය ලියාතුබුපදවල එබඳු අර්ථයකුත් නැතිව ඒක්‍රියාව ආගමානුකූලත්නොවී තීන්දුවටම බිඳීනැති වූන–විශ්වසුහෘද–ගේඑකම සාක්ෂියට උනේමොකද? සාක්ෂියකැඩිබිඳීගියාම ඔහුගේකීමුත්එයින්ම බිඳිගොස් හමාරයයිකියමු. හොඳයි අනික්පරිද්දෙකින් ධර්මචෙතිය රජ්ජුරුවෝ විනය විරුද්ධවූ මේක්‍රියාවන්කිරීමට නියමකළායයි සිතමුනම්, ඉන්පසු මෑත කාලයෙහි වැඩසිටිය ආගමධර මහතෙරුන් වහන්සේලාමේක්‍රියාවල දොෂයසලකා බුද්ධප්‍රඥප්තියට එකගවූ පරිදෙන් යොදගැනිමට සම්මතකරගෙණ පළමුපැවතුනුරජඅනාටඑකගවූක්‍රියාව හැරදමානුගයිකිව්වත්එහි කිසිත්දොෂයක් නොපැණේ, බුද්ධාඥාවටබාධාකරන්නාවූ රජඅන බුද්ධපුත්‍රසුදොසල ශ්‍රමණයන්විසින් පැවැත්වීම අවශ්‍යයෙනම බලවත්අපරාධයෙකි

"න්‍යායාපෙතං යදන්‍යත්‍ර රාඥාඥාත කථංචන
තදප්‍යන්‍යාය විහිතං පුනන්‍යායෙ නිවෙශයෙත්"

නීතිශාස්ත්‍රයටවිරුද්ධවූ යමක් අන්තැනෙක්හි රජක්හුවිසින් ඉදින් නොදැනකරණලදද ඒකාරණයද නැවත නීතිශාස්ත්‍රයෙහි ප්‍රවෙශකරන්නේයයි ශාස්ත්‍රයෙහි කියණලදබැවිනුත් එසේකිරීම කිසිත් දොෂයක්ව නොපැණේ; චීවරබන්ධනා; කෙසොරොහනා; යනාමේ කොයිබඳුවැරදිසහිතව අහුවතිබෙණපදදෙකක්දැක ඔයපමණබලයෙහිත් උපාලිනිකාය මහාවිහාරපරම්පරාවේකිරීමට ගියසැටිනම් ඉතාඅශොභනයි; නුවණැත්තෝ අතිශයින් පිළිකුල්කෙරෙත් පරම්පරාවෙන් පරම්පරාවට ක්‍රමක්‍රමයෙන් බැසගණවුත් තමන්ට මහාවිහාර පරම්පරාවලැබුණුසැටි ඒඒරටවල පූරාණ පරම්පරාලියාතිබෙණ පොත්වලින් නොපෙන්වා ඔය පරම්පරාව එලිකළසැටිනම් ඉතාලජ්ජයි; පිළිගතයුතු කාරණ කිසිත්නැහැ;

## සවෙනිභාගය

මහාවිහාර පරම්පරාවේසාංඝයා දල්හීකම්යට අගරුනිසරු පිළිකුල්කොට නොපවත්වා හැරියායයි විසවසුභාද වීසින්කියණලද කාරණය එසේනොවනබව මෙලගට ප්‍රකාශකරන්නෙමි; කල්‍යාණිප්‍රකරණයෙහි;

☞ „පුබ්බකානමායස්මන්තා සීහලදෙසියානං මහාථෙරානම් දච්ඡණ්ණං ගං පරදෙසතො ආගතානං භික්ඛූනමුපසම්පදංගගණතො පඨමමෙව ගිහිනො මයනාති වචීභෙදං කාරාපෙත්වා චීවරමපනෙත්වා සෙතවත්ථදනෙන ගිහිභාවෙ පතිට්ඨාපෙත්වා පුන චීවරදානසරණගමනදානවසෙන සාමණෙරපබ්බජ්ජාය පබ්බාජෙත්වා සාමණෙරභූමියං පතිට්ඨාපිතානං 'යමුපසම්පදං දතාං තංකිස්සහෙතු යෙභායස්මන්තා භික්ඛූ ඉධාගතා පූරිමොපසම්පදා නෙපරිසුද්ධා සීහලදෙසියූපසම්පදා පරිසුද්ධාති මඤ්ඤමානා සද්ධා සම්පන්නා හුත්වා උපසම්පදං ගන්හිංසු තෙචායස්මන්තා භික්ඛූ පච්ඡා සිස්සාදීනං තෙසං තෙසංච පරිජනමාදිසිත්වා විප්පටිසාරිනො හුත්වා අභිනව වස්සමගනෙත්වා පූරාණවස්සමෙව ගණිංසු නාචෙතං නො රුච්චන්ති තෙනෙව ආචින්නං, යි,

ඇමැත්නි, පරදෙශයෙන් ආවාවූ උන්නාන්සේලාගේ උපසම්පදාවගැනීමට පළමුකොටම අපිගිහියොයයි කියවා සිවුරුහරවා සුදුවස්ත්‍රදීමෙන්ගිහි භූමියෙහිපිහුටුවා නැවත සිවුරුදීම් සරණදීම්වශයෙන් සාමණේරපැවිද්දෙන්පැවිදිකරවා සාමණේර භූමියෙහි පිහුටුවූවන්ටම යම් උපසම්පදාව දීමෙක් වේද? මේතෙම ලංකාවීපයෙහි පූරාණ මහතෙරුන්වහන්සේලාගේ පූරුද්

දක්වේ, ඒ කාරණා කවරේද, ඇවැත්නි සම් භික්ෂූහු මීටප්‍රථම ලංකාද්වී පයට පැමිණියාහුද ඔහු තමන්ගේ ප්‍රථම උපසම්පදාව අපිරිසිදුය, ලංකාද්වීපයෙහි උපසම්පදාව පිරිසිදුයයි සිතනුලබන්නාහු ශ්‍රද්ධාවෙන් සමන්විතව උපසම්පදාව ගත්තෝද, ඇවැත්නි ඒභික්ෂූහු පසුව ශිෂ්‍යාදිවූ නම්කි සිපිරිවර ජනයාසඳහා විපිළිසරව අළුත් වයසගණන් නොකොට පළමු වයස ගණන්කළාහුය, ඒ පළමුවයස ගණන්නැත්මනෙම අපටරුචිනොවේ, ඒනිසාම මේකාරණය පුරුදුකරණ ලද්දේය, තවද රාමඤ්ඤදේශයෙහි සීමාදෝෂාදිය ඇතැයිසලකා ඒනිසා උපසම්පදාව දූෂ්‍යයයි විශේෂයෙන්ම සැකකර ලක්දිවට පැමිණි තෙරුන්නාන්සේලා ලංකාවේ මහතෙරුන්නාන්සේලාගෙන් දළ්හිකම්මය ඉල්වාසිටියෝය, එවිට ලංකාවේ .මහතෙරුන්නාන්සේලා තමන්ගේ උපසම්පදාව දූෂ්‍යයයි පිටදෙශවලින් පැමිණෙන උන්නාන්සේලාට උපසම්පදාවදීමට පළමුවෙන් සිව්රුහරවා නැවත සාමණේරකර උපසම්පදාවදීම පුරාණපටන් පුරුද්දක්වතිබෙනුය, මක්නිසාද, මීටප්‍රථම තමන්ගේ උපසම්පදාව දූෂ්‍යයයි සැක කර පිටදෙශවලින්පැමිණි උන්නාන්සේලාට සිව්රු නොහරවා පළමුම හණකමපිටම උපසම්පදාකම්මය ලංකාවේ තෙරුන්නාන්සේලා කළෝය, ඒඋපසම්පදාවලැබූ පිටරටවල උන්නාන්සේලා නෑතමන්ගේ ශිෂ්‍යයන් සහිත පිරිවරජනයා වෙතටපැමිණ ඒශිෂ්‍යාදීන්ට වැඳීමකළ නොහැකිව විපිළිසරව හෙවත් සැලකිරි ලංකාවෙන් ලැබූඅළුත් උපසම්පදාවේ වයස ගණන් නොකොට පරණ උපසම්පදාවේ වයසගණන් කළෝය, තමන් උපසම්පදාවට විශේෂයෙන් සැකසිතා උපසම්පදාව ලදකෙනෙක් පරණ උපසම්පදාවේ වයසගණන් කිරීම අපිකැමතිවන කාරණයක් නොවෙයි, ඉන්නිසා පරණවයස ගණන් නොකිරීම පිණිස සිව්රුහරවා උපසම්පදා කිරීම පසුවමැනකාලයකදී පුරුදුකර ගත්තායයි කිවෝය, යනමේ අභිප්‍රායමෙහිදක්වූ පාලියෙන් පැහැදිලිව ප්‍රකාශව තිබෙනබැවින් ලංකාවේ මහාවිහාර පරම්පරාවේ පුරාණ මහතෙරවරුන් උපසම්පදාවලත් උන්නාන්සේලා එම උපසම්පදාව නොහැර, නොහොත්, ගිහිනොකොට නැවතත් උපසම්පදාව දීමවශයෙන් දළ්හිකම්මය පැවැත්වූ බව ඒකාන්ත කරකියමු, මේනිම ඉහතදක්වූ කල්‍යාණිප්‍රකරණයේ පාඨවලින් ප්‍රකාශවන්නේනැතැයි කීමටනම් කිසිවෙකුටවත් බලයක්නැතුවාමයි, ඒනිසාලංකාවේමහාවිහාර පරම්පරාවේ පුරාණ මහාස්ථවිරයන් දළ්හිකම්මය නිදෝෂ වශයෙන් පිළිගෙණ පැවැත්වූබව මේපොතකියන්නන් විසින් සිහියේ තබාගැණීමට ඕනෑකාරණ වැදගත් කාරණයෙකි. මේඅභිප්‍රාය–සනාථවිභූෂණ ලක්රිවිකිරණෙහි පාත්වියකළ, ඒදුවූ–විශාවිසුද්ධාදා කියාගත සූත්

තක් නොලැබ තමාටම විශ්වාසනැති, මුසාවාදයක් කියාතිබෙන්නා-
විශවසුභාද යසී, අපිදන්නා තැනැත්තාට මේකාරණය මේපොත ලිය
න මාවිසින් කියනලද කල්කිපොතේ ඒපාඨවැරදී තිබෙණවායසී එයශු
ඩකිරීමට ශ්‍රීරාජ්‍යක වෛශෂනන්තාමිස-සත්‍යවිභූෂණට දීතිබෙණ මේ මු
සාවාද උත්තරය මාසමග කිසිසේත් නොකියේය. මෙකල්හි ලක්රිවිකිර
ණෙහි කියාතිබෙන්නේනම්, පිටදෙශවලින් ලංකාවට ඉහතවාරවල පැ
මිණීසායසී කියාතිබෙණ උන්නාන්සේලා පළමුමහනකම නොහැර අළු
තෙන් මහණකම ලැබුවො නොවෙත්, සාමණේරයාර නැවත උපසම්ප
දාව ලුන්නාය, බාලතුවු බැවින් ඉන්පසුව පැමිණිවාරයක ගිහිවීමටම නි
යමකරණ ලද්දේය කියසී, මේ විශවසුභාද-ගේකීමපිහිටු වියනොහේ, ප
ළමුඋපසම්පදාව හැර සාමණේරවී නැවත උපසම්පදාව ලැබුවානම් "අසි
තවවස්ස මගනෙතවා" යනාදීන් අළුතෙන් ලබනලද උපසම්පදා
වේ වයස ගණන්නොකොට පළමු උපසම්පදාවේ වයස ගණන්ක
ළෝයසී නොකියා, අළුතෙන් ලැබූඋපසම්පදාවේ වයසගණන් නොගෙ
ණ හරණලද උපසම්පදාවේ වයස ගණන්කළෝයසී මෙහිදී කියයුතුවේ,
ඒපූරාණ උපසම්පදාවේ වයසගණන්කිරීම අපට රුචිනොවෙයි යන්නක්
ද නොකියා ඒකාරණයතෙම කූටවස්සිකය නම්වූ බලවත් දෝෂයෙකැයි
ද කියති; ඒ අපට රුචිනොවෙයි යන්නෙන් යම් දෝෂයක් කියානැහැ
මෙහිදී දඬුකම්යත් නොකිරීමට ලංකාවේ තෙරුන්නාන්සේලාට ඕනෑ
කම් තිබීගියබව පේණනිසා කූටවස්සික දෝෂයක්වී තිබුනානම් ඒදෝෂ
යමපෙන්වා කියාදී එයවලක්වන්නේ නැතිව නිකමට අපිකැමැති නැ
තාකියන පමණක් නොකියති; කූටවස්සිකයෝනම්, ඒ භික්ෂූහුකියා ඔවු
න්ට ප්‍රකාශි භික්ෂූන්ටමෙන්, භික්ෂූනාමය යෙදීම ශාසන ව්‍යවහාරයෙ
ක්නොවේ, තමන් පළමු උපසම්පදාව අපිරිසිදුය ලක්දිව උපසම්පදාව පි
රිසිදුයයිසිතා උපසම්පදාව ලැබුවාව කීපමණමුත් පළමු උපසම්පදාවහැර
ලක්දිව උපසම්පදාව ලැබුවායයිකියා ඇත්තේම නැහැ, එසේකළානම්
මහත්දෝෂයකාට පසුව වැටිතිබෙණනිසා ඒකම තෙරුන්වහන්සේලා ප්‍ර
කාශකෙරෙත්; අන්‍යදෙශයෙකින් ලක්දිවට අවුත් මෙහිදී ශුද්ධාවෙන්
යෙදී උපසම්පදාව ලැබුවෝයසීපේණ ඒ ශුද්ධාවන්ත සිල්වත් පින්කැමති
පුද්ගලයෝ, ඔය-විශවසුභාද-කියනතරම් බලවත් සොරකමක් නොක
රෙත්; එබඳු සොරකම් කරන්නවුන්ටනම්, ශුද්ධාවෙන් යුක්තයෝයසී
නොකියත්. ඉන්නිසා, සම්පජානමුසාවාද, යසීසිතෙන- විශම්සුභාදගේ
කීමට ප්‍රශංසානොවේවා; ඒකීම බොල්හා සමානයි, මෙහිදී ප්‍රථමඋපසම්ප
දාවට විශෙෂයෙන් සැකකර නැවත උපසම්පදාව ලබන තැනැත්තා
පළමු වයස ගණන්කිරීම නුසුදුසුයයි ලංකාවේ මහතෙරුන්නාන්සේලා

විසින් දක්වනලද කාරණය ඉතාහරිම පෙණේ, දැනට දළුහිකර්මීය සාරයසිගෙණ පවත්වත්නාවූ බුරුම රාමඤ්ඤ නිකායවල ධර්මවිනයධරමහ තෙරුන්වහන්සේලා පළමු උපසම්පදාවට විශෙෂයෙන් සැකඇතිකල ඒඋපසම්පදාවේ වයසකිසිවෙක්වත් ගණන්කරන්නේම නැතිබවත් සැකකටයුතුවූ නියම කාරණයක්නැතිව දළුහිකර්මීය පිණිස නැවත උපසම්පදා කර්මයකරණ කල්හි පළමුවයසනැරීම නුසුදුසුබැවින් එසේනොකරණ බවත්දතයුතු. එහෙයින් දැනටපවත්වන දළුහිකර්මීය පූරාණ ලංකාවේපැවති දළුහිකර්මීයට කිසිවෙනසක් ඇතැයිකියහොහේ; දළුහිකර්මකිරීම මහා විහාර පරම්පරාවේ තෙරුන්නාන්සේලා විසින්අගරු නිසරු පිළිකුල්කරණලද කාරණයෙකැයි–විශව්සුභාද– කිව්තුමුන් ඒඅභිප්‍රායතේරුම්යන එකම වචනයක්වත් තෙරුන්නාන්සේලා කිසැවියක් අපට පෙණෙන්නේ නැහැ; බාලනොවීමගැන පමණක් ඒ තෙරුන්නාන්සේලා එකඟනොවී සිටියබැවින්, "නාවෙතංනොරුඩනි," යී, මේ බාලනොවීම අපට රුචිනොවෙයි, යනමේට්ක කියාතිබෙණ පමණට, අගරු නිසරු පිළිකුල්කොට හැරියායයි කීවික විශව්සුභාද අමුතුවෙන් හදලියාතිබේ,තවත්නැතෙක, "තහනම්කළා," යන්නක්ද අමුතුවෙන්හදාගණ තිබුනි, තවත්–විශව්සුභාද– කියාතිබෙණ මුසාවාද එළිකෙරෙමි, "නාවෙතංනොරුඩනි, තෙවඅචිණ්ණං,"

යනුවෙන් උපසම්පදාසම්මතයක සිටියඅයට එමම්හණකම්පීට උපසම්පදාවදීම අපට රුචිනොවේ, පූරුදුනොවෙයි," යනාදියයි. මෙති මහත් වචාවක් කරතිබේ,

"අභිනවවයස මගණෙත්වා පූරිමවයසමෙවගණිංසු නාවෙතං
නොරුඩනි තෙනෙව ආචිණ්ණං,"

යනුවෙන්, අභිනවවයසං අගණෙත්වා, අළුත් වයස ගණන්නොකොට; පූරිමවයසංඑවගණිංසු, ප්‍රථම වයස ගණන්කළාහුද; එතං; මේකාරණයතෙම; නො, අපට; නරුඩනි, රුචිනොවේ; යනු ඒපාඨයෙනිඅර්ථයි–විශව්සුභාද– කියාතිබෙණහැටි මෙන්න, "උපසම්පදා සම්මතයක සිටිඅයට එමමහණකම්පීට උපසම්පදාවදීම අපට රුචිනොවේ," කියයි; මේ කීම්දෙක කොපමන වෙනස්ද දුරද; බාලනොවීම අපට රුචිවෙයි කීඑක, පළමු මහණකම්පීටම උපසම්පදාවදීම රුචිනොවෙයි කිව්වාම ඔහිටත් ඩඩා අමුත්තක්වෙන ඇතිවිය හැකිද; ඉතිරිවිකනම්,"තෙනෙවආචිණ්ණං," යනුයි, එති, තෙ, යනමේ අක්ෂරයක් වාක්‍යය මධ්‍යයෙන් හැරදමා, "නෙවආචිණ්ණං," කියා පුරුදුනොවෙයි, කියාද අභිප්‍රායත් පාඨයත් දෙකම වරද්දා දක්වාතිබුනි, අකුර අඩුකර ගත්තාම ඔනුකියාන අභිප්‍රායනතහැකි, තුමුත් හැරදමු අක්ෂරයත් ඊටයොදා තේ

රුම්කලාම අභිශකීන්ම එහිඅර්ථය වෙනස්වේ; ඒ මෙසේයි, තෙනඑවත්‍ා
විරණං, එහෙයින්ම පූරුදුකාරණ ලද්දේය, කියයි; පූරුදුනොවෙයි, ය
න්නත්, පූරුදුකරණ ලද්දේය, යන්නත්දෙක එහෙමපිවිත්ම අහසට
පොළොවසේ දුරුවූතේරුම් දෙකක්මයි. පූරුදුකළහමත් පූරුදුනොවෙ
යි කිව්වාම ඊටත්වැඩිපෙනෙත් මිථ්‍යාවක් වෙනලොව ඇද්ද; පිරිසිදු සියම්
මහානිකායයයි කියකියා ඉනාඕශාලවූ විනයද්‍රෝහීකුත් ප්‍රකාශකරණ මේ
කපටිශාකවද; කිසාද, මීටත්වඩා වචාවක් වෙනලෝකයෙහි ඇද්ද කියා
ද මේසඳහා කියයුතුවතිබේ. බුද්ධශාසනය උසුලන්නාවූ මෙමහණ උපසම්
පදාව පිළිබඳවූ උතුම් ප්‍රධානකරුණුගැන රටමුළුල්ලේ පතළවන ප්‍රසිද්ධ
පතුයක පොත්වලතිබෙණ වාක්‍යවරදවාලියා එසේම වරදවා තේරුම්
තරප්‍රසිද්ධ කරවන මොහුටවඩා පාපතරයෙක් වෙනකවරෙක්ද; මොහු
මේතරම් වචාවෙන් ක්‍රියාකරන්නේ කවරෙකුට ඊෂ්‍යාවෙන්ද; මොහුරැ
වටි මේකාරණය මෙසේලියා තිබෙණවාද; නොහොත්, ලොකයා රවට
නු පිණිස ලියනලද එකක්දැයි නියමකරගැනීම උගතවන්නුමුත් ඒදෙයාකාර
සෙන්ම ඔහුවරදින් නොමිදේ. නවද, එම මහණකමපිට උපසම්පදාව
දීම අපට රුචිනොවෙයි, යනු කියනලදැයි විඤ්ඤුහෘද-කියාතිබෙණනි
සා දළ්හිකම්ය ඉත් ඉහත පැවතුනාය යනඅදහස ඔහුගෙණ්ම කියවීති
බෙන්නා. ඉත් ඉහත සාමණේරකරලා උපසම්පදාව දුන්නායයි ඔහුගේ
කීම අසත්‍යබව එයින්පෙණීගියා. දළ්හිකම්යට අගරු නිසරු පිළිකුල්
කළාය යන්නෙනුත්, දළ්හිකම්ය ඉහතත් පැවතුනුබව පෙණීගියා; නැ
ත්නාවූ පෙරනොපැවතුනු දෙයකට නොපවත්වා හැරියායයි කියන්ට
කිසිම ඕනෑකමක්නැහැ, නොපවත්වාඅරින්ට, පැවැත්වූ දෙයක්මඕනෑනි
ග්‍රහකරන්ටත් තිබුනාවූදේකටඕනෑ ඒකාලයෙහිපැවතුනානම් පුරාණයෙහි
නොහිබී අමුතුවෙන්ම සාදාගත්තායයි කෙසේකියමුද කිපපලකම නැවත
නැවතත් දළ්හිකම්යට දොෂකියමින් උපසම්පදාවක්පිට තවත් උපසම්පදා
වක්සම්කරණ බුරුමඋන්නාන්සේලාගේ මේ මොඩකම්යයි නොයෙක් පරිද්
දෙන් ගණකරද්දී මෙහි අපිගෙණහැරදක්වූ කලාණී ප්‍රකරණයෙහි කරු
ණුනොබලා කථාකරතිබෙණ නුමුත් බුරුම උන්නාන්සේලා පමණක්නො
වලංකාවේ උන්නාන්සේලාත් පුරාණයෙහි දළ්හිකම්ය පැවැත්වීම් වශයෙ
න්උපසම්පදාවපිට උපසම්පදාවකළබව මෙයින්තේරුම් යනවාඇති· ඒගැ
නමසමන්තපාසාදිකා, විනයඅට්ඨවාව පාඨයන්දක්වා විරුද්ධවාදී කීම්වල
නිස්සාරකම ප්‍රකාශකරමි,

"ඉදංඅකුප්පකම්මෙ දළ්හිකම්මං හොති
කුප්පකම්මෙ කම්මං හුත්වා තිට්ඨති,"

යන්නෙන් මේ නැවත නැවතකිරිමතෙම පළමු කම්යපිහිටිකල්හි ද·

ළ්හිකර්මයවේ, පළමු කර්මයනොපිහිටි කල්හිකර්මය පිහිටාසිටි; මෙතනාදී-
විශ්වසුහෘද-නමත් අගයකර නොයෙක්තැන කියකියා ආනිම්සිඳහෙළ
නපිණිස ආරම්භයනිසා, ඉතාඕනෑකමින් කත්දීඅහනවා ඇතැයිසිතමි,
මෙහි, [illegible] අකුප්පකම්ම දළ්හිහොති, යි, දක්වූකීමෙහිහැටියට ප
ළමුඋපසම්පදාවපිහිටාතුබූ උන්නාන්සේට නැවතඑම උපසම්පදාකර්මයක
ළ කලපස්සේකළ උපසම්පදාව සවිකලේ පළමුකල උපසම්පදාව පිටම
නොවේදැයි සලකනු, උපසම්පදාවපිට නවත්උපසම්පදාවක් සවිකිරීමයයි
විශ්වසුහෘද-විසින් නගණලදදෝෂය කෙරෙත්, අකුප්පකම්ම, යනාදි
පාඨබලයෙන් අපි බුරුමඋන්නාන්සේලාමුදවා ඒදෝෂය විශ්වසුහෘද-පි
ටමනැබූවා, බුරුමඋන්නාන්සේලත් දළ්හිකර්මයත්ශුද්ධයි, මෙහිදී, විශ්වසු
හෘද-වැටුනේ ඉතාමඋස් ඉවමකිනි, යත්නම් පණඅදිනානරමට ආශාශ
යි. වැටුනේනැතැයි යමිකෙනෙක් කියත්නම් මෙලඟ ඉනහින්දක්වූ වග
න්තිය දෙවනුත්කියවා බැලියයුතුයි.

තවද, 'උපසම්පදාව නැතිකෙනෙකුට උපසම්පදාවදීම බුදුන්වදළ
කර්මවාක්‍යයෙහි පෙණිතිබෙනවාය, උපසම්පදාව ඇතිවෙකුට උපසම්ප
දාව දෙනකර්මවාක්‍යය බුදුන්වදාලේ නැතැයිකීම සම්පූර්ණයෙන් හිඳ
හෙළන අටුවාකීමක් මෙහිදක්වමි, "අකුප්පකම්ම දළ්හිකම්මංහොති"යි;
පිහිටූකර්මය ඇත්තාහට නැවතත් කර්මයකළකල්හි, දෘඪවෙයිසන අටුවා
කීමෙහැටියට පළමුකර්මවාක්‍යම පසුවකරණ කර්මයටත්කියනබවමම්
ස අමුතුවෙන් කර්මවාක්‍යයක් අටුවාවේ නොදක්වූනිසා උපසම්පදාව ඇ
ත්තාහටත් නැත්තාහටත් බුදුන්වදාළඑකම කර්මවාක්‍යම කර්මයටයො
ග්‍යවතිබෙයි, යනමේකාරණය ඉතාහොඳින්වැටහී අපේකීමේ සාරත්වය
පිළිගන්නවා ඇතැයිසිතමි, එසේපිළි නොගන්නවානම් අටුවාචාරීන්ව
හන්සේලාටත් වජිරඥාණ තෙරුන්වහන්සේටකළ චෝදනාවලෙස
චෝදනාවක්වත් නොකරනම් බැරිහැටියි, ඇසිපිහිටූ උපසම්පදාවඇත්
තාට නැවතත් කර්මවාක්‍යය කීකල දෘඪවෙයියනු අටුවාවේකීකොට ඊට
අමුතු කර්මවාක්‍යයක් උවමනානන් අටුවාවේකීම කියයුතුනොවේ; "වැර
දුනොත් ආයෙකියන්ට ඕනෑබව නියමකළතැන නොවැරදුනොත්ආයෙ
කියන්ටඕනෑ නැතිබව බාල ළදරුවෝපවා තේරුම්ගණිද්ද," ය
න උත්තරයක්ද විශ්වසුහෘද- මහත් ලොකුවකාටසිනාගණ කියාතිබෙන්
නා, විශ්වසුහෘදව- මේවාවැදගත් උත්තරවශයෙන් පෙණියනෑ මණමු
ත් මටමෙය එකවරම සිඳදැම්ම හැකිවන්බේ, විශ්වසුහෘද-තේරුම්ගෙණ
තිබෙන්නේ වැරදුනොත් ආයෙකියන්ට කියනඑකපමනයි, ඒමහත් අ
පරිඥාකාරිකමයි, තවත්එකක් ඔයඉඩමේමතිබෙණවා,ඒකනම්, නොවැ
රදිහරිතියකර්මයට ආයෙකිව්වාම වැඩිවෙයියනඑකයි, "අකුප්පකම්ම දළ්හි

හොති, '' කීවේමොකද; ඒක ඔයඉඩමෙන් අහක්කරන්ටද, ඔයවිකපම
ණවත් නොසලකා මේකාරණය කියාතිබෙණ විශ්වසුභාදගේ ලපටික
මතිසා කාවිසිනුත් ඉවසියයුතු, මේවිශවසුභාද- කියන කිශනවිවාවම වි
රුබවූ අටුවාපාඨවලින් ඔහුගේකිම්සිළිබිඳිම යනනැතියට විශවසුභාද-අ
ටුවාචාරින්කෙරේ ද්වේෂයසින් පහලකරගත්තවා ඇතැයිනොකියන්ට කා
රුණුනැහැ, විශවසුභාදගේ කිම්බලතකොට අටුවාචාරීන්ටත්වඩා වි
නයඥතිමක් ප්‍රකාශකරගෙණ අටුවාවට උඩින් පැනගෙණ එනපිණිස
තැත්කරණහැටි පෙණෙන්නා, අටුවාචාරීන්ටත් දෝෂකිමටතරම් එපම
ණමනත් ව්‍යක්තභාවයකට විශවසුභාද- පැමිණියොත් කව්රුගෙතරපි
යද්ද; නුමුත් මනපොලොව කම්පාකරවීමක් නවමහැලනැහැ. උපසම්ප
දාකල කෙනෙකුට මාස අව්රුදු පසුකරනැවත කම්මවාක්‍යය කීම්වශයෙ
න් කරන්නාවූ දළ්හිකම්මයදෝෂයයි විශවසුභාද-කියනවාමිස එබඳුදෝෂය
ක්කිසිමපොතකින් දක්වූවෙවත් මතුදක්වන්ට පුළුවන්වන්නේවත් නැ
නැයි කියමි, කම්මාහිවූවසතුව නොවීමෙන් අධම්ම කම්මය වෙනවාය යන
කීමේ තත්වය දත්ලගදිමපෙණේ. විශවසුභාද-කියන්නේ මාසඅව්රුදු ප
සුකර කීමේදී අධම්මකම්මයවනබවනා එකෙණෙහි කියනකල අධම්මකම්ම
නොවනබවයි, උපසම්පදාව පිහිටියායින්පසු ඒවේලේම කම්මවාක්‍යය කි
යනකල වසතුව සුදුසුඑකක් වීමෙන් ධම්මකම්මයවන වානම් එම වසතුව
මාසයක් නොහොත් ඊටවැඩිකාලයක් පසුවූනාම නුසුදුසුඑකක් වීමෙන්
අධම්මකම්මයවන්නේ වසතුවයයි කියනලද උපසම්පදාව ලැබූනැනැත්තා
ගේ ලිංගපපරිවත්තිනායක් සඳහාද, නොහොත් එම උපසම්පදාව මුකුරා තද
ගතියකට එක්කෝදිරිමට පැමිණීමක් සඳහාදැයි සෙවිමවටි; උපසම්පදාක
ම්මයක්කළකල්හි ඒකම්මය පිහිටිමහෝ නොපිහිටිමහෝ දෙකෙන් එකක්වීම
මිස ඊටවඩා අමුත්තකට නොපැමිණේ, ඒතැනැත්තා පසුවඑදවස්හෝ
අව්රුදු ගණනෙකින්හෝ නැවතත් උපසම්පදාකරණ ලද්දේය, එකල්හි
ඉහතකරණලද කම්මය පිහිටාතිබූනාතම් වසතුව නුසුදුසුදැයි අපිඅහමු;
නැහැ, '' අනුපපකමෙම දළ්හිකම්මංහොති, යි, අටුවාවේ ආබැවින් මෙ
තනදී වසතුව නුසුදුසුවීමෙන් අධම්මකම්මයවියනොහෙ, පිහිටි උපසම්පදා
ව ඇත්තාහට ඒවේලේම කම්මවාක්‍යය කියනකල සුදුසුවසතුඑක්කෝ සු
දුසු පුද්ගලයෙක්වතිවලා ඉන්පසු කාලයෙකදී එමපුද්ගලයාටම කම්මවා
ක්‍යය කියනකල නුසුදුසු වස්තුවක්වීමට කල්යාමෙන් උපසම්පදාව දිරිම
කට නොහොත් මුකුරා තදෑඩභාවයකට පැමිණී නිසාදැයිනොඅසා අ
පිවෙනකුමක්නම් කියමුද; හොඳයි පළමු උපසම්පදාව නොපිහිටාතිබූ
නානම් පසුව උපසම්පදාකරණ කාලයෙහි ඔහු නුසුදුසුවස්තුවන්ද; නැ
හැ, අනුපසකමෙම කම්මංහුඬා තිටඨති, යි, පළමු කම්මය නොපිහිටිකල්හි

පසුව කරණලද කර්‍මයපිහිටා සිටියි, යනඅටුවාපාඨයේ අභිප්‍රායෙන් ඒවස්
තුවද සුදුසුඑකක්ම පෙණීගියාම වස්තුවනුසුදුසුවීමෙන් අධර්‍මකර්‍මයවන
වායයි කියනුලැබූනු සුදුසුවස්තුව කුමක්දැයි නොපැණේ; වස්තුව නුසු
දුසුයයි කීපණම්ස අසවල්කාරණයනිසා නුසුදුසුයයි විශ්වසුභද්‍ර-දක්වූවේ
මනැහැ. පළමු උපසම්පදාව පිහිටා තුබූනැනැත්තාට නැවත කරණක
ර්‍මයත්, පළමුඋපසම්පදාව නොපිහිටි තැනැත්තාට නැවත කරණ කර්‍ම
යත් මේදෙකම අටුවාවේ නියමකරණලද ඒවාමැනාම වස්තුව නුසුදුසු
වීමෙන් අධර්‍මකර්‍මය වනවායයි දක්වූකිමත් බිඳවැට්ච්ච, එකල්හි දළ්හි
කර්‍මය ධර්‍මකර්‍මයයි, දළ්හිකර්‍මයට විරුද්ධවශයෙන් දක්වනලද කිම්සහරක්
මදනාට අටුවාවේ කිම්වලින්ම බිඳහෙලා නැගිකළාවට මෙසිදිමට කි
යන්ට කල්පනාවූනා; මේදක්වූ කාරණා සහරටම විශ්වසුභද්‍ර- විසින්දෙ
වනුම්ාවිරුද්ධව කියයුතු එකම වචනමාත්‍රයක්වත් ඇත්තේනැත්වාමයි.
දළ්හිකර්‍මය අධර්‍මකර්‍මය කිරීමට විශ්වසුභද්‍ර-පටන්ගණිද්දිම මටවත් කල්
පනාවේනැවියට දළ්හිකර්‍මය අධර්‍මකර්‍මයක් කළනොහැකිව ඒගත්උත්සන
යකිස්එලම් ඒකර්‍මයසාරවත්වූ ධර්‍මකර්‍මයක්බව හීත්දුවටම පෙණීගියඑක
මේපොනලියත්නාවූ මටප්‍රීතියට කාරණයක්ව තිබෙණවානාසම්නාම මෙ
ය අසන්නාවූන්ටත් එසේම ප්‍රීතිදායකව පවතිනවාඇතැයි මමසිතමි. ව
ස්තුව නුසුදුසුවීමෙන්ද ඤාත්තියවිරුද්ධවීමෙන්ද අනුසාවනය විපත්තිවී
මෙන්ද, සීමාව විපත්තිවීමෙන්ද නොයෙක් පරිද්දෙන් කර්‍මයන්ගේ අධ
ර්‍මවීම දක්වනුලැබේ, අධර්‍මකර්‍මය අධර්‍මකර්‍මයයි වචනමාත්‍රයෙන් කියනප
මණම්ස එසේ ආගමේ දක්වාතිබෙණ එකම අධර්‍මකර්‍මයකටවත් දළ්හිකා
ර්‍මය එළාපෙන්වාදිම කිසිවෙකුටවත් නුපුළුනි. මේකාරණයද ඕනැකමින්
ඇසියයුතු. උදයපන්සිල්සමාදන්වූ ගිහියෝනමන්සමාදන්වූ සීලයපිටමනැ
වතත් එමසීලය සම්කිරිම්වශයෙන් සවසත් පසුවදාත් පන්සිල්සමාදන්වෙ
ති; සාමණේරනම් දවස්පතාද දසපසලොස් දවසින්ද තමන්ගේ සාමණෙ
රසීලයහිඹියදීත් එමසීලයපිට නැවතත් සීලයසම්කිරිම් වශයෙන් සීලසමා
දානයකෙරෙති; විශ්වසුභද්‍රගේ කීමෙහැටියට තිබෙණ සීලයමනැවතත්ස
මාදන්වීමබලවත්දෝෂයක්වියයුතුයි. එපමණක්නොව පැවිදිකරණකල්හිද

> “සාමණේරානං තිසරණගමනං භික්ඛූනං උපසම්පදාකම්ම වා
> වාසදිසං නසමාහිතබුනාවිය චතුපාරිසුද්ධිසීලං ඉමිනාපිදසසීලා
> නිසමාදිනනා නෙවහොනති එවංසනෙතපි දළ්හිකරණත්ථං ආ
> යතිංසංවරෙ පතිට්ඨාපනතථං පුනාදාතබ්බා,”

යනුවෙන් සාමණේරයන්ගේ සරණගමනය වනාහි භික්ෂූන්ගේ උප

සමාදනකර්මවාක්‍යය හාසමානාණී, එහෙයින් භික්ෂුභූමිසින් චතුපාරිශුද්ධිශීලයමෙන් මේසාමණේරණම විසින්දශශීලයෝ සමාදන්වනා ලද්දනුම්මෙන්, එසේඇතිකල්හිද දඬුකර්මයසඳහාද, මතුසංවරයෙහිපි හිටුවීම්සඳහා දනැවතශික්ෂාපද දියයුත්තාහුවෙත්. සාමණේරශීලය පිහිටා තිබෙණකල්හි දඬුකර්මය සඳහා නැවතසිල්දීමට නියමකරතිබෙන්නේ ශීලයපිටම ශීලයපිහිටුවීම නොවේදැයි යන්නුහොපෙණුනේකින්ද; මෙසේ ගිහිපැවිදි අනුපසම්පන්නයන්ගේ ශීලවලාට ශීලයපිටශීලය සම්කිරීම නිවරද්නම් උපසම්පදාශීලයටත් එසේඑකපිට එකසම්කිරීම මොඩකමයයි කියත්තේකවර නුවණැත්තෙක්දැයි මේපොත කියවන නුවණැත්තන්ට නොවැටහේද;

"සමන්තපාසාදිකා පාඨියෙහි අර්ථවශයෙන් ඔයම්බිශේ අවිරුද්ධනත් අටපසුකරකර හිතුන හිතුනදාට කරණ දඬුකර්මයක් අභිමතනොවූකලබව ඉතාපැහැදිලිවම තිබෙණවාමයි," කියාද "කර්මවාක්‍යය වැරදුනොත් එවේලේම ශුද්ධවකියයුතු" යයි කියාද විශ්වසූත්‍රාද- නොයෙක් වරකියාතිබුණේ, එවේලේම ශුද්ධව නැවත කර්මවාක්‍යය කියන්ට ඕනෑය දවස් මස් වර්ෂගක්මවා කර්මයකරමින් පවත්වන දඬුකර්මය බොරුවයකියනබවයි, මේගැන පසුපස්සේ කර්මවාක්‍යය කිම්සුද්ධසුබව අපවිසින් දක්වියයුතුය; ඒමෙසේය.

> "නසම්බණෙ දූනන්‍යූනාවචන තොපිඅපරභාගෙවචනං ම
> හප්ඵලංහොති මහානිසංසං තසම්කිපතකාලෙ දූනන්‍යූනං
> භණනෙතා සදතාරිදෙස අනුසාවනාදෙසාතිපත පච්ජීම
> භණනෙසුට්ටු,භණනෙතා සොබෙතුං සක්කුණෙය්‍ය න
> වත්ථුවිපත්ති සීමාවිපත්ති පරිසවිපත්ති දෙසානං පඨමං දූ
> න ය්‍යූනං භණනං මහප්ඵලා නොහි මහානිසංසතාහි වෙ
> දිතබ්බං,"

මෙහි අභිප්‍රායනම්, කර්මවාක්‍යය එවේලේම නැවත නැවත කීමටවඩා මැතභාගයෙහිකීම මහත්ඵලවේ මහාඅනුස් ඇත්තේවේ, ඒකාලයෙහි මනැවත නැවතකියන්නේ සදතාරිදෙෂ අනුසාවනා දෙෂයන්වනාත් පසුවකියන කල්හි මනාකොට කියන්නේ ශුද්ධකරන්ට හැකිවන්නේය, වස්තුවිපත්ති, සීමාවිපත්ති, පිරිසගේ, විපත්ති, යනමේ දෙෂයන් ශුද්ධකිරීම නොහැක්කේය, පළමුකොට නැවත නැවතකීමටවඩා මැතකාලයෙහි කීමතෙම මහත්ඵලවෙයි මහත්ආනිසංස ඇතිවෙයි යනුදතයුතු, එකාරණෙහි කර්මවාක්‍යය කීමටවඩා පසුවක්ම මහත් ආනිසංසයයි ඔයපරිද්දෙන් නියමකර පෙණීතිබෙණැවිත් ඒපොතපත් අහබලා පූරුදුඇති බහුශ්‍රැතශික්ෂාකාමී බුරුමතෙරුන්නාන්සේලා සහිතව එමනිකායේ ලක්දි

ඕවාසි තෙරුන්නාන්සේලාද සියම්දේශාදියෙහි රමඤ්ඤනිකායේ තේරුන්නාන්සේලාද කලින් කල නැවත නැවත කම්මවාක්‍යය කීම්වශයෙන් මේ උතුම් ප්‍රශස්තක්‍රමයට ඒදළ්හිකර්මයකෙරෙත්, මේ නැවත නැවත කලින් කල දළ්හිකර්මය කිරීමවිනයෙහි පොත්වල නියමනොකරණලද්දාවූ මෙකල්හි මහරුළුත්නාන්සේලා විසින් අමුතුවෙන් හිතුවක්කාරකමින්වත් නොදැනීමෙන්වත් පවත්වනලද ක්‍රියාවක් නොවෙයි. පොත්හි පෙණීතිබෙණ ක්‍රමයමෙහි දක්වාතිබෙණ විස්තරයෙන් බලා සියල්ලන් විසින් සැකදුරු කටයුතුය. විශ්වසුභාද මේ සියල්ලටම පිටිපා ඒදන්නා නොදන්නාවගේ ඇතත් නැතිවා වගේ තමන්ට කීමට කටට එන එන ඒවා කියනවා; ඉහත දැක්වූ පරිද්දෙන් පසුව කීම් මහත් ඵලයයි කියා ඉතා පැහැදිලිව නියමකර තිබෙද්දී එසේ කීමමෝඩකමය නොතේරුම් කමයයි නින්දාකරයිවූනි; විළම අදහස්ඇති ඔබඳු කපටිපුද්ගලයන්ගේ වචා කථාවක් කාටනම් වැළැක්වියහැකිද; බුද්ධශාසනයෙහි ප්‍රව්‍රජ්‍යාවලබා සිටින්නාවූ අපි ආගම ධර්මයෙහි නියමවතිබෙන්නාවූ ධර්මයන් පිළිපැදීම කටයුතුව තිබෙණ හෙයින් ශාසනයේ මහණකම නිර්මලව අනුමාන නැතිව දීර්ඝකාලයක් ලොවපැවතීම පිණිස, ශාසන ආලයෙන් ගරුත්වයෙන්ම මේ දළ්හිකර්මය කරන්නාවූ මේ දළ්හිකර්මය කිරීම කරණකොටගෙණ යම් පූජාවක් හෙවත් ස්වල්ප ලාභයක්වත් නොහොත් වැඩිප්‍රශංසාවක් කිසිම්කෙනෙක්හුට නොලැබේ; එයපතාගෙණ කරන්නාවූ කිසිවෙක්ද නැත්මය; ඉතින් මෙසේ ආගමයෙහි ආවාවූ බොහෝදීර්ඝකාලයක පටන් පවත්නා ශාසනයෙහි නිර්මලතාව සඳහාකරණලද කර්මය, විශ්වසුභාදගේ අවාසනාවනිසා කපටිකමින් එහි ඇත්ත නොදැකාරම වැටහී ඊට කැමැත්තත් නිබාගණම ලොව මුළාකිරීම සඳහා මෙසේ ගර්හාකලාම අත්හැරදැමීම සුදුසුද; නොහොත් එසේ කිරීම පුලුවන්ද; යනුමේ කියවන්නන් විසින් සැලකියයුතුය; එක විශ්වසුභාද, කෙනෙක් තබා දහසක් සමග මුරගැසුවත් කළ හැකි එකක් නොවේ,

තවත්, දළ්හිකර්මය දොෂයයි දක්වනු පිණිස කියා තිබෙන්නේ නම් " උපසම්පදාවෙලා අවුරුදු දහය පහලොහ පසුවූ අය නමත් ප්‍රථම මහණකමට සැකකර අලුතුවෙන් උපසම්පදාව ලැබ පළමු වසස ගැණීම කොල්ල කැමත්තවනෙයි," කියයි. මේ කීම සඳහා පොතේ දක්වාතිබෙණ පාඨවලින්ම පැහැදිලිකර තේරුම් කිරීමට මම ප්‍රසන්නයෙමි,

" යදිදංව උපසම්පදාසික්ඛාපදනරො භවෙයහත්ත භවෙය්‍ය කසමා පොරාණ සික්ඛං අපච්චක්ඛිත්වා නාය එව පතිට්ඨිතත්තාති,

මෙහි අභිප්‍රාය මෙසේයි, ඉදින් එසේවීනම් උපසම්පදා ශික්ෂාවෙන් බ

ලබන්නේද? නොලබන්නේය, කවරහෙය කීන්ද; පූර්ණ උපසම්පදාව
නොහැර ඒ උපසම්පදාවෙහිම පිහිටි බැවිනි, යනු අභිප්‍රායයි. පසුව සා
මිවාක්‍යය කියවාගැණීමෙන් උපසම්පදාව ලැබූවත් තමන් ප්‍රථම උපස
ම්පදාව නොපිහිටිබව තත්වූ පරිද්දෙන්ම දැන දැන පළමු වයස් ගනණ
ගණන්කිරීම නුසුදුසු බවත් ප්‍රථම කර්‍මයට නියමවූ සැකයක් නැතිව වඩ
වඩා ස්ථිරත්වය සඳහා දෙවනු කර්‍මවාක්‍යය කියවා ගැණීමෙන් දළ්හිකර්‍ම
ය ලත් තැනැත්තාගේ ප්‍රථම කර්‍මය යම් හැටියකින් නොපිහිටා තිබී මෑ
ත කාලයෙහි පිහිටියේවීනමුත් ප්‍රථම වයස ගැණීමෙන් ඕහට කිසිදෝ
ෂයක් නැතිබවත් මෙහි ඉහතදැක්වූ පාඨආදී වෙනත් එහිම පාඨවලින්
දක්වනලදී, එහෙයින් තමන් පළමු ලැබූමහණකමට නියමවූ යම් විපත්
තියක් නොදන්නා තැනැත්තා දළ්හිකර්‍මය ලැබුයේ වීනමුත් පළමුවය
ස ගැණීම කිසිදෝෂයක් නොවේ; ඒ ක්‍රියාව කොල්ලකෑමක් සමානයයි
ද කියනොහේ. දැනට දළ්හිකර්‍මය පවත්වන්නාවූ බුරුමනිකායේ තෙරු
න්නාන්සේලාද ප්‍රථම කර්‍මයට නියමවූ සැකඇති කල්හි ඒප්‍රථම කර්‍මයෙ
හි වයස හැරදමා පසුව කර්‍මය නිසැකව පිහිටිතැන් පටන් වයස්ගණන
පැවැත්වීමට නියමකර එසේම පවත්වත්; ඒ කාරණය බොහෝදෙනෙ
ක් දන්නා ප්‍රකටවූ එකකි, ඉන්නිසා දැනට දළ්හිකර්‍මය පවත්වන්නාවූන්
අතුරේ වයස්ගණන ව්‍යවහාර කරණ පිළිවෙළ මේ පොතේ කියාතිබෙ
ණ ක්‍රමයට විරුඩයක් කිසිසේත් කියනොහේ, උපසම්පදාවෙන් පස් අ
විරුදුවයස් ඇත්තෙක් අන්‍යප්‍රදේශයකට ඈම්ණේද, එකල්හි තමාව
ඩා වඩිනාකම ඇතිලාභ කොටස ගැණීමසඳහා වචාසිත් පහළකරගෙ
ණ මම දශඅවිරුදු වයස්ඇත්තෙමැයි යනාදිවශයෙන් කියාතමාට උ
රුමනැති වැඩිකොටස ගැණීම කොල්ලකෑමක් සමානය යනුසැබැයි,

තවද, විශ්වසූනාද මේ ගැනම කියාතිබෙන්නේ, " අර සැකනිබූණ
උපසම්පදාවේ විසසනන්නා එක අශුතු අධර්ම තක්කඩි කමකි උපසම්පදා
ව නොපිහිටා තරක්වතිබූණ කාලයෙහි වයස හොඳ වෙන්නේ කො
හොමද; " කියයි; මේ සඳහාද මෙහි කරුණු දක්විය යුතුය, උපසම්පදා
ව ලත්කෙනෙක් ඒ උපසම්පදාව නැතිවීමට සුදුසුවූ පාරාජිකා පත්තිය
කට පැමිණිය හොත් ඔහු ලත් උපසම්පදාව නැතිව අනුපසම්පන්නයෙ
ක් වේ, උපසම්පදාවෙහි පිහිටියෙක් ඒ උපසම්පදාවෙන් මිදෙනුකැමති නා
ම් එසේ කල්හි වචනයෙන්ම ඒ අභිප්‍රාය කීමෙන් අනුපසම්පන්න යෙක්
වේ, එයින් පිටත්වූ යම් විධියෙකින් ලද්දාවූ උපසම්පදාවක් නැතිනො
වේ; උපසම්පදාව කෙරේ සැකසිතීමෙන් එම උපසම්පදාවට ස්වල්පදෝෂ
යක් පමණවත් වනහැටියක් බුද්ධාගමේ කිසිම තැනක කියානැත්
තේමය. යම් යම් කාරණයන් කෙරෙහි නොයෙක් පරිද්දෙන් නොයෙක්

විට සැකසිත් උපදින්ට පුළුවනි, ඒක කිසිවෙක් විසින්වත් වලක්වන්ට
බැරි එකක්. පෘථක්ජනික සියළුදෙනාටම යම් කරුණු සඳහා සැක ඉප
දීම නියතයි, එපමණකට ඒ ඒක්‍රියා හානිවී සැක සිතුනුහැටියේ නැති
වියනවානම් ලෝකයේ යම් ක්‍රියාවක්කිරීමම නොහැකියි; සැකසිත් ඉප
දීම නිත්දූකර නැතිකරන්ට අනාගාමිවූවෙක්ම ඕනෑ. උපසම්පදාව ලැබ
නකල්හි එය නොපිහිටායාමට තිබෙණබාධකකාරණා අනන්තයි, ඉතින්
උපසම්පදා උන්නාන්සේ කෙණෙක් තමන්උපසම්පදාව ලැබුණ කාලයෙහි
යම් යම් කාරණා වෙනස්ව පවතින්ට ඇද්දෝ නැද්දෝකියා කල්පනා
වෙන්නේ නැද්ද; එබඳුසිතක් උපදින්නේනැතැයි යම් කෙණෙක් කිය
න්නම් ඒක මුසාවාදයක්මයි. ඔය සැකයපමණට ඒ උන්නාන්සේගේ උ
පසම්පදාවට මක්වුනාද; සැකතිබෙන තිබෙනවිටනැතිවෙන, නොහොත්
නරක්වන උපසම්පදාවක් ඇත්නම් ඒක හොඳ සම්පදාවක් වෙන්ට පුළු
ලුවනි; එබඳු එකක් විශවසුනාදලාට තිබෙණවානම්මිස බුදුබනේනම්නැ
තුවාමයි. විශවසුනාදලාට තමන්ගේ උපසම්පදාවගැන කිසිමවිටක අනු
මානයක් සැකහිතක් නිකමටවත් තිබෙන්නේම නැහැ. ඕකත්සැබෑද;
මල්වත්තේ විහාරයේ තෙරුන්නාන්සේලා අස්ගිරි විහාරයෙහි උන්
නාන්සේලාට මහණකමක් උපසම්පදාවක් නැතැයි ලියුම් ප්‍රසිද්ධකළෝය,
අස්ගිරියේ උන්නාන්සේලාත් එසේම මල්වත්තේ විහාරයේ තෙරුන්නා
න්සේලාට මහණදම් නැතැයි ප්‍රසිද්ධ කළෝය, බෙන්තර තෙරුන්වහන්
සේද සියම් සමාගමේ උපසම්පදාව පවිත්‍රකර පිහිටුවීමසඳහා සංඝයා එවි
යයුතුයයි සියම්රටට ලියුම් ඇරියේය සිජකාඩුවේ නායකස්ථවිරයානෝද
සියම්නිකායේ අභ්‍යුදය නැතිකිරීම සඳහා සංඝයා එවනු පිණිස සියම්ර
ටට ලියුම් යවමුයයි තමන් මිත්‍රයන්ට ලියුම් යවූයේය; ඔයක්‍රියාවක් ක
ළේ සැකනැතිවද; ඔය ක්‍රියාවන් අහනබලන අයවලට සැකඋපදින්
නේ නැද්ද; කොරහගොඩ තෝලත්ගමුවේ ස්ථවිරදෙනම සහිතවූ සිය
ගණනක් උන්නාන්සේලා සියම් සමාගමට මහණදමක් නැතැයි අමරපු
රසමාගම පිළිගත්තැනදීවත් කිසිම සැකයක් අනුමානයක් උපන්නේම
නැතැයි කියත්නම් ඒක සත්‍යවිශයනොහේ; සැකයක් උපන්නායයි කිය
න්නම් ඉතින් මහණකම නරක්වෙන්ට ඇතිනොවේද; සැකතිබුනාවූ උ
පසම්පදාවේ වැසනන්නා එක අයුතු නක්කඩි කථායයි, විශවසුනාද කියා
තිබෙන්නේ ලොකයාගේ ඇස්වල ධූලිපූරවා මුළාකොට ඒ කිච්චක සැබෑ
යි සැකතිබුනු උපසම්පදාව නොදවූනේ කෙසේදයි නුනුවණ ජනයන
ගේ සිත්වලට දෙන පිණිසයි, ඒ තමන්ගේ අභිමතය එසේම වූනේනැ
හැ. දැන් මෙයින් මඳ මඳ දෙනෙක්වත් ඇස්වල ධූලි පිසදමා ඇත්ත දැ
නතේරුම් ගන්නවා ඇති,

"ලජ්ජීකුක්කුච්චකො සික්ඛාකාමො," යන්නෙන් ලජ්ජීවේද කුකුස්ඇ
ත්තේද ශික්ෂාකාමීවූයෙදැයි කුකුස්ඉපදීම හෙවත්සැකඉපදීම ශික්ෂාකාමීන්
ගේ අංගයක්වනුමිස දුශ්ශීලපාපයන්ගේ අංගයක්නොවේ; මේ කුකුස් ඉප
දීම විශවසුහුදලාට නැතුවාසැබැවෙන්ටත් පිළිවනි; හාමුත් අමරපුරනිකා
යේ උන්නාන්සේලාට ඒ කුකුසපවතිනවා, ඒකෙන් අපට මේ කාලයෙහි
මිදෙන්ට නුපුලුවනි, මෙටිඳු සැකදුරුවී නමක් උපසම්පදාව නිර්මලව පිහි
ටියේමයයි ස්ථිරවූ සිත්ඉපදීමෙන් ප්‍රීතිමත්ව ප්‍රතිපත්තිය ජීවිතයසේ සා
රකොට ආලයෙන්පිළිපැද මහණදම ආරක්ෂාකර ගැණීම සඳහා නැව
ත නැවත කල්පසුකර උපසම්පදාව ලැබූ උන්නාන්සේ උපසම්පදාවූ
පිහිටුවන කාලයෙහි ඔහු නියමවශයෙන් නොදැනගිවිය යම් දෝෂයක්හි
සා කර්මයහානිවී තිබුනානම් ඒ ශුද්ධ පිරිසිදු ශීලයෙහි පිහිටියාය, මේ
නිසා ඒ උන්නාන්සේටපළමු වශයෙනැණීමෙන් යම් ස්වල්පදෝෂයක් වත්
වනවායයි කව්රුකියතත් ඒකිම බලවත් අපරාධයයි,

මේ උදෙසාම තවදුරටත් කියයුතුව පෙණෙන්නේනම්, මහනුවර මල්
ල්වත්තේ විහාරයේ පොහෝගෙයි උපසම්පදාදී විනයකර්මසඳහා රැස්වූ
දශවිසි ගණන් ව්‍යක්තබහුශ්‍රැත ස්ථවිරවරනු අවුරුදු හැට හැත්තෑවක්
ඒ ඉතා පිරිසිදු හොඳසීමාවයයි සිතා කර්ම කලෝය; නුමුත් මේකල්පනා
වට අභිශයින් විරුද්ධව ඒ සීමාව, සංකරදෝෂ, අසම්භින්නනිමිත්ත දෝෂ,
සීමාසම්භින්න දෝෂාදි නොයෙක්දෝෂ යුක්තයයි පසුව විවාදනවගත්තා
ඇති; මේක සැලකීමට වැදගත් කරුණෙකි ව්‍යක්තවූ බහුශ්‍රැත ඔපම
ණ ස්ථවිරවරුන්ට ඒ සීමාවෙහි කිසිම දෝෂයක් ඔපමණකල් පෙණීගියේ
නැහැ. දැනටත් ඉතාහොඳ පිරිසිදු සීමාවල්ය, පිරිසිදු පිරිසය, කර්මසිද්ධි
යට කිසිම සැකයක් අනුමානයක් නැතැයි කර්මකරණලද සීමාදියෙහි කි
සිම දෝෂයක් ඇත්තේම නැතැයි නියමකර කියන්ට නුවනැත්තෙකුට
නම් පුලුවන්නොවේ. සමහරවිට ඒ සීමාවලත් දෝෂපෙණී යන්නොත්ඇ
ති, පිරිසගේත් දෝෂතිබියන්ට පිළිවන ඒක එසේනොවෙයි යමෙක්කිය
සිනම් ඔහුඅඥානයෙකි, ඉතින් එබඳු දෝෂයක් තිබීගියේ වීනම් මහත්වූ
විනාශයක් වූබව මම කුමටකියම්ද;

එපමණක්නොව, පාතරාව බලපිටිමෝදර ආදියෙහි උදකුක්ඛෙප සීමාවු
වෙහිද ව්‍යක්තබහුශ්‍රැත මහාස්ථවිරාදීහු රැස්ව ඉතාපිරිසිදු සීමාවය කර්ම
සිද්ධියටද කිසින් හානියක් නැතැයි දශ දොළොස් අවුරුද්දක් මුළුල්ලේ
කර්මකලෝය, මෙසේ කර්මකරණ කල්හි පැවතුනාවූ කල්පනාවල් විශෙ
ෂයෙන් ශුන්‍යව එමසීමාව සංකරදෝෂ යුක්තයයි සමහර විනයධර ස්ථවි
රයන් වනන්සේලාට වැටහී, ඒගැන විවාදනවගත්බව බොහෝදෙනෙක්
න්නා ප්‍රත්‍යක්ෂකාරණයෙකි, මෙසේම නොලඹ නොහොත් ගාල්ලේත්

තවත් සීමාවක් තිබෙණවායයි අපිසිතමු, ඒ සීමාවටද ව්‍යක්ත ත්‍රිපනාමක් කාරකකොට ඇතිසංඝයා රැස්ව මේ සීමාවේ කිසිදෝෂයක් නැතැයි සිතා දැනට කර්මකෙරෙත්, නුමුත් ඉහත කී සීමාවලට වූනාවූ විසම්ල් බලනකොට මේ පසුවකියනලද සීමාවත් දෝෂයුක්තයයි සැකකටයුතු දවසක් නොපැමිණෙයිකියා සිති ඇත්තෙත් ඒකාන්තකර නොකියාඑඉස් ඒ සීමාව සැකයෙන් නොමිදේනම් එම සීමාවෙහි කරණලද උපසම්පදාදී කර්මයතුදු සැකරහිතව පිහිටියාමයයි ඒකාන්තකර කියනොහෙනබැවින් මෙහි දක්වූ සීමාතුනෙහිම උපසම්පදාව ලැබූවන් විසින් තවතවත් අන්‍යසීමාවලදී ශුද්ධවූ අන්‍යපිරිස්මැද උපසම්පදාව ලැබීම ඉතාම හොබනා ක්‍රියාවක්බව සිතිනුවනින්යොදී සලකන්නවුන්ට වැටහේ;

තවත්, සංඝරක්ඛිත, යන නම් ඇති උන්නාන්සේ නමක් උපසම්පදාව ලබන්නකල්හි සීමාවෙහි රැස්වසිටි උන්නාන්සේලාගේ ගණන විසිනමකි; මේ විසිනම අතුරෙත් ත්‍රිපනාමක් පේද්‍යගාමිණියට පැමිණීම් ආදිවශයෙන් අනුපසම්පන්නව සිටියෝනම් ඒකාරණය උපසම්පදාව ලබන සංඝරක්ඛිත නාමටවත් සීමාවෙහි රැස්වසිටින අනික්පිරිසටවත් දැනගැණීම දුස්කරවතිබෙන්ට පුලුවන, ඉන්නිසා මේ සීමාවෙහි රැසිවූනාවූ පිරිස පිරිසිදුමයයි නිශ්චයකරකීම නුපුළුවන. අනුන් තමා තමතමුන්ම නොදත් දෝෂ ඔවුනොවුන් කෙරේම බොහෝ නුගත් සමූහයා අතරේ පවත්නාබව කියමු. ඉතින් මේ උපසම්පදාව ලැබූ, සංඝරක්ඛිත, නමට ඉහත කී කාරණයගැන නිශ්චයකට පැමිණීම නොහැකිවූබව අපිදැනගනිමු, එනෙත් ඒ කාරණයගැන හොඳටම අනුමානකරමින් ඒ නමගේ උපසම්පදාවටනම් කිසිම අනුමානයක් නැත, ඒ පිහිටියාමය ඒගැන තවත් දෙවනු යම් දැඩිකිරීමක් ඕනෑකරත්තේම නැතැයි නිශ්චයකරකියන කාල අපි ඒ නමගේ කථාවනිවරදියයි කියමුද; නොහොත් වැරදියයි කියමුද, අනුමානයක් මුල්කරගෙණ එයින් නිශ්චයකට පැමිණීම නොහැකිබැවින්, සංඝරක්ඛිතනම මෝඩකමින් කරණ කථාවෙකැයි ගනාකියාම බැරිය. ඉන්නිසාදැන් සංඝරක්ඛිතනමට උපසම්පදාව පිහිටියේ නැතැයි කියන්ට සුතුව යම් හැටියකින් පෙණිගියාය, ඔහු අනුපසම්පන්නයෙක; ඒ සංඝරක්ඛිතනම සහිත තවත් උන්නාන්සේලා විසින්' බුද්ධරක්ඛිත, ධම්මරක්ඛිත, යන නම්ඇති උන්නාන්සේලා දෙනමක්ද උපසම්පදාකරණ ලද්දනුස, සංඝරක්ඛිත; නමගේ අනුපසම්පන්නභාවය හෙතුකොටගෙණ පසුව කියනලද දෙනමත් අනුපසම්පන්නයෝ වූවෝය, මේ තුන් නම විසින්ම තවත් උන්නාන්සේලා හා සමග නොයෙක් ස්ථානවලදී බොහෝ දෙනෙක් උපසම්පදාකරණ ලද්දෝය; ඒ සියල්ලෝද අනුපසම්පන්නයෝ වූවෝය. ඔයක්‍රමයෙන් එකම සංඝරක්ඛිත, නමනිසා රටමූ

ලුල්ලම් උපසම්පන්නයන්ගෙන් ශූන්‍යම් අනූප සම්පන්නයන්ගෙන් පිරිශන්ම පුළුවන; ඉතින් මීටවඩා විනාශයක් ඇද්ද; මීටත් වඩා මහත්හානියක් තවත් ඇතිවිය නොහේ· මෙබඳු විපත්ති වලින් මිදී ශාසනයේ උපසම්පදා ශීලය දීර්ඝ කාලයක් මුළුල්ලේ දිව්‍යඥාන බලයක් නැත්තාවූ කාලයෙහි පැවතීමට උපදෙශයක් තිබෙන්නටම ඕනෑය. එහෙයින් යථොක්ත, සාසරකඛිතනාම නිසා වූනාවූ විනාශයෙන් මුක්තවීම ඕනෑම කාරණ එකකි; කියනලද ක්‍රමයෙන් ලබනලද උපසම්පදාව ඇති මේ සාසරකඛිත නාම තවත් සීමාවකදී අන්‍යපිරිසක් විසින් කම්වාක්‍යකියා උපසම්පදාකිරීම් වශයෙන් දළ්හිකම් කරණ ලද්දේය, ඉන්පසු නැවතත්, තවත් පිරිසක් විසින්ද එසේම දළ්හිකම් කරණ ලද්දේය, මේ පසුව කියනලද දෙසීසවෙනයේම පිරිස පළමු කී පිරිසමෙන්ම දෝෂ සහිතයෝ නොවෙත්, මෙයින් එකම පිරිසක්වත් හොඳවම සිටියාය, එකල්හි ඒනමගේ උපසම්පදාව පසුව පිහිටිබවට කිසිම අනුමානයක් නැතැයි කියයුතුය. එසේ කිව්වාට කිසි වරදක් නැත; පළමුවෙනි වාරයෙහි උපසම්පදාව පිහිටියායයි හිතීම්වයම් පමණ කාරණා තිබුණානම් එපමණ දෙකොටසක් කාරණා පසුව දෙවාරයෙහිදී ලැබුනාය, එයින් ඔහුගේ උපසම්පදාව පිහිටා මූලතිව්නාශයෙන්ද සම්පූර්ණයෙන්ම වැලකීම පෙණේ, මේ විනාශයෙන් මිදීමට උපකාරව සිටිමේ දළ්හිකම්යමයි; මෙසේ කල්හිදළ්හිකම්ය දෙළය ප්‍රයෝජන නැතැයි කාටනම් කියහැකිද; මේ ක්‍රමයෙන් බැළුවාම යම් නිකායක දළ්හිකම්ය නොපවත්වනවානම්, උපසම්පදා වූනායින්පසු ඉතින්නම් නවත් ඒකට අනුමානයක් ඇත්තේම නැතැයි දිවඇස් ඇත්තාහුමෙන් බලා ඉඳින්නම්, ඒ ක්‍රමයෙන් කල්යාමක් අනාරේ මතුකීඅන්දමේ විසවූල් වෙන්නටම පුළුවන; එබඳු දෝෂයක්වූනාට අනාරෙහි කිසිම වෙදනමක් තවත් ඇත්තේමනැත, එසේ වීමෙන් ඒ සමාගමටම මනණදම නැතිවයන්නට පිළිවනැයි කියන්ට පේනවා· ඒ කල්පනාව හිනට බැසගන්නාකල ඒක වැලැක්වීමට කිසි අරමුනක් නොපැණේ· මේ කාරණය මෙසේ නොවෙයි, නොහොත් මේ කීම අයුතුයයි මඳවත් සිතී ඇත්තෙකුට කියන්ට නුපුළුවනි; මේ සඳහා සියම්දෙශයෙහි මහරජ්ජුරුවන් සහිත තෙරුන්නාන්සේලා විසින් එවනලද සන්දෙශයක වගන්තියක් ලියන්නෙමි,

“සන්ති හි තම්බදීපරට්ඨ පොක්ඛරමරට්ඨ තලංගරට්ඨ පෙගු
දෙසාදීසු කොසුම්පජනපදෙසු භික්ඛූනං අවිනාරභූතෙ පි තස්මිං
තස්මිං ඨානෙ අතිරෙක වස්සසහස්සාපි තත්‍ථසාසන මූලපතිට්ඨ
ඨාපක ථෙරානං කාලෙ සම්මතාපොරාණසීමායො කාචි කෙ

වලං නිමිත්තභූත පාසාණථම්භෙහි සාක්ඛරසඤ්ඤාණලෙඛෙහි පි පඤ්ඤායන්තා තෙසු ච ජනපදෙසු භික්ඛූ තාදිසීසු සීමාසු එකිස්සං උපසම්පජ්ජිත්වා පි අනෙකාසු සීමාසු අනෙකක්ඛත්තුං කත දළ්හීකම්මෙ ථෙරානුථෙරෙ අඤ්ඤිස්සං අඤ්ඤිස්සං පොරාණසීමායං සන්නිපාතෙත්වා අත්තනො උපසම්පදා කම්මවාචාකරණෙන දළ්හීකම්මං කාරාපෙන්ති කිඤ්චාපි ඉදං දළ්හීකම්මං පාළියට්ඨකථාසු උජුකං න ආගතං තථාපි අනුපවිජ්ජියමානං නිද්දොසතායෙව පඤ්ඤායති, පාළියං අධම්මෙන කතකම්මස්ස පුන උක්කොටනෙ තබ්බතා වචනස්ස චෙව පරිවාරට්ඨකථායං යං අක්ඛරපරිහීනං වා පදපරිහීනං වා තං පුනප්පුනං වත්තුං වට්ටති ඉදං අකුප්පකම්මස්ස දළ්හීකම්මං හොති කුප්පෙ කම්මෙ කම්මං හුත්වා තිට්ඨතීති වචනස්ස ච අනුලොමං යෙව දිස්සති, තාදිසා ච අනෙකක්ඛත්තුං කතදළ්හීකම්මා භික්ඛූ අඤ්ඤං ජනපදං ගන්ත්වාපි හොන්ති යත්ථ පොරාණසීමායො තාදිසානි එවංසන්තෙපි නිරාසංකං උපසම්පදාකම්මං ඉච්ඡන්තෙහි කුලපුත්තෙහි තාදිසෙසාව භික්ඛූ උදකුක්ඛෙපසීමායං යෙව සන්නිපාතෙත්වා තෙසං සන්තිකෙ උපසම්පජ්ජිතබ්බං, උදකුක්ඛෙපසීමාය සකිං කතම්පිකම්මං සීමාතො නිරාසංකම්පිහොති කෙවලං කම්මවාචා පරිස පාරිසුද්ධියායෙව අත්ථාය අඤ්ඤෙහි අඤ්ඤෙහිපි දළ්හීකම්මූපසම්පදා පරියෙසිතබ්බාති අයං අම්හාකං අචරියුපජ්ඣායානං වාදො යථාසුතං ආයස්මතො ආරොචෙම තොමූඩාවකාලෙම අමෙනසු එවරූපොපි වංසො චිරම්පි අතෙථාව,”

මෙහි අභිප්‍රාය මෙසේයි, බුරුමරට, සුගාමරට, තලංගරට, පෙගුදෙශ යනාමේ ආදිවූ කිසියම් ජනපදයන්හි භික්ෂූන්ගේ විසීමක් නැත්තාවූද ඒ ඒ ස්ථානයෙහි අවිරුද්ධ දනසට වැඩිවූද ඒ දෙශවල ශාසනයාගේ මුල පිහිටුවූ තෙරවරුන්ගේ කාලයෙහි සම්මතාකරණ ලද්දාවූ කිසිතැනෙක්හි තම්හිගල්වලින්ද අකුරුසහිත ලකුණු ලියුම්වලින් පමණක් හැඟෙණලද්දාවූ පුරාණකාලයෙහිවූ සීමාවෝ ඇතිවෙත්; ඒ ජනපදයන්හි භික්ෂූහු එබඳුසීමාවන් අතුරෙන් එක්සීමාවෙක්හි උපසම්පදාවිද නොයෙක් සීමාවල දී තීපවරක්කරණලද දළ්හිකම් ඇති ථෙරානුථෙර ස්ථවිරයන් අනික් අනික් පුරාණ කාලයෙහිවූ සීමාවෙක්හි රැස්කරවා තමහට උපසම්පදාකම් වාක්‍යය කියවීම්වශයෙන් දළ්හිකම් කරවත්, කිසිසේත් මේ දළ්හිකම්ය තෙම පෙළඅටුවාවන්හි සෘජුව නොආ යේය එසේවී නමුත් පෙළඅටුවාවල්ට එකඟව පිළිපදිනු ලබන්නේ නිර්දෝෂවශයෙන්ම හැඟේ, පෙළෙහි

අධර්මයෙන් කරණලද කර්මයනැවත වැලැක්විය යුතුබව කීමටද,

“ යං අක්ඛරපරිහීනංවා පදපරිහීනංවා තං දූන පුනං වත්තුං වට්ටති ඉදං අකුප්පකම්මස්ස දළ්හිකම්මං හොති කුප්පකම්මෙ කම්මංහුත්වා තිට්ඨති, ”

යන පරිවාර අටුවාවෙහි කීමටද සමානවූයේම දක්නාලැබේ; නොයෙක්වර කරණලද දළ්හිකර්මඇත්තාවූ එබඳු භික්ෂූහු අනික් ජනපදයකට ගියාහුද යම් තැනෙක්හි පුරාණකාලයෙහිවූ සීමාවෝ නොදක්නා ලැබෙද්ද එසේ ඇතිකල්හිද සැකනැත්තාවූ උපසම්පදාකර්මය කැමතිවූ කුලපුත්‍රයන් විසින් එබඳුවූ භික්ෂූහුව උදකුක්ඛෙප සීමාවෙක්හිම රැස්කරවා ඔවුන්ගේ සමීපයෙහි උපසම්පදා වියයුතුයි, උදකුක්ඛෙප සීමාවෙක්හි එක්වරක් කරණලද කර්මයද සීමාවකෙරෙන් සැකනැත්තේදවෙයි, කර්මවාක්‍යයහා පිරිසද, යනමොවුන්ගේ පිරිසිදුබව සඳහා පමණක් අන්තැනෙක්හි වෙනකාලයෙහිද දළ්හිකර්ම උපසම්පදාතොමෝසෙ වියයුත්තීය, මෙතෙම අපගේ ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන්ගේ කීමයි, ඇතිසැටිහාමය ආයුෂ්මත්හට කියම්හ, නිකමට නොකියම්හ, අපඅතුරෙහි මෙබඳුවූ පරම්පරාව බොහෝ කාලයක් මුළුල්ලේ ඇත්තේමයයි. මෙසේ ධර්මවිනය දැනීම් ආදියෙන් ප්‍රසිද්ධ පණ්ඩිතභාවයට පැමිණසිටි සියම්දෙශාධිපති මහරජතුමා සහිත එහි ස්ථවිරයන් විසින් එවනලද සන්දෙශයෙහි රජතුමාම ලියාඅත්සන්කර තිබේ. මේ ප්‍රශස්තපණ්ඩිතයෝ දළ්හිකර්මය නිර්දෝෂවශයෙන්ම ප්‍රේරණවායයි කියති. නුඹුත්, ලපට් විශාවජ්‍රහාද මේ දළ්හිකර්මය අවාසනාවන්ත පාපදුශ්ශීලයන්ට නොඳකර්මයක්යයි කියයි. මේ නිසා දැනාව කියයුතුව පෙණෙන්නේ උගතුන්ගේ කීම් නවත් උගතුන්ගේ කීම්වලටව සමානව ගැලපියනවාය, නුගත් විශාවජ්‍රහාදගේ කීම උගතුන්ගේ කල්පනාවලට ගැලපිය නොහෙයි කියයි. බුරුමරට, පුගාමරට, තලංගරට, පෙගුදෙශාදි රටවල උත්තමාන්සේලා පුරාණකාලයෙහිවූ එක්සීමාවක උපසම්පදාව ලබාගෙණ නැවත කීපවරක් ලබනලද දළ්හිකර්ම ඇති ස්ථවිරයන් වෙන වෙන සීමාවලට රැස්කරවා දළ්හිකර්ම උපසම්පදාව ලබත්යයිද කියනලදි. අමරපුර සමාගමේ උත්තමාන්සේලා පමනක් නොව පෙගුදෙශාදී නමින් බොහෝ දෙශවල තෙරුන්නාන්සේලා මේ දළ්හිකර්මයයි කියන මොඩකර්මය කෙරෙත්යයි බාරගන්නට ඕනෑ. උදකුක්ඛෙප සීමාවෙහි උපසම්පදාව ලද්දන්විසින්ද, කර්මවාක්‍යය හා පිරිසගේද පිරිසිදුභාවය ප්‍රයෝජනකොට වෙනනැන්වලදී මැනකාලයෙහි උපසම්පදාව සෙවීම සුදුසුයයි සියම්දෙශයෙහි තෙරුන්නාන්සේලාගේ ආචාර්‍ය්‍යඋපාධ්‍යායවරු කියනවාලු; සියම්දෙශයෙහි උගත්තෝ එසේ කීයත්

# දැන්වන වගනම්

අමරපුරසමාගමේ මහතෙරුන්වහන්සේලාගේ සම්මතයනියාවට තනාලද මේ මූලවංශවිනිශ්චයනම්වූ පොත එම මහතෙරුන්වහන්සේලාගෙන් ලබාගන්නාවූ මැන්දිස්වික්‍රමසිංහ යනනාමලත් මාවිසින් අච්චුගස්වනලද්දේය.

තවද මේපොත, 1873, වෙනිඅවුරුද්දේ අච්චුගැස්වීමට පටන්ගත්තු මුත් ඒලඟදීම වැඩේ කෙළවර කරගන්ට නොලැබී මෙතෙක්කල් පමාවූ බව කනගාටුවෙන් සැලකරමි.

මේපොත මුද්‍රාංකණ කරවීමපිණිස නොයෙක් පලාත්වලින් ලත් මුදල් ගණන්හා වියදම්ද ගනගණනක්ද මෙහි දක්වන්නෙමි.

| | රුපියල් | ශත. |
|---|---|---|
| දොඩන්දූවෙන්ලැබුනා ...... .......... | 105 | „ |
| වැලිතරින් ...... ...... .......... | 75 | „ |
| කළුතරින් ...... ...... .......... | 47 | „ |
| සබරගමුවෙන් ... ...... .......... | 30 | „ |
| පානදුරෙන් ...... ...... .......... | 24 | „ |
| බිස්කාඩූවෙන් ... ...... .......... | 16 | 75 |
| මොරටුවෙන් ...... ...... .......... | 5 | „ |
| හොරේතුඩුවෙන් ... ...... .......... | 2 | 50 |
| රත්මලානෙන් ...... ...... .......... | 1 | „ |
| කාබූවෙලෙන් ...... ...... .......... | 1 | „ |
| මුළුමුදල .......... | 307 | 25 |

කඩදාසිවලට පටන් අච්චුකන්තෝරුව ගණනට දුන්නා

| | රුපියල් | ශත. |
|---|---|---|
| | 280, | 50 |
| පොත් මැස්සවීමට ... ... | 20 | „ |

ඉතිරි මුදලත් සෙසුවැඩවලට වියදම්වී තිබේ.